සභානායකතුමනි, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම පිළිබඳව පළමුවෙන්ම අපේ ප්‍රශංසාව පළ කරන්න ඕනෑ, ධර්මසේන ආටිගල ස්වදේශීය වෛද්‍ය ඇමතිතුමාට. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය විශ්ව විද්‍යාල තත්ත්වයට ගෙන ඒමේ යෝජනාව පසුගිය ආණ්ඩුවේ හිටපු සෞඛ්‍ය ඇමතිවරයෙක් වන දිවංගත ජෝජ් රාජපක්ෂ මැතිතුමාත්, ඉන් පසුව පත් වුණු සෞඛ්‍ය ඇමතිවරිය වන ශිවා ඔබේසේකර මැතිණිය විසින් ඉදිරිපත් කරන ලද්දක්. ඒ දෙපොළ ඉදිරිපත් කළ ඒ යෝජනාව ක්‍රියාවට පරිවර්තනය කිරීම සඳහා කටයුතු කිරීම ගැන මා නැවතත් ස්වදේශීය වෛද්‍ය ඇමතිතුමාට ස්තුති වන්ත වෙනවා.

මේ වෛද්‍ය විද්‍යාලයේ ශිෂ්‍යයන්ට ඉඳුම්-හිටුම් ගැනීම සඳහා හරියාකාර ස්ථානයක් නැහැ. පණ්ඩිත වික්‍රමාරච්චි මැතිතුමා අදහස් කළ ආකාරයට ක්‍රමානුකූල සැලැස්මක් අනුව මේ විද්‍යාලයේ දියුණුව ඇති කිරීමයි, රජයේ යුතුකම විය යුත්තේ. සෑහෙන ඉඩම් ප්‍රමාණයකුත් ලබා ගන්න සිදු වී තිබෙනවා. මේ විද්‍යාලය විශ්ව විද්‍යාල තත්ත්වයට උසස් කිරීම සඳහා මේ සියලු කටයුතු සඳහා ඇමතිතුමාට සිද්ධ වෙනවා, සෑහෙන මුදල් ප්‍රමාණයක් රජයෙන් ලබා ගන්න.

ලෝකය පුරාම දැන් විශාල උනන්දුවක් තිබෙනවා, පාරම්පරික වෛද්‍ය ක්‍රම සම්බන්ධයෙන්. ගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයේත් පැවැත්වුණා, පාරම්පරික වෛද්‍ය සම්මේලනයක්. ඒ සම්මේලනයට ඇමතිතුමාත් ආවා. මේ අවුරුද්දේත් ඔක්තෝබර් 19 වැනි දා මේ රටේදී පැවැත් වෙනවා, පාරම්පරික වෛද්‍ය සම්මේලනය. ඒ සම්මේලනයට රටවල් 120 ක නියෝජිතයන් සහභාගි වෙනවා. මේ රජයේ, මේ ඇමතිතුමාගේ මාර්ගදේශකත්වය, අනුව තමයි, එය පැවැත්වෙන්නේ. එය අගය කළ යුත්තක්. මේ ඇමතිතුමාගේ ඒ මාර්ගදේශකත්වය, මූලිකත්වය, නායකත්වය යටතේ පැවැත්වෙන ඒ පාරම්පරික වෛද්‍ය සම්මේලනයට සහභාගි වන හැටියට මේ රටේ සියලුම පාරම්පරික වෛද්‍යවරුන්ට ආරාධනා කර තිබෙනවා, කවු චිකිත්සා සම්මේලනයේ සභාපති ඇන්ටන් ජයසූරිය මහතා.

අද මේ ඇමතිතුමාටත් රජයටත් තීරණය කරන්න සිදු වී තිබෙන්නේ, ඒ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය විශ්ව විද්‍යාල තත්ත්වයට පත් කරන්නේ කොයි ආකාරයටද කියන එකයි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳ ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයක් බලාපොරොත්තු වෙන්, විශේෂයෙන් බටහිර ලෝකය ශ්‍රී ලංකාව දිහා බලා ගෙන ඉන්නවා. ඒ බව තහවුරු කිරීම සඳහා මම එක්තරා කාරණයක් පෙන්වා දෙන්න කැමැතියි.

1980 දී ඇම්ස්ටර්ඩෑම් සම්මේලනය තිබුණා. ඒ සම්මේලනයේදී එංගලන්තයේ දොස්තර සිඩ්නි රෝස් නීල් මහතාත්-එතුමා තමයි. එංගලන්තයේ කවු චිකිත්සා සම්මේලනයේ සභාපතිතුමා—ඉන්දියාවේ දොස්තර අග්‍රවාල් මහතාත්, අප්‍රිකාවේ දොස්තර මහමූඩ් මහතාත් යන අයගේ මූලිකත්වයෙන් යෝජනා කොට ඒකච්ඡන්දයෙන් සම්මත කරගෙන තිබෙනවා, ඒ ජාත්‍යන්තර විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකාවේ පිහිටුවන්න. එම නිසා, මේ අවුරුද්දේ ඔක්තෝබර් 19 වැනි දා පැවැත්වෙන පාරම්පරික වෛද්‍ය සම්මේලනයේදී තීරණයක් ගන්න සිද්ධ වන්නේ, ඒ යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මේ ඇමතිතුමාත්, රජයත් කොයි විධියේ මාර්ගදේශකත්වයක් දෙනවාද කියන එක ගැනයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද ලෝකයේ හැම රටකම වාගේ බටහිර වෛදකම යටතේ කෙරෙන ඇන්ටිබයොටික්—Antibiotic—ක්‍රමය—පිළිබඳ උනන්දුව ක්‍රමානුකූලව අඩු වේගෙන යනවා. එවැනි අවධියක තමයි, මේ සම්මේලනය පැවැත් වෙන්නේ. එම නිසා එතැනදී මේ ඇමතිතුමාට සිද්ධ වෙනවා, මා කලින් කීවා වාගේ මේ රටේ පාරම්පරික වෛද්‍ය පරම්පරාව වෙනුවෙන්, මාර්ගදේශකත්වය දෙන්න. එය කොයි ආකාරයට දෙනවාද කියන එකයි, ප්‍රශ්නය.

මේ සම්බන්ධයෙන් අපෙ සම්පූර්ණ සහයෝගය රජයට ලැබෙන බව මතක් කරන්න කැමතියි. ඒ බව ස්වදේශීය වෛද්‍ය ඇමතිතුමා දන්නවා. හිටපු සෞඛ්‍ය ඇමතිතුමාත්—වර්තමාන කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ ඇමතිතුමාත්—දන්නවා, අප කොයි ආකාරයට එතුමන්ලාට සහයෝගය දුන්නාද කියා. අපේ පාරම්පරික වෛද්‍යවරුන් වෙනුවෙන්, පාරම්පරික වෛද්‍ය ක්‍රම වෙනුවෙන් අප කවුරුත් ක්‍රියා කළ යුත්තේ පක්ෂ භේදයෙන් තොරවයි. මේ ගැන අපේ අතිගරු ජනාධිපති උතුමාණන් ගෙන් පුළුවන් සහාය ලබාගෙන මෙම ආයතනය හරියාකාර විශ්වවිද්‍යාල මට්ටමකට ගෙනෙන්නට වැඩ කටයුතු සකස් කරන ලෙස තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 4.29

**ටියුඩර් ගුණසේකර මහතා (ගම්පහ දිසා ඇමතිතුමා)**
*(திரு. ரியூடர் குணசேக்கர—கம்பஹ மாவட்ட அமைச்சர்)*
(Mr. Tudor Gunasekera—District Minister, Gampaha)

ගරු කථානායකතුමනි, මා ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා ගම්පහ ආයුර්වේද විද්‍යාලය සම්බන්ධයෙන් මෙම වැදගත් යෝජනාව ඉදිරිපත් කළ දේශීය වෛද්‍ය අංශය භාර ධර්මසේන ආටිගල ඇමතිතුමාට. මේක අර "බබාලගෙ අම්ම ඒ කාලෙ දැක්ක මහවැලි හීනයක් වගෙයි" යන විධියටයි ගම්පහ ගරු මන්ත්‍රීතුමා දූන් කථා කළේ. සිවා ඔබේසේකර මැතිණිය—එවකට හිටපු සෞඛ්‍ය ඇමතිතුමිය— අදහස් කළ දෙයක්ලු අපි මේ ඉෂ්ට කරන්නෙ. ඇත්ත වශයෙන්ම කියනවා නම් මේ රටේ ගම්පහ මන්ත්‍රීතුමා ගැන ඇති ප්‍රසිද්ධියට වඩා ලොකු ප්‍රසිද්ධියක් ගම්පහ වික්‍රමාරච්චි සිද්ධායුර්වේද මධ්‍යස්ථානය ගැන තිබෙනවා. ගම්පහ නගරයේ පමණක් නොවෙයි, ගම්පහ ආසනයේ පමණක් නොවෙයි මුළු ලංකාවේම ප්‍රසිද්ධයි ගම්පහ සිද්ධායුර්වේදායතනය.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended till 5 p.m.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, ප. ව. 5 ට නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

*அதன்படி, அமர்வு பி. ப. 5 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 5 p.m. and then resumed,* MR. DEPUTY SPEAKER (MR. NORMAN WAIDYARATNA) *in the Chair.*

**ටියුඩර් ගුණසේකර මහතා**
*(திரு. ரியூடர் குணசேக்கர)*
(Mr. Tudor Gunasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කලින් සඳහන් කළ පරිදි "ගම්පහ සිද්ධායුර්වේදායතනය" කියන නාමය මුළු ලංකාම පුරාම ප්‍රකට වී තිබෙනවා. මේ රටේ ඕනෑම නගරයකට ගියොත් ඕනෑම ස්ථානයකට ගියොත් ගම්පහ සිද්ධායුර්වේදායතනයට අනුබද්ධ බෙහෙත් ශාලාවක් පෙනෙන්නට තිබෙනවා. අභාවප්‍රාප්ත වික්‍රමාරච්චි මැතිතුමා ඉතාම දක්ෂ ලෙස ගෝලයින් විශාල පිරිසක් පුරුදු පුහුණු කර සිද්ධායුර්වේද ක්‍රමය මේ රටේ ප්‍රසිද්ධ කර එමගින් දුප්පත් ජනතාවට විශාල සේවයක් ඉෂ්ට කර තිබෙනවා.

ඇත්තවශයෙන්ම ගම්පහ මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) කිව්වා වාගේ මේක දැන් නොවෙයි මීට අවුරුදු ගණනාවකට ප්‍රථමයෙන් කරන්නට තිබුණේ. මේක ඒ අය කරන්නට අදහස් කළාය කියනවා. මේ රජයෙන් ඕනෑම හොඳ වැඩක් ආරම්භ කළොත් හොඳ වැඩක් ගැන කථා කළොත් අදහස් කළොත් ඒ අයත් ලොකුවට ඔළුව දමනවා ලොකු දෙයක් කළාය කියල වාර්තා කරවා ගන්න.

**එස්. ඩී. බණ්ඩාරනායක මහතා**
*(திரு. எஸ். டி. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

ඒක ඇමතිතුමා කිව්වෙ.

**ටියුඩර් ගුණසේකර මහතා**
*(திரு. ரியூடர் குணசேக்கர)*
(Mr. Tudor Gunasekera)

ගම්පහ මන්ත්‍රීතුමා කිව්ව මේක හරියට සිවා ඔබේසේකර මැතිණියගේ හීනයක් වගේය කියල. [බාධා කිරීමක්] මේක ඒ කාලයේදී අදහස් කර තිබුණාය කියා එතුමා කිව්වා. අදහස් කර තිබුණා නම් 1970 සිට 1977 දක්වා ඒ තරම් බලසම්පන්න රජයක් තිබුණු කාලයේ දී ඒ අදහස අනුව පනතක් සම්මත කර ඒක ක්‍රියාත්මක කරන්නට තමුන්නාන්සේලාට තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගම්පහ ප්‍රදේශයට පමණක් නොවෙයි මුළු ලංකාවටම ප්‍රයෝජනයක් වන ආකාරයට අභාවප්‍රාප්ත වික්‍රමාරච්චි මැතිතුමා මෙම ආයතනය ආරම්භ කර තිබුණා. ඇත්තවශයෙන්ම ලංකාවේ සිද්ධායුර්වේද ක්‍රමය මීට වඩා උසස් අන්දමින් දියුණු කරන්නට රජයක් හැටියට අපි සෑම ආධාරයක්ම දෙන්නට ඕනෑ.

මා නැවත වරක් ස්තුතිවන්ත වෙන්න ඕනෑ අපේ ගරු ධර්මසේන ආටිගල ඇමතිතුමාට එතුමා මඩපාත ආයුර්වේද පරම්පරාවේ පවුලකට අයිති මහත්මයෙක්—මේ ලංකාවේ සිද්ධායුර්වේද ක්‍රමය දියුණු කිරීමට එතුමා පියවර ගැනීම ගැන. විශේෂයෙන්ම ගම්පහ දිසා ඇමති හැටියට මට එතුමා යෝජනා කළා, ගොඩනැගිලි සඳහාත් ඉඩමක් අත්පත් කර ගැනීම සඳහාත් ලබන අවුරුද්දේ විමධ්‍යගත අයවැයෙනුත් යම් මුදලක් දෙන්නය කියා. එමෙන්ම මම ඉතාම සන්තෝෂයෙන් එතුමාගේ යෝජනාව භාරගත්තා, ලබන අවුරුද්දේ අපි එය ආරම්භ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වියුඩර් ගුණසේකර මහතා]

කරන්නට ඕනෑ කියා. ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) කෙසේ කීවත් මමත් මේ සිද්ධායුර්වේද මධ්‍යස්ථානයට පසුගිය අවුරුද්දෙත් ගියා; මේ ළඟදිත් ගියා. ඒ ස්ථානයේ වැඩ පිළිවෙළ ගැන බලන විට අපි ඉතාමත්ම සන්තෝෂ වෙන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙරදිග වෛද්‍ය ක්‍රමයට පමණක් අපි එය සීමා කර නැහැ. එමෙන්ම සිද්ධායුර්වේදයෙන් පමණක් වුණත් දුප්පත් මහජනතාවට විශාල සේවයක් සිදු වී තිබෙන බව ඒ ස්ථානයට ගිය විට අපට පැහැදිලිවම පෙනී ගියා. ඇත්තවශයෙන්ම අපි ලජ්ජා වන්නට ඕන, මේ සිද්ධායුර්වේදය නඟාසිටුවීමට නැත්නම් වැඩිදියුණු කිරීමට මෙපමණ කලක් අපි ආධාර නොදීම ගැන. ගම්පහ ගරු මන්ත්‍රීතුමාටත් ලජ්ජා හිතෙයි එතුමා ගම්පහ මන්ත්‍රීවරයා හැටියට මෙපමණ කාලයක් වැඩ කරලත් එතුමාගේ ආසනයේ තිබෙන මුළු ලංකාවටම ප්‍රයෝජනයක් සැලසෙන මේ සිද්ධායුර්වේද විද්‍යාලයට නැත්නම් සිද්ධායුර්වේද ආයතනයට කිසිම ආධාරයක් උපකාරයක් එතුමාගෙන් සිදු නොවී තිබීම ගැන. මා මේ අවස්ථාවේ ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා ලබන අවුරුද්දේ මේ සඳහා රජයෙන් සෑහෙන මුදලක් වෙන් කර මේ සිද්ධායුර්වේදය වැඩි දියුණු කිරීම සඳහා සම්පූර්ණ සහයෝගය දක්වන්නය කියා. එමෙන්ම ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ මේ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක් හැටියට නැවත වරක් සිහිපත් කරමින් මා නිහඬ වෙනවා.

**ඩ්. ජ්. මූ. ලොකුබණ්ඩාර මහතා** (හපුතලේ)
*(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார—ஹப்புத்தளை)*
**(Mr. W. J. M. Lokubandara—Haputale)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉතාමත්ම සංතෝෂ වෙනවා ගම්පහ වික්‍රමාරච්චි අයුර්වේද විද්‍යාලය සංස්ථාගත කිරීමේ මේ අවස්ථාවේදී වචන කීපයක් පවසන්නට අවසථාව ලැබීම ගැන. මට කලින් කථා කළ අපේ ගම්පහ දිසා ඇමතිතුමා කිව්වා වගේම ගම්පහ කියන වචනය අපට ඉතාම හුරු පුරුදු වචනයක්. මේ රටේ ගම්පහක් තිබෙන්නේ කොළඹට නුදුරු දිස්ත්‍රික්කයක් වශයෙන් පමණක් නොවෙයි. අපේ ආසනවලත් තිබෙනවා ගම්පහ කියන එක. ඌව මහවෙලගම ගම්පහක් තිබෙනවා; ඌව පරණගම ගම්පහක් තිබෙනවා. ගම්පහක් එකතු වූ විට—උඩදුම්බර වුවත් ඇති; හැම පැත්තකම ඇති— මෙයින් අදහස් වන්නේ බොහොම පාරම්පරික පෞරාණික ග්‍රාමයක් වශයෙන් ගම්පහ පිළිගෙන තිබුණු තත්ත්වයක් ඇති බවයි.

එක අතකින් බලන විට මේ ගම්පහ කියන විටම අපට උඩරට පහත රට වශයෙන් වේවා නාගරික ගම්බද වශයෙන් වේවා එවැනි කිසිම වෙනසක් නැතිව අපේ සිංහලකම ගැන අදහසක් ධ්වනිත වෙනවා. ගම්පහ වික්‍රමාරච්චි සම්ප්‍රදායයට පිං සිදු වෙන්නට මේ රටේ ඇත්ත වශයෙන්ම සිංහලකම සැලකිල්ලට නොගත් යුගයක දී, සිංහලයා සිංහලකම ගැන සැලකිල්ලක් නොපෙන්වූ සමයක දී, සිංහලයා තමා සිංහලයෙක් බව ප්‍රසිද්ධියේ කියන්නට සමහරවිට අකමැති වූ යුගයක දී, —ගම්පහ වික්‍රමාරච්චිතුමා ඒ යුගයේ හැටියට ඉතාම මුල් බැසගත් පරම්පරාවකට අයත් කෙනෙක්—සිංහලකම මතු කර ගන්නට විශේෂයෙන්ම පෙරදිග අපේ සිංහල උරුමය ආරක්ෂා කර ගන්නට ගත් තැතේ එක ප්‍රතිඵලයක් තමයි ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍ය ක්‍රමය. එදා අපේ රටේ නිදහස් සටනේ හික්කඩුවේ ශ්‍රී සුමංගල රත්මලානේ ශ්‍රී ධර්මාරාම වැනි පිරිවෙන් අධිපතිනාහිමිවරුන්ගේ නම් මෙන්ම, නිදහස් සටන ගැන එමෙන්ම අමද්‍යප සටන ගැන මෙනෙහි කරන විට අපේ හිත්වලට නැගෙන එෆ්. ආර්. සේනානායක දොන් පේද්‍රිස් වැනි නම් මෙන්ම, වෛද්‍ය වෘත්තිකයින් සම්බන්ධයෙන් බලන විට දේශීය වෛද්‍ය ක්‍රමය ගැන සඳහන් කරන විට අපට අමතක කරන්නට බැරි නාමයක් තමයි, ගම්පහ වික්‍රමාරච්චි නාමය.

අපට දැනටමත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයයක් නැතුවා නොවෙයි. අපට දැනටමත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයයක් තිබෙනවා ආයුර්වේද වෛද්‍යවරුන් බිහි කරන විද්‍යා ආයතනයක් තිබෙනව. ඒ වුණත් විශේෂයෙන් දේශීය වෛද්‍ය ක්‍රමයේ උන්නතිය තකා ඉමහත් සේවාවක් සැලසීමේ අරමුණින්ම, ඒ අවියෙන්ම මඩපාත පරම්පරාවේ දේශීය වෛද්‍ය ක්‍රමය ආරක්ෂා කරගෙන එන ඒ ආටිගල වෛද්‍යචාර්යතුමාට දේශීය වෛද්‍ය අමාත්‍යාංශයක් විශේෂයෙන්ම වෙන්කොට දීමෙන් අපේ ගරු ජනාධිපති උතුමාණන් හා රජය බලාපොරොත්තු වෙන්නේ මේ රටේ පාරම්පරික වෙදකම දියුණු කිරීමටයි. මෙහි ඉතා වැදගත්කමක් තිබෙනව. ඕනෑම නැනෙක දේශිය දේ දේශීය ජනතාවට වැදගත්. පිටින් ලබා ගත් පියාපත්වලින් පියාඹන්නට ඉගෙන ගන්නවා වාගේ නොවෙයි, සවශක්තියෙන් නැඟී සිටීම. අපි අපේ දේශයෙහි ඇති දෑ මුල් කර ගෙන, භූමි පුත්‍රයන් වශයෙන් අපේ රටේ ඉදිරි අනාගතය ගැන කල්පනා කරන කොට මා පෙරදාකත් මේ සභාවෙහි කීවා සේ යම්කිසි විධියකින් ජානුස් නැමති දෙවියාට ඉදිරිපස පමණක් නොවෙයි, පසුපස පෙනෙන්නටත් මුහුණක් තිබුණා සේ අපට අපේ අනාගතය පෙනෙන්නට ඕනෑ, අතීතය පිළිබඳ හැඟීමකුත් ඇතුව. අතීතය අමතක කොට අපට අනාගතය කරා යන්නට බැහැ.

අතීතයේ සිට අපට පෙනෙනවා, බුද්ධදාස රජ්ජුරුවන්ගේ යුගයේදී අපේ රජවරු, අපේ පාලකයෝ මොන මොන තරම් විධියට ආයුර්වේද වෛද්‍ය සම්ප්‍රදායය ප්‍රගුණකොට ඒ මගින් මේ රටේ දියුණුවට කටයුතු කළාද යන්න. ඒ වාගේමයි එදා සිට අද දක්වා 'රජකම හෝ වෙදකම' යන හැඟීම ඇතුව වෛද්‍ය ක්‍රමයට මූලික තැනක් දුන්නා. මේ අනුව වෛද්‍ය රාජයකු වශයෙන් සලකන්නට පුළුවන්, චක්‍රවර්ති කෙනෙකු වශයෙන් සලකන්නට පුළුවන්, උත්තර මන්ත්‍රීවරයකු වශයෙන් සිටින කාලයෙහි පවා සිංහලකම අමතක නොකළ, ගමේ කම අමතක නොකළ වෛද්‍ය චක්‍රවර්ති, වික්‍රමාරච්චි මහතාගේ නම අනුස්මරණය කෙරෙන, ඒ නාමය අනුස්මාරකයක් වන විද්‍යාස්ථානයක් මේ විධියට සංස්ථාගත කිරීමේ අවස්ථාව ඉතාම වැදගත් අවස්ථාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අරමුණ වන්නේත්, මේ ජාතියේ පැතුම වන්නේත්, යම්කිසි දවසක ගම්පහ වික්‍රමාරච්චි ශූරීන් තනිව ගෙන ගිය ඒ කර්තව්‍යය රජයේ අනුග්‍රහයෙන් විශ්ව විද්‍යාල මට්ටම කරා දියුණු කිරීමයි. මා දන්නවා. අපේ දේශීය වෛද්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇමතිතුමා අද මේ ගන්නේ එහි මුල් පියවරක් පමණක් බව. මේය ඉදිරියෙන් ඉදිරියට ගෙන ගොස් මා දන්නවා යථා කාලයේදී එතුමා පූර්ණ බලතල ඇති විශ්ව විද්‍යාලයක තත්ත්වයට මේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය පත් කරන බව. මේ ඒ සඳහා ගත් පුරෝගාමී පියවරක් කියලයි මම හිතන්නෙ. ඒ වාගේම අපට පිටරටින් ගෙනෙන දේට වඩා දේශීය දේ වැදගත් කවදා කවුරු කොහොම කිව්වත් මට හිතෙනව යම්කිසි විධියකින් ඊයේ ගරු මුදල් ඇමතිතුමා මේ සභාවේදී ප්‍රකාශ කළා වාගේ අපට අපේ සම්පත් කෙරෙහි විශ්වාසය තබන්න වෙනවා. අපි යම්කිසි විධියකින් කියනවා නම් ග්‍රහලෝක තරණය කරන අජටාකාශ යුගයේදී අප මොනවාටද මේ තමන්ගේ දේවල්වලම එල්බ ගන්නේ කියා, ඒක වැරදෙන තත්ත්වයක් තව පැත්තකින් තිබෙන බව කියන්න ඕනෑ. එක අතකින්.

ලෝකය පුදුමාකාර විධියකට දියුණු වෙමින් යනවා. ඉරහඳ පවා, ග්‍රහ ලෝක පවා අපට එතරම් දුර නොවන තත්ත්වයකට. එය බාහිරයි. එහෙත් ආධ්‍යාත්මික පක්ෂයෙන්, තමන්ගේ අසල්වැසියා තමන්ගේ පවුලේ උදවිය තමන්ගේ නෑදෑයන් පමණක් නොවෙයි තමන්ගේම දෙමව්පියන් පවා තමන්ට දුරස්ථ විධියට, තමන්ගේ නොවන විධියට, හැඟීම් නැති තත්ත්වයට, පුදුමාකාර විධියේ ඈත්වීමකුත් සිදුවන බව පෙනෙනවා, අභ්‍යන්තර වශයෙන් බැලුවාම. මෙබඳු සමාජයක පුදුමාකාර කැලඹිලි සහිත මේ ලෝකයේ ස්ථිරසාර පුද්ගලයන් වශයෙන් ඉදිරියට යාමට අපට ගුරුහරුකම් ගත හැකි දුරදර්ශී ඥානයක් ඇති සම්ප්‍රදායයක් තිබෙන්නෙ මේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය සම්බන්ධයෙන් පුරෝගාමී වූ ඒ වික්‍රමාරච්චිතුමා වැනි අය වෙතයි. එතුමා හුදෙක් වෛද්‍යවරයෙක් පමණක් නොවෙයි, 'ගම්පහ වික්‍රමාරච්චි' කී විට, හුදෙක් 'වික්‍රමාරච්චි' කියන එකේ නැති අර්ථයක් තිබෙනවා. 'ගම්පහ වික්‍රමාරච්චි' කියන තැන හුදෙක් 'ගම්පහ' යන්නේ නැති අර්ථයක් තිබෙනවා. 'ගම්පහ වික්‍රමාරච්චි' කියන ඒ පද දෙක එකතු වුණු හැටියේ අපට සම්ප්‍රදායයක් පෙනී යනවා. ඒ සම්ප්‍රදායේ හුදෙක් ඇත්තේ කායික රෝගවලට බෙහෙත් දෙන වෛද්‍යවරයෙක් පමණක් නොවෙයි; මේ රටේ ආර්ථික දේහයට, මේ රටේ ආධ්‍යාත්මික දියුණුවට, මේ රටේ ගුණ වගාවට හේතු භූත වන තත්ත්වයක්.

ඒ මොකද ඒ වහල් යුගයේදී ඒ යටත් විජිත සමයේදී, පිටරට සුදු අධිරාජ්‍යවාදීන්ට ලොකු ලොක්කන්ට කත් ඇදපු යුගයේදී එතුමා නිර්භයවම සිංහලකම මතු කරගෙන ගමේකම මතු කරගෙන කලිසම් නොව රෙද්ද අඳින පුද්ගලයන්ගේ සටනේ පුරෝගාමියෙක් වශයෙන් ක්‍රියා කළා. එදා සිංහල ස්කෝලේ මහතා, ගමේ නොතාරිස් මහතා, ගමේ වෙද මහතා කොන් කර තිබුණ යුගයේදී. සමහර විට අටඅණුවක් රෝග, නව අනූවක් ව්‍යාධි සියල්ලක්ම පෙනෙන්නේ දොස්තරගේ නලාවටය කියන හැඟීමක් තිබුණ යුගයේදී එතුමා නාඩි අල්ලා තුන් දොස් අල්ලාගන්නා ක්‍රමය ආදිය ගැන හොඳ හැඟීමක් ඇතිව අපේ යට වී ගිය පාරම්පරික ශාස්ත්‍රීය උරුමය මතු කරගෙන තිබුණ කෙනෙක්.

එපමණක් නොවෙයි, වෙනත් අය සමහර විට මිෂනාරීන්ගේ ආක්‍රමණයට යටත් වී සිටි සමයකදී, සිංහලකම නොසැලකූ සමයකදී එතුමා බෞද්ධ ගුණ වගාව මතු කරන්න බොහෝම මහන්සි ගත් කෙනෙක්. ඒ නිසා ගම්පහ වික්‍රමාරච්චි කියන්නේ අපේ රටේ දේශීය උරුමයේ සංකේතයයි. ඒ නිසා අද දින අපේ රජය විසින් මෙබඳු පනතක් ඉදිරිපත් කර රාජ්‍ය අනුග්‍රහය ලබාදීම ඉතා වැදගත් කර්තව්‍යයක් වශයෙන් අපි සලකනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොන තරම් දියුණු සමාජයක් වුණත්, පිටරටින් ආනයනය කරනු ලබන දේවලින් යැපීම කවදාවත් ඔරොත්තු දෙන්නෙ නැහැ. ඒ මොකද ? අපේ ශරීරයට ලෙඩක් දුකක් වැළඳෙන්නේ කොයි කාලයේද කියා අපට කියන්න බැහැ. අපට කියා නොවෙයි එබඳු දෑ සිද්ධ වෙන්නෙ. අපට කියන්න බැහැ, යම් යම් කල කෝලාහල නිසා හෝ යුද ආදී හේතු නිසා හෝ කැළඹිලි සහිත තත්ත්වයන් හේතුකොටගෙන පිටරටින් අපට මොන විධියට ඒවා ලැබේවිද කියා. ස්ව ශක්තිය කෙරෙහි අපේ විශ්වාසය තිබෙනවා නම් මේ රටේ දේශීය දේ කෙරෙහි අපේ විශ්වාසය තිබෙනවා නම්,—කල්ක කිව්වම, ගුලි කිව්වම විහිළුවට ලක්වන තත්ත්වයක් නැතිව, ඉන්ජෙක්ෂන් එකට, ටැබ්ලට් එකට යටවෙන්නෙ නැතිව, පුළුවන් තරම් දුරට මේ රටේ දේ ගැන විශ්වාසයක් තබනවා නම්—අට එකට සිඳ දෙන කසාය ක්‍රමය ගැන අපේ විශ්වාසයක් තිබෙනවා නම් වෙනත් රටවලින් කවර ආධාර නොලැබුණත් ස්ව ශක්තියෙන් නැගී සිටීමට පුළුවන් ශක්තියක් අපට තිබෙනවා.

අපේ රටේ ගහ කොළ අපේ රටේ මනුෂ්‍යයාට වැදගත්. අපේ රටේ දේ අපේ ජනතාවට වඩා සමීපයියි. අපේ රටේ දේශගුණයට, අපේ රටේ කාල ගුණයට, ගැළපෙන දේවල් අපේ රටේ වැවෙන ගහ කොළේ තිබෙන්නෙ. එබඳු දේ මුල් කරගෙන තිබෙන ආයුර්වේදයේ වටිනාකම සිරිල් පොන්නම්පෙරුම වැනි විශාරදයන්, විද්‍යාඥයන් පිළිගෙන තිබෙනවා. නමුත් අපේ රටේ පුද්ගලයාට අපේ රටේ දේ වටිනාකමක් නැහැ. පිටරටින් සුද්දෙක් ඇවිත් කිව්ව දේවලුයි වටින්නෙ. බොහෝවිට මහානායක හාමුදුරුවන් පවා තථාගත ශුද්ධ බුද්ධ ධර්මය ගැන කියන විටත් එංගලන්තයේ විද්‍යාඥයෙක් කී මතයක් අරගෙන තමයි, සමහර විට පුනර්ජන්මය ආදිය ගැන කියන්නේ. "එංගලන්තයේ විද්‍යාඥයෙකුත්—සුද්දෙකුත්—කියලා තිබෙනවා. ඒ නිසා බුද්ධ ධර්මය හරි වගේ" කියන තරමට අනුන්ගෙන් ණයට ගත් තත්ත්වයකට පිරිහී තිබෙන යුගයක් මේ.

එවැනි යුගයකදී මේ රටේ දේ හෙළා දකින එක පුදුමයක් නොවෙයි. කවදත් අනුන්ගෙන් යැපෙන්න පුරුදු වුණ අයට සමහර විට ආයුර්වේදය පුදුමාකාර විධියට දෙවැනි තන්හි ලා සලකන තත්ත්වයක් තිබෙන්නෙ. ඒ නිසා කවුරු කොයි විධියෙන් උප්පැන්න දෙන්න ගියත් මෙය නීතිගත කිරීමේ තත්ත්වයට මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කිරීමේ භාග්‍යය ලැබුණේ අපේ දේශීය වෛද්‍ය ඇමතිතුමාටයි. එතුමාගෙන් මා හුදෙක්ම බලාපොරොත්තු වෙනවා—ඒ සඳහා රජයේ අනුග්‍රහයත් ලැබිය යුතුයි—යම් කිසි විධියකින් බටහිර වෛද්‍ය ක්‍රමයට මේ රටේ තැනක් තිබෙනවාද, ඊට නොදෙවැනි තත්ත්වයක් අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වි. ජ. මු. ලොකුබණ්ඩාර මහතා]

සිංහල වෛද්‍ය ක්‍රමයට මේ නිදහස් රටේ තිබිය යුතුය කියා. සැබවින්ම අද ඒ තත්ත්වය ගැන සතුටු විය හැකි තත්ත්වයක් නෑ. එම නිසා මේ අවස්ථාව පදනම් කර ගෙන මේ ආයුර්වේද විද්‍යාලයේ අනුබද්ධ ශාඛා වෙනත් තැන්හිද පවත්වාගෙන යා යුතු බව ගරු ඇමතිතුමාට මම කියන්න කැමතියි. ඒ වගේම මේ පනතේ අරමුණ මීට වඩා පුළුල් කළ යුතුයි. මීට වඩා ජාතික මට්ටමෙන් එම ආයතනය පවත්වාගෙන යාමට පසුතලය සකස් කරගත යුතුයි. එම නිසා මම ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙනුත්, දේශීය වෛද්‍ය ඇමතිතුමාගෙනුත් ඉල්ලන්න බලාපොරොත්තු වෙනවා, සංශෝධනයක් පිළිගන්නය කියා. මීට කලින් මම ඒ ගැන එතුමන්ලා සමග සාකච්ඡා කළා. එතුමන්ලා ඉතාමත් කාරුණිකව එකඟ වුණා. ඒ සුළු සංශෝධනය කරන්නය කියා මම ඉල්ලනවා.

මෙහි 'සංස්ථාවේ පොදු පරමාර්ථ' යන්නට දැනට තිබෙනවා ස්වදේශීය, සිද්ධ සහ ආයුර්වේද යන්න. මෙහි ලා අපි සඳහන් කරන්නට ඕනෑ සිද්ධ කියන වචනයෙන් යම්කිසි වෛද්‍ය සම්ප්‍රදායයක් ගැන කියවුණත් එදා ගම්පහ සිද්ධ ආයුර්වේද යන්නෙන් බලාපොරොත්තු වුණේ ශුද්ධ ආයුර්වේද කියන එකයි. එතැන සිද්ධ යන්නෙන් කියැවුණේ ශුද්ධ ආයුර්වේදයයි. අපේම දේ; කලවම් නැති වෛද්‍ය ක්‍රමය. එය භාර ගත්තා නම් අපි එය ආරක්ෂා කර ගත යුතුව තිබෙනවා. මෙම අරමුණු ඇතිව දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා පළමුවැනි පිටුවේ තුන්වැනි වගන්තියේ තිස් දෙවැනි පේළියේ (අ) යන්නට පසුව "ගම්පහ වික්‍රමාරච්චි සිද්ධ ආයුර්වේද වෛද්‍ය සම්ප්‍රදාය ආරක්ෂා කිරීම හා" යන ඒ යෙදුම පිළිගන්නා ලෙසට, ඔබතුමා ඒ ගැන සලකනවා ඇතැයි මම හිතනවා. ඒවාගේම දෙවැනි පිටුවේ තිබෙනවා, "ආයුර්වේද ක්ෂේත්‍රයෙහි ප්‍රවීණත්වය ලබා ඇති තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්ය සඳහා විභාග පැවැත්වීම". දැනටත් ශිෂ්‍යයින්ට පමණක් නොවෙයි, ශිෂ්‍යාවන්ටත් ඒ ගම්පහ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ අධ්‍යයන පාඨමාලා පවතිනවා. මෙහි ඒ ගැන සඳහනක් නැහැ. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා එකඟ වෙනවා. ඒ ගැන මම බොහොම සන්තෝෂ වෙනවා. එතැනට "අධ්‍යයන පාඨමාලා පැවැත්වීම" යන්නත් එකතු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

මේක ඉතාමත්ම පුළුල් වගන්තියක්. තව ඉදිරියට තව දුරටත් විශ්ව විද්‍යාල මට්ටම කරා පවා මේ වෛද්‍ය විද්‍යාලය ගෙන යන්නට අවශ්‍ය වන පරිදි ඒ පිළිබඳ විධිවිධාන ඇති කිරීමට හැකි වන සේ දෙවැනි පිටුවේ පස්වැනි පෙළට පසුව 'ඉ' යන්න වශයෙන් "ගම්පහ වික්‍රමාරච්චි සිද්ධ ආයුර්වේද වෛද්‍ය සම්ප්‍රදාය අගය කරන සාරධර්ම, සමාජ, ආගමික හා සංස්කෘතික අංශ ප්‍රචලිත කිරීමට අවශ්‍ය ඕනෑම පියවරක් ගැනීම." යන කොටස එකතු කරන ලෙස මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමා හිස වනා එයට අනුමැතිය පළ කිරීම ගැන එතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඒ පිළිබඳ ප්‍රශ්නයක් නැහැයි කියා මම හිතනවා.

ඒවාගේම මෙහි ඉතා වැදගත් වගන්තියක් තිබෙනවා. 10 වැනි වගන්තිය. 10 වැනි වගන්තියෙන් තමයි, සංස්ථාවේ අරමුදල් පාලනය ගැන කියැවෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා, "පාර්ලිමේන්තුව විසින් එසේ සම්මත කරනු ලැබූ මුදල් පහත සඳහන් තැනැත්තන්ගෙන සමන්විත කාරක සභාවක අනුමැතිය ඇතිව සහ එහි අධීක්ෂණය යටතේ පමණක් වියදම් කරනු ලැබිය යුතුය." යන කොටසේ සඳහන් කාරක සභාවට තවත් දෙදෙනෙකුගේ නම් ඇතුළත් කරන ලෙස.

විශේෂයෙන්ම මේ පනත සකස් කරන අවස්ථාවේදී 'දේශීය වෛද්‍ය' කියන ව්‍යාපෘති අමාත්‍යාංශයක් තිබුණේ නැහැ. එම නිසා ඒ ගැන සඳහනක් කොට නැති බවයි පෙනෙන්නේ. ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ අවධානය යට මේ අවස්ථාවේදී එක් කරුණක් යොමු කරනවා. දැනට තිබෙන්නේ දේශීය වෛද්‍ය හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් එකම එක නියෝජිතයෙක් "කාරක සභාවේ සභාපතිවරයා විය යුතු ආයුර්වේද කොමසාරිස්වරයා" යන්න පමණයි. ආයුර්වේද කොමසාරිස් තනතුර වෛද්‍යවරයෙකුට පැවරිය යුතු තැනක් නොවෙයි. දැනට පැවරිලා නැහැ. මම ඉතාමත්ම ප්‍රශංසා මුඛයෙන් කතා කරනවා, දැනට සිටින කොමසාරිස්තුමා ගැන. එතුමා පරිපාලන සේවයේ සිටියත් දේශීය දේ අගය කරන කෙනෙක්. සුදුස්සෙක් සුදුසු තැන සිටීම ගැන අපි බොහොම සන්තෝෂ වෙනවා. එහෙත් පරිපාලන සේවයෙන් ඕනෑම කෙනෙකුට කඩා වැදිය හැකි, ස්ථාන මාරු වීම් ලැබී එතැනට පැමිණිය හැකි නිසා අපට විශ්වාසයක් නැහැ, මේ ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍ය සම්ප්‍රදාය කෙරෙහි සැබවින්ම හැඟීමක් ඇති අයම සදාකාලිකව මේ තනතුරේ සිටිවිද යන්න ගැන. මෙබඳු කරුණු නිසා දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගෙන් ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා, එතුමා නම් කරනු ලබන සුදුස්සෙකුට මෙහි තනතුරක් දෙන ලෙස. එන කොට හය දෙනෙක් වෙනවා. ඡන්දයක් වගේ එකකදී පිකක් අමාරු තත්ත්වයක් ඇති වෙනවා. එතැන පොඩි අඩුපාඩුවක් වගේ තිබෙනවා. පාලක සභාවේ සභාපතිතුමෙක් ඉන්නවා. භාණ්ඩාගාරික වරයෙක් ඉන්නවා. ඒ නිසා හත් වැනියාට පාලක සභාවේ ලේඛකාධිකාරීවරයාත් දමන්නටය කියා මම ඉල්ලා සිටිනවා.

මම මේ කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කළ අවස්ථාවේදී ගරු සෞඛ්‍ය ඇමතිතුමාත් ඒවාගේම දේශීය වෛද්‍ය ඇමතිතුමාත් ඊට එකඟවීම ගැන අතිශයින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගම්පහ වික්‍රමාරච්චි සිද්ධ ආයුර්වේද වෛද්‍ය සම්ප්‍රදාය කියන්නේ මේ රටේ දේශීය දේ. "සිය රට දේ—සිරි සැප දේ" යන කියමනක් තිබෙනවා නම් එහි ප්‍රතිමූර්තියයි වික්‍රමාරච්චි. පුද්ගලයාගේ උස මහත නොවෙයි. පෞරුෂත්වය කියන එකට පරම නිදර්ශනය. ගම්පහ වික්‍රමාරච්චි කියන්නේ දේශීය වෛද්‍ය ක්‍රමය ගැන පමණක් නොවෙයි. මේ රට නියෝජනය කරන අපේ සාරධර්ම, අපේ වටිනාකම් සියල්ලම, හර පද්ධතීන් ගැන එක වචනයකින් කියනවා නම් ඒ තමයි ගම්පහ වික්‍රමාරච්චි. නාමය. ඒ නාමය අනුස්මරණය කෙරෙමින් ඒ නාමයට උපහාර වශයෙන් අද දින ගරු දේශීය වෛද්‍ය ඇමතිතුමා විසින් මේ පනත ඉදිරිපත් කිරීම අපේ රජය විසින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ රටේ දේශීය දේ අගය කිරීමට ගන්නා ලද උදාර පියවර කීපයක තවත් ඉදිරි පියවරක් වශයෙන් හඳුන්වමින් මෙහිලා මූලිකව කටයුතු කළ ගරු රංජිත් අතාපත්තු සෞඛ්‍ය ඇමතිතුමාටත් දේශීය වෛද්‍ය ඇමති ආටිගල දේශීය වෛද්‍යතුමාටත් මම අතිශයින්ම ස්තුතිවන්ත වෙනවා.

තවත් දුරට කල්පනා කර බලන විට, මේ පනත සකස් කරන සමයේදී මේ ගැන බොහෝම මහන්සි වී නිරන්තරයෙන්ම වැඩ කළ හිටපු සෞඛ්‍ය ඇමති ගාමිණී ජයසූරිය මහතා අපට අමතක කරන්නට බැහැ. එතුමා විශේෂයෙන්ම ධර්මපාල නාමයට සම්බන්ධ කෙනෙක් නිසා, එය එතුමාගෙන් විය යුත්තක්. අනගාරික ධර්මපාල තුමාගේ පරපුරෙන් එන එතුමාගෙන් එය සිදු විය යුත්තක්. ඒ නිසා එය විශේෂයෙන් සඳහන් ලැබිය යුත්තක් නොවෙයි. ඒ වාගේම එතුමාගේ නියෝජ්‍ය ඇමතිතුමාව සිටි මහරගම ගරු මන්ත්‍රීතුමා (ප්‍රේමරත්න ගුණසේකර මහතා) මීට සම්පූර්ණ සහයෝගය දුන්නාට කිසිම සැකයක් නැහැ. ඒ නිසා මෙයට පුරෝගාමී වූ සියලු දෙනාටම මේ පුණ්‍ය සම්භාරය අත්වේවායි අපි ප්‍රාර්ථනා කරනවා.

අ. භා. 5.24

**ආර්. එම්. කරුණාරත්න මහතා (ඌව-පරණගම)**
*(திரு. ஆர். எம். கருணாரத்ன—ஊவ-பரணகம)*
**(Mr. R. M. Karunaratne—Uva-Paranagama)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයුර්වේද කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා ඉතාම කාලෝචිත පනතක් මේ ගරු සභාවට ඉදිරිපත් කිරීම ගැන අප සියලු දෙනාගේම ස්තුතිය එතුමාට පුද කරන්න ඕනෑ. මගේ කල්පනාවේ හැටියට, 1977 මැතිවරණ සමයේදී ප්‍රධාන වශයෙන් ග්‍රාමීය මට්ටමෙන් අප වෙනුවෙන් ජනතාව අතර මූලිකත්වයෙන් වැඩ කළ ගමේ වෙද මහත්මයා ගමේ සම්භාවනීය පුද්ගලයෙක්. ගමේ වෙද මහත්මයා මේ තත්ත්වයට දියුණු වුණේ ගම්පහ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයට සම්බන්ධවීමෙන් බව රහසක් නොවෙයි. අද මේ ගරු සභාවේ සිටින අපේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් වැඩි දෙනෙක් මේ තත්ත්වයෙන් ඉන්නේ, ඒ අයගේ මැණිවරුන් පියවරුන් ආයුර්වේදයේ බෙහෙත්, ප්‍රතිකාර ගත් නිසා බවයි මගේ හැඟීම.

බටහිර වෛද්‍ය ක්‍රමය මේ තරම් ප්‍රචාරයට පත් වුණේ මෑත යුගයේදීයි. අපේ ප්‍රදේශවල ජනතාව අද වුණත් බටහිර වෛද්‍ය ක්‍රමයට වඩා ප්‍රයෝජනයට ගන්නේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයයි. බටහිර වෛද්‍ය ප්‍රතිකාර සඳහා හැතැප්ම 40 ක් 50 ක් ඈත යායුතු තැන්වලදී අපේ ගැමි ජනතාව අදත් ප්‍රයෝජන ලබා ගන්නේ ගමේ වෙද මහත්මයාගෙනි. ගමේ වෙද මහත්මයා බිහිවුණේ ගම්පහ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයෙන් බව අමතක කළ යුතු නැහැ. 1965-70 කාලයේදී අපේ ගරු ඩඩ්ලි සේනානායක අගමැතිතුමා, ඒ විද්‍යාලය ඇති කර පවත්වාගෙන ගිය පණ්ඩිත වික්‍රමාරච්චි මැතිතුමාට සැලකිල්ලක් වශයෙන් සෙනෙට් මන්ත්‍රී පදවියක් පවා ප්‍රදානය කළ බව අප අමතක කළ යුතු නැහැ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) මේ පනත ගැන සන්තෝෂය පළ කළත් එතුමාගේ ඡන්ද කොට්ඨාශයේ පිහිටා තිබෙන මේ විද්‍යාලයයට මේ විධියේ තත්ත්වයක් ලබා දීමට එතුමන්ලාගේ ආණ්ඩුවට බැරි වුණා. මම ඒ ගැන කණගාටු වෙනවා. එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා 1952, 1956 කාලයේදී...

**එස්. ඩී. බණ්ඩාරනායක මහතා**
*(திரு. எஸ். டி. பண்டாரநாயக்க)*
**(Mr. S. D. Bandaranayake)**

On a point of personal explanation, I wish to inform the hon. Member that it was Mrs. Sirima Bandaranaike who appointed Pandit Wickremarachchi as a Senator, and also, that during the time of the late S. W. R. D. Bandaranaike he wanted to make this College a University in 1956, but it was Pandit Wickremarachchi who did not want to convert it into a University.

**ආර්. එම්. කරුණාරත්න මහතා**
*(திரு. ஆர். எம் கருணாரத்ன)*
**(Mr. R. M. Karunaratne)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ ඒ අදහස තියෙන්නට ඇති. නමුත් ඒ වෛද්‍ය විද්‍යාලය මේ තත්ත්වයට ගේන්න කටයුතු කළේ 1977 දී පත් වුණු මේ රජය බවයි, අපේ තර්කය. ආයුර්වේදයට නිසි තැන අපි ලබා දුන්නාය කිම පැහැදිලි කාරණයක්.

පණ්ඩිත වික්‍රමාරච්චි මැතිතුමා ගැන මම පොඩි හැඳින්වීමක් කරන්න කැමතියි. 1962 දී, එවකට වලපනේ හිටපු මන්ත්‍රීතුමාගේ සහෝදරයෙක් රෝහලේ සිට වික්‍රමාරච්චි මැතිතුමා ළඟට ගෙනාවා. ඒ රෝගියා ජීවත් නොවන බව රෝහලේදී තීරණය කර තිබුණා. ලේ කැටිගැසීමක් නිසා ඔහු ජීවත් කරන්න බැරි බවට තීරණය කර තිබුණා. ඔහුගේ මිනිය දැමීම සඳහා පෙට්ටියකුත් රෝහලට ගෙනැවිත් තිබුණා. නමුත් දවස් හතරකට පසු නැවතත් ඔහුට සිහිය ආවා. ඊළඟට දොස්තරවරුන් කිව්වා, අපට කරන්න තවත් වෙදකමක් නැහැ. මෙයාව ගෙදර ගෙන යන්න, තව සුමානයකින් මිය යනවාය කියා. ඊට පසුව ඔහුව අරගෙන ආවේ ආයුර්වේදය පිළිබඳ වැඩ කටයුතු කළ අපේ පණ්ඩිත වික්‍රමාරච්චි මැතිතුමා ළඟටයි. එතුමා අවුරුද්දක් වෙදකම් කළා. ඒ පුද්ගලයාට සනීප වුණා. ඒ පුද්ගලයා අදත්—1982 අවුරුද්දෙත්—ජීවත් වෙන බව මේ අවසථාවේදී මතක් කරන්න ඕනෑ.

ඔහුට ත්‍රොම්බෝසිස් නැත්නම් ලේ කැටි ගැසීම කියන රෝගය නැවත් හැදුනේ නැහැ. ඒ කියන්නේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය අනුව වෙදකම් කිරීමෙනුයි, ඔහුට තව දුරටත් ජීවත්වීමට අවස්ථාව ලබා දී තිබෙන්නෙ. මම මේ බටහිර වෛද්‍ය ක්‍රමය පහත් කර කථා කරනවා නොවෙයි. බටහිර වෛද්‍ය ක්‍රමය අභිබවා සමහර අවස්ථාවලදී ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ගමන් කර තිබෙනවා. අද වුණත් ගම්බද ජනතාව ඔලුවේ කැක්කුමකට ඩිස්ප්‍රින් පෙත්තක් ගත්තත් හෙම්බිරිස්සාවක් හැදුන විට ඉඟුරු කොත්තමල්ලි ටිකක් හෝ පස් වගේ කසායක් තම්බා ගෙන බොන්නටයි පුරුදු වී සිටින්නෙ. ඒ වගේම සමහර අය ඔලුවේ කැක්කුමටත් තෙල් ටිකක් ගාගන්නට පුරුදු වී සිටිනවා. පුංචි ළමයින්ට සෙම් අමාරුවක් හැදුනත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තමයි, බොහෝ විට උපයෝගී කර ගන්නෙ. ඒ නිසා අපේ ජන ජීවිතයේදී ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දිගින් දිගටම ප්‍රයෝජනයට ගන්නවාය කියන එක පැහැදිලි කාරණයක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. කරුණාරත්න මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා තව වැඩි වේලා වක් කථා කරගෙන යන්නට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට මේ විධියට තැනක් දීමට කටයුතු කරන අතරම ආයුර්වේද බෙහෙත් පැළ විනාශ වී යාම නතර කිරීමටත් යම්කිසි පියවරක් ගත යුතුව තිබෙනවා. ලංකාවේ ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය වගා කිරීමටත්, ආරක්ෂා කිරීමටත් ස්වදේශීය වෛද්‍ය කට යුතු අමාත්‍යාංශය විසින් මීට වඩා ප්‍රතිකර්ම යෙදිය යුතුව තිබෙනවා. එහෙම නොකළොත් ලංකාවට අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය බොහෝ විට පිටරටවලින්ම තමයි, ගෙන්වන්නට සිදු වෙන්නෙ. ආයුර්වේද බෙහෙත් ගස් දරට කපා දමන්නේ මේවායේ වටිනාකම අපේ ජනතාව දන්නේ නැති නිසයි. අන්න ඒ පිළිබඳවත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන ලෙස ඉල්ලමින් මගේ කතාව නවත්වනවා.

**ඒ. එම්. ආලාලසුන්දරම් මහතා (කෝපායි)**

*(திரு. ஏ. எம். ஆலாலசுந்தரம்—கோப்பாய்)*

**(Mr. A. M. Alaalasundaram—Kopay)**

உப தலைவரவர்களே, கம்பஹ விக்கிரமாராச்சி ஆயுர்வேத வித்தியாலயம் (கூட்டிணைத்தல்) சட்டமூலம் இச்சபையில் விவாதிக்கப்படுகின்ற இவ்வேளையில் இச்சட்டமூலத்தை வரவேற்று இங்கு பல அங்கத்தவர்கள் பேசினர்கள். இந்நாட்டில் நடைமுறையிலிருக்கின்ற பல்வேறு சுதேச வைத்திய முறைகளைப்பற்றியும் அவற்றின் சிறப்பியல்புகளைப் பற்றியும் அவர்கள் இங்கே குறிப்பிட்டார்கள். சித்த வைத்தியம், ஆயுர்வேத வைத்தியம், யூனனி வைத்தியம் எனப் பலவகைப்பட்ட வைத்திய முறைகள் எமது நாட்டிலே உள்ளன, இவை ஒவ்வொன்றுக்கும் தனித்தனிச் சிறப்பியல்புகளும் தனித்தன்மையும் இருப்பதை நாம் காண்கிறோம். எனக்கு முன்பு பேசிய அங்கத்தவர் கம்பஹ சித்த வைத்திய நிலையம் என்று பெயர் பெற்றிருந்த இந்த விக்கிரமாரச்சி வைத்திய நிலையம் சுத்த ஆயுர்வேத நிலையமாக இருக்குமோ என்ற ஐயத்துடன் ஒரு கருத்தை இங்கே குறிப்பிட்டிருந்தார். அவர் அறிய வேண்டும். கிழக்கு நாடுகளிலே நாகரிகம் ஆரம்பித்த நாட்களிலிருந்து வளர்ந்து வந்த வைத்தியத் துறைகளிலே ஒன்றுதான் சித்த வைத்தியத் துறை என்பதை. சித்த வைத்தியத் துறை ஒரு பூரணத்துவமான வைத்தியத் துறையாகும். அதற்கு மேலும் எந்தவிதமான ஆராய்ச்சியும் வேண்டியதில்லை.

பல நூற்றுண்டு காலமாக, நமது மக்கள், அந்த வைத்தியத் துறையைப் பேணிப் பாதுகாக்காத காரணத்தினுல்தான் அந்த வைத்தியத்துறையின் உபயோகம் முற்றுமுழுதாக அழிந்து அதனைத் தெரிந்தவர்களே அருகிப் போகின்ற நிலைமை ஏற்பட்டுள்ளது. அதனுலே மிகச் சிறந்த இந்த சித்த வைத்தியத்துறையை — சுதேசிய வைத்தியத்துறையை — பேணி பாதுகாக்கக்கூடிய நிலை நீண்ட நாட்களாக ஏற்படாமல் இருந்தது. ஆனுல். இந்த நாடு சுதந்திரம் அடைந்த பின்பு. சுதேசியமான எல்லா விடயங்களும் முக்கியத்துவம் பெற்று வந்திருக்கின்றன. இந்த வைத்தியத்துறை ஒன்றைத் தவிர, இன்று இந்தச் சபையிலே நிறைவேற்றப்படவிருக்கின்ற இந்தச் சட்டம். சுதேச வைத்தியத்துக்கு மேலும் இந்த நாட்டிலே நல்ல இடத்தைக் கொடுக்கும் என்பதை எடுத்துக் காட்டுகின்றது. இது மிகவும் மகிழ்ச்சியை அளிக்கக்கூடிய ஒரு விடயமாகும். ஆயுர்வேத வைத்தியமும் சித்த வைத்தியமும் தனித்தனித் தன்மைகள் கொண்டவை. நான் நினைக்கின்றேன், இச்சபையிலே இருக்கின்ற எங்களை விட, அத்துறையில் பாண்டித்தியம் பெற்ற வைத்தியர்களையும் கலாநிதிகளையும் கொண்டு முடிவான ஆராய்ச்சிகளை மேற்கொண்டால் தான் நிச்சயமாக அவ்வைத்தியத்துறைகளுக்கான வளர்ச்சிகளை நாம் காணமுடியும்.

ஏறத்தாழ 15—20 ஆண்டுகளுக்கு முன்பு சென்னைப் பல்கலைக் கழகம் மேல் நாட்டு வைத்திய முறையையும் ஆயுர்வேத—சித்த வைத்திய முறைகளையும் ஒன்றாக கலந்து ஒரு புதிய சுதேச வைத்திய முறையைப் பயிற்றுவிப்பதற்கான ஒரு வைத்தியக் கல்லூரியைச் சென்னையிலே ஆரம்பித்தார்கள். ஏறத்தாழ ஐந்து. ஆறு வருடங்களுக்குப் பிறகு, வைத்தியத்துறையிலே மிகவும் நீண்டகால அனுபவம் பெற்ற அறிஞர்களுடைய ஆலோசனையின் பேரில் அந்த வைத்தியக் கல்லூரி மூடப்பட்டுவிட்டது. மூன்று நான்கு வைத்தியத்துறைகளை ஒன்றாகச் சேர்த்ததன் மூலம் நோயாளிகளுக்கும் வைத்தியத் துறைக்கும் பாதிப்புத்தான் ஏற்பட்டிருக்கின்றதென்பதை அறிந்து, அவ்வைத்தியத் துறைகள் தனித்தனியே வளர்க்கப்படவேண்டுமென்பது தெட்டத்தெளிவாக எடுத்துக் கூறப்பட்டது. நான் நினைக்கிறேன் ; சென்னையிலே மூடப்பட்ட அந்தச் சுதேச வைத்தியக் கல்லூரி நமது நாட்டுக்கு நல்ல ஒரு பாடமாக அமைகிறது என்று. துரதிஷ்டவசமாக சித்த வைத்தியத்தைக் கற்றுக் கொடுக்கக் கூடிய அறிவு படைத்த சித்த வைத்தியர்கள் எமது மத்தியில் இல்லாத காரணத்தினுல் ஆயுர் வேதத்தில் பட்டம் பெற்றவர்கள் சித்த வைத்தியத்தில் பாடம் சொல்லிக் கொடுக்கிற பரிதாபகரமான ஒரு நிலைமை இங்கே இருக்கிறது. அதுபோலவே யூனனி வைத்தியத்திலும் இதே குறையாக இருக்கிறது.

இந்த நாட்டிலே சுதேச வைத்தியங்களாக ஏற்றுக் கொள்ளப்பட்டுப் பேணிப் பாதுகாக்கப்படவேண்டிய சித்த ஆயுர்வேத, யூனனி வைத்தியத்துறைகளில் பாண்டித்தியம் பெற்ற கலாநிதிகளையும் பட்டதாரிகளையும் வைத்தியர்களையும் கொண்டு இவ்வைத்திய முறைகளைப் பேணி வளர்ப்பதற்கான முயற்சிகளை அமைச்சு நிச்சமாக மேற் கொள்ள வேண்டும். நாங்கள் பல காலமாக நடைமுறையில் கைக் கொள்ளாமலும் இவ் வைத்தியத் துறைகளின் சிறப்பியல்புகளை அறியாமலும் இருந்த காரணத்தால், ஆயுர்வேத, சித்த, யூனனி வைத்தியங்கள் எல்லாம் ஏதோ சுதேச வைத்திய முறைகள் என்று சொல்லி அவற்றையெல்லாம் ஒன்றாகக் கலந்து கொள்கிற ஒரு நிலைக்கு நாங்கள் வந்தால் இந்த வைத்திய முறைகளினுல் மக்களுக்கு நன்மைக்குப் பதிலாகத் தீமையைத் தான் விளைவிப்போம். அதுவுமல்லாமல் இந்த வைத்திய முறைகளை எங்களால் வளர்க்கவும் முடியாது. இந்த வைத்திய முறைகளினுல் மக்களுக்கு நன்மை கிடைக்கப்போவதுமில்லை. ஏனெனில் இந்த வைத்தியத் துறைகளின் அடிப்படையாக அமைந்தவை யாவும் தனித்தனிப்பட்டவை. இந்த வைத்தியத் துறைக்கு இருக்கிற "பாமதோப்பியா" என்கிற மருந்து செய்கிற முறைகளுக்கான விதிகள் சித்த வைத்தியதுக்குத் தனியானவை. யூனனி வைத்தியத்துக்குத் தனியானவை. ஆயுர்வேத வைத்தியத்துக்குத் தனியானவை. அதுமட்டுமல்லாமல் இந்த வைத்தியத் துறைகள் சம்பந்தப்பட்ட மருந்துகளை உருவாக்குவதற்கு உபயோகிக்கப்படுகின்ற மூலப்பொருள்கள் தனித்தனிப்பட்டவை. சில மூலப் பொருள்கள் யூனனி வைத்தியத்தைப் பொறுத்தவரையிலே கையாளப்படாதவை, சில மூலப் பொருள்கள் ஆயுர்வேத வைத்யத்தைப் பொறுத் வரையிலே கையாளப்படாதவை. ஆகவே இம்மூன்று வித்தி

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

யாசமான வைத்தியத்துறைகளின் தனித் தன்மையையும், இம்மூன்றிலும் மக்கள் பயனடையக்கூடிய வாய்ப்பு இருக்கிறது என்பதையும் பூரணமாக உணர்ந்து அதற்கான வழிவகைகளைக் கையாண்டு இம்மூன்று வைத்தியத்துறைகளையும் வளர்க்க முற்பட வேண்டும்.

கம்பஹ சித்த ஆயுர்வேத வைத்தியசாலை என்று நீண்ட நாட்களாகப் பெயர்பெற்ற, அந்தப் பகுதியிலே சுதேச வைத்தியத்திற்கு முதல் நிறுவனமாக இருந்த பண்டிதர் விக்கிரமாரச்சி சித்த ஆயுர்வேத வித்தியாலயம் அதன் பெயரை சித்த ஆயுர்வேத வித்தியாலயமெனக் கொண்டிருப்பதிலிருந்து நாங்கள் ஒன்றை உணர்ந்துகொள்ள வேண்டும். பண்டிதர் விக்கிரமாரச்சி கூட சித்த வைத்தியத்திலே பாண்டித்தியம் பெற்றவராகத்தான் இருந்திருக்கிறார். வடக்கிலங்கையில் இருக்கிற கடந்த தலைமுறையைச் சேர்ந்த சில சித்த வைத்தியர்கள் பண்டிதர் விக்கிரமாரச்சியோடு நேரடித் தொடர்பு வைத்தவர்களாக இருந்திருக்கிறார்கள். சில மருந்துகளை உற்பத்திசெய்வது பற்றியும் அந்த மருந்துகளை கையாளுகின்ற முறைகள் பற்றியும் அவர்கள் பண்டிதர் விக்கிரமாரச்சி அவர்களோடு கலந்துரையாடச் சந்தர்ப்பங்கள் கிடைத்த நேரத்திலே பண்டிதர் விக்கிரமாரச்சி அவர்களுடைய பரம்பரை முழுக்க முழுக்க சித்த வைத்திய பரம்பரைதான் என்பதை அவர்களால் அறிந்துகொள்ளக்கூடியதாக இருந்திருக்கிறது. ஆகவே இந்தச் சட்டமூலத்திலே இருக்கிற ஆயுர்வேத, சித்த வைத்திய வளர்ச்சிக்காக இந்த வித்தியாலயம் அமைக்கப்படுகிறது என்று கூறப்பட்டிருப்பது பற்றி மகிழ்ச்சி. ஆனால் சட்டமூலத்தினுடைய தலைப்பு தனியாக கம்பஹ விக்கிரமாரச்சி ஆயுர்வேத வித்தியாலயம் எனக் கூறப்பட்டிருப்பது எதனால் என எனக்குப் புரியவில்லை. எனக்கு முன் பேசிய கௌரவ அங்கத்தவர் குறிப்பிட்டதுபோல சித்த ஆயுர்வேதமோ சுத்த ஆயுர்வேதமோ என்ற சந்தேகம் இந்தச் சட்டமூலத்தை உருவாக்கியவர்கள் மத்தியில் ஏற்பட்டதோ என்னமோ எனக்குத் தெரியாது. எதுவாக இருந்தாலும் பல நூற்றாண்டு காலமாக ஊன்றிவிட்ட, வளர்ந்த, முழுமைபெற்ற ஒரு வைத்தியத்துறையான சித்த வைத்தியத்துறை இந்த நாட்டில் மட்டுமல்ல வேறு நாடுகளிலும் பேணிப் பாதுகாக்கப்படுவதை நாங்கள் மறுக்க முடியாது.

இந்தியாவிலே இருக்கிற மதுரைப் பல்கலைக்கழகத்திலே சித்த வைத்தியத் துறைக்காக ஒரு தனிப் பகுதியை உருவாக்கி பல ஆராய்ச்சிகள் மேற்கொள்ளப்படுவதை மனதிலே கொண்டு—நமது நாட்டிலே ஆயுர்வேதம், சித்தம், யூனானி எல்லாம் மொத்தமாக சுதேச வைத்தியம்தானே என்கிற ஒரு தவறான எண்ணத்தினை எல்லாவற்றிலும் கலந்து அதனால் எவருக்கும் பலனில்லாத நிலைமையை ஏற்படுத்தாமல்—தனித்தனி வைத்திய முறைகளான அவை அவற்றினுடைய தனித் தன்மைகளை இழக்காத முறையிற் காப்பாற்றி அவற்றினால் மக்களுக்குப் பலன் கிடைப்பதற்கு வழிவகுக்க வேண்டியது அரசாங்கத்தினுடைய முக்கிய கடமையாகும்.

இந்த வைத்திய நிலையத்துக்குச் சட்ட இணைப்பு மூலம் ஓர் அங்கிகாரம் அளிப்பது எங்களுக்கு மிக்க மகிழ்ச்சியளிக்கக் கூடிய ஒரு விஷயமாகும். இந்தக் கம்பஹ வித்தியாலயம் உருவாவதற்கு பல ஆண்டுகளுக்கு முன்னர் வட இலங்கையிலே ஒரு சித்த ஆயுர்வேத வைத்தியசாலை அமைக்கப்பட்டிருந்தது. அந்த வைத்தியசாலையும் கல்லூரியும் ஏறத்தாழ பண்டிதர் விக்கிரமாரச்சி அவர்களுடைய வித்தியாலயத்தைப்போல வெளி நோயாளர்களுக்கான அமைப்பையும் அதே நேரத்திலே சித்த, ஆயுர்வேதக் கல்வியைப் பயிற்றுவதற்கான வசதியையும் கொண்டதாக இருந்தது. இப்பொழுதும் அது நடைபெற்றுக்கொண்டிருக்கிறது. ஆனால் இதுநாள்வரை இந்த நாட்டு அரசாங்கம் அந்தக் கல்லூரிக்குப் போதிய ஆதரவு அளிக்காத காரணத்தினால் அது முழுமையான வளர்ச்சியடைய முடியவில்லை என்பதை அமைச்சருடைய கவனத்துக்குக் கொண்டு வருவதுடன் அந்த நிறுவனத்தின் வளர்ச்சிக்காக ஆவன செய்யவேண்டுமென அவரைக் கேட்டுக்கொள்கிறேன். அதே நேரத்தில் பல இலட்சக்கணக்கான ரூபா பணத்தை மூலதனமாகக் கொண்டு பல ஆண்டுகளுக்கு முன் கட்டி முடிக்கப்பட்டிருக்கிற கைதடி சுதே வைத்தியசாலைக் கல்லூரிக் கட்டடங்கள் இன்னமும் எந்தவிதமான பயன்பாட்டுக்கும் உட்படுத்தப்படாமல் இருக்கின்றன. அந்த வைத்தியசாலைக் கல்லூரியிலும் ஒரு சித்த வைத்தியக் கல்லூரியை நடாத்துவதற்கான ஏற்பாடுகளை இந்த அமைச்சு நிச்சயமாகச் செய்யவேண்டுமென்று கேட்டுக்கொள்வதோடு, இப்பொழுது கம்பஹ விக்கிரமாரச்சி ஆயுர்வேத வித்தியாலயம் பற்றி எடுத்திருக்கின்ற ஒரு சிறப்பான முடிவைப்போல இக்கல்லூரியும் நடைபெறுவதற்கு வசதியாக அதற்குப் பல்கலைக்கழக அந்தஸ்துப் போன்ற ஓர் அந்தஸ்தை அளிக்கவேண்டுமென்று கேட்டுக் கொள்ளுகின்றேன்.

අ. භා. 5.39

**ආනන්ද දසනායක මහතා (කොත්මලේ)**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake—Kotmale)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වන පනතක් අද මේ ගරු සභාව ඉදිරියේ තබා තිබෙනවා. පසුගිය අවුරුදු දෙක තුන තුළදීම අපේ දේශීය වෛද්‍ය කටයුතු භාර ඇමතිතුමාට මම මේ ගැන මතක් කළා. එතුමා වතාවක් පොරොන්දුවක් දුන්නා මේ වෛද්‍ය විද්‍යාලය, විශ්ව විද්‍යාලයක් බවට පත් කරනවාය කියා. එසේ කිරීමට රජය තීරණය කර තිබෙන බවත් එතුමා කිව්වා. ඒ වාගේම ගරු ජනාධිපතිතුමාත් අවුරුදු 4 කට පමණ පෙර ඒ ස්ථානයට ගිය වේලාවේ ඒ පිළිබඳව පොරොන්දුවක් දී තිබෙනවාය කියන එකයි, මගේ හැඟීම. ඒ ගැන ඒ දවස්වල ප්‍රවෘත්ති පත්‍ර වලින් හා ගුවන් විදුලියෙන් අපට දැනගන්නට ලැබුණා.

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍යාචාර්යතුමා මේ විද්‍යාලයට කර තිබෙන සේවයත්, ඒ වාගේම මුළු ස්වදේශීය වෛද්‍ය ක්‍රමයටම කර තිබෙන සේවයත් දිහා බැලුවාම කවදාවත් එතුමා අමතක කරන්න පුළුවන් කමක් නැහැ, අපේ මුළු ජාතියටම. රටක ජීවයේ කොටස් කිහිපයක් තිබෙනවා. අපේ ආයුර්වේද ලක්ෂණ එක පැත්තකින් එනවා. ඒ වාගේම ආගමික වතාවත්, සිරිත් විරිත් ආදිය තවත් පැත්තකින් එනවා. එමෙන්ම අපේ අවුරුදු සිරිත් විරිත් වලින් සංස්කෘතික ලක්ෂණ වෙනම එනවා. මේවා තමයි, ජාතියේ පාරම්පරික ශිෂ්ටත්වය, ප්‍රෞඪත්වය විදහා පාන ලක්ෂණ. ඒවා අතර එකක් තමයි, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය.

ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ලංකාවට පමණක් සීමා වී නැහැ. එමෙන්ම එය ඉන්දියාවට පමණක් සීමා වෙලත් නැහැ. මුළු ලෝකයේම වෙන වෙන නම්වලින් හෝ ඒ ඒ රටවල ඒක පවතිනවා. චීනයෙත් මේ විධියටම දේශීය වෛද්‍ය ක්‍රම තිබෙනවා, අපේ ගම්පහ ගරු මන්ත්‍රීතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

(එස්. ඩී. බණ්ඩාරනායක) මහතා දන්නවා, කවු චිකිත්සාව ඒක ඉතාමත් සාර්ථක ලෙස ලෝකයේ පැතිරීගෙන යනවා. ඒක චීනයේ දේශීය වෛද්‍ය ක්‍රමයක්. එහි සාර්ථකත්වය, සත්‍යතාවය, ඔප්පු වෙනකොට ඒ වෛද්‍ය ක්‍රමය මුළු ලෝකයේම පැතිර යන්නත් මුළු ලෝකයේම අය එය ඉගෙන ගන්නත් පටන් ගන්නවා.

ලංකාවේ තිබෙන දේශීය වෛද්‍ය ක්‍රමය ලංකාවේ පමණක් නොවෙයි තිබෙන්නේ. ලංකාවට ඇවිල්ලා එය ඉගෙන ගෙන ගිය අය ලෝකයේ වෙනත් රටවල ඉන්නවා. ආයුර්වේද වෛද්‍ය වික්‍රමාරච්චි ශූරීන්ගෙන් ඉගෙන ගත් වෛද්‍ය ක්‍රමය ඉන්දියාවේ ප්‍රචලිත වෙලා තිබෙනවා. ඒක ඊහි ක්‍රියාත්මක වෙනවා. චීනයේත් තිබෙනවා. වෙනත් රටවලත් තිබෙනවා. එංගලන්තයේ පවා සමහර ප්‍රදේශවල තිබෙන බව පුවත්පත්වල පළවී තිබෙනවා. එතුමාගෙන් ඉගෙන ගත් ශිෂ්‍යයින් එය ලෝකය පුරාම පතුරුවා හරිනවා. එහි සත්‍යතාවය ඔප්පු වෙනකොට එය පැතිරී යනවා. එයින් කෙරෙන්නේ ලෙඩුන් සුව කිරීම.

ලෙඩුන් සුව කිරීමට එක් කෙනෙක් බටහිර වෛද්‍ය ක්‍රමය ගන්නවා. තව එක් කෙනෙක් චීන වෛද්‍ය ක්‍රමය ගන්නවා. තවත් එක් කෙනෙක් සිංහල ආයුර්වේදය හෝ සිද්ධායුර්වේදය හෝ ගන්නවා. නැත්නම් යුනානි ක්‍රමය අරගෙන ලෙඩ සුව කරන්න උත්සාහ කරනවා. ඒ හැම එකකින්ම බලන්නේ රෝගියෙක් සුවපත් කිරීමයි. යම් රෝගියෙක් සුවපත් කිරීමට හැකි යම් වෛද්‍ය ක්‍රමයක් තිබෙනවා නම් කිසිම රෝගියෙක් එම වෛද්‍ය ක්‍රමයට අකමැති වෙන්නේ නැහැ. තමන්ට වුවමනා කරන්නේ ඒ රෝගය සුවපත් කර ගැනීම පමණයි. ඒ කියන්නේ තමන්ගේ රෝගය නිවාරණය කර ගැනීමයි; නිරෝගී වීමයි. නිරෝගී වීමට ජාතියක් ආගමයක්, වර්ගයක්, භාෂාවක්, කුලයක් කියන ඔය කිසිම දෙයක් බලපාන්නේ නැහැ. යම් කෙනෙක් රෝගී අවස්ථාවකට පත් වුණු විට ඒ රෝගියාගේ ආධාර කරුවන් උත්සාහ කරන්නේ මොන ක්‍රමයකින් හරි, මොන වෛද්‍ය ක්‍රමයක් උපයෝගී කරගෙන හරි එම රෝගය සුවපත් කර ගැනීමටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර අයෙක් කියනවා, අපේ ඉතිහාසය අනුව බලන විට අපේ වෛද්‍ය ක්‍රමය පටන් ගෙන තිබෙන්නේ විජයගෙන් පසුවය කියා. තවත් සමහරෙක් තර්ක කරනවා, විජය එන්නටත් පෙර සිටම ලංකාවේ මේ වෛද්‍ය ක්‍රමය පැවතගෙන ආවාය කියා. මේ මත දෙකෙන් කොයි මතය හරිද කියා මට කියන්න පුළුවන්කමක් නැහැ. අපට එතැන සැකයක් උපද්දල තිබෙනවා. ඒ තර්ක අනුව, අපේ ඉතිහාසය අනුව බලන විට අපට පෙනී යන්නේ සමහර විට අවුරුදු 3,000 ක පමණ කාලයක් තිස්සේ මේ රටේ මේ වෛද්‍ය ක්‍රමය පැවත ගෙන එන බවයි.

ලෙඩ සෑදීම එක ජාතියකට පමණක් සීමා වෙන්නේ නැහැ; එක් කාල පරිච්ඡේදයකට පමණක් සීමා වෙන්නේ නැහැ. කොයි කාලයේදීත් එක්තරා ප්‍රමාණයකින් ලෙඩ රෝග පැතිරීම සිදු වෙනවා. එහෙම නම් ඒ කාලවලදීත් බටහිර වෛද්‍ය ක්‍රමය උපයෝගී කරගෙනද, මේ රටේ සිටි උදවිය ලෙඩ රෝග සුවකරගත්තේ? ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ කාලය දක්වාම මේ රටේ සිංහල රාජ්‍යය පැවතුණා. ඒ කාලය දක්වාම එකම එක බටහිර වෛද්‍යවරයෙකුවත් ලංකාවට පැමිණ සිටියේ නැහැ. පෘතුගීසීන් මේ රටට පැමිණියේ 1505 දීයි. එනම් 16 වෙනි ශත වර්ෂයේ දී යි. එහෙම නම් ඒ කාලයේදී මේ රටේ ජනතාව ලෙඩ රෝග සුවපත් කර ගත්තේ දේශීය වෛද්‍ය ක්‍රමවලින්මයි. එහෙම නම් අද අපට එය කරන්න බැරි ඇයි? අපේ දේශීය වෛද්‍ය ක්‍රමය දියුණු කර ගන්නට පුළුවන්කම තිබියදී අපි හැම වෙලාවේම විදේශවල ආධාර ඉල්ලා සිටිනවා. ඇත්ත වශයෙන්ම අපේ පුංචි කාලය ගැන අපි දන්නවා. අපි පුංචි කාලයේදී අපව ආරෝග්‍යශාලාවකට ගෙනයන්න අපේ පියාණන්දැ කවදාවත් ඉඩ දුන්නේ නැහැ. හැමදාමත් අපට ලබා දුන්නේ දේශීය වෛද්‍ය ප්‍රතිකර්මයි. පොඩි ලෙඩක් හැදුනත්, සාමාන්‍ය තත්ත්වයේ අසනීපයක් හැදුනත් හැම අවස්ථාවකදීම අපව ගෙන ගියේ ආයුර්වේද වෛද්‍යවරයෙක් වෙතටයි. හැම විටම අපට ලබා දුන්නේ ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකර්මයි. ඒ නිසා අද අපි නිරෝගීව ජීවත් වෙනවා. අපට ඒ රෝගවලින් නිදහස් වෙන්නට උදව් වුණු ආයුර්වේද වෛද්‍ය ක්‍රමය කෙරෙහි හැමවිටම අපේ සැලකිල්ල යොමු වෙන්න ඕනෑ.

මා හිතන හැටියට, මේ ගරු සභාවේ සාමාන්‍ය මන්ත්‍රීවරුන්ගෙන් බොහෝ දෙනෙක් පමණක් නොවෙයි ඇතැම් ඇමතිවරුන් පවා අද ජීවතුන් අතර සිටින්නේත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ පිහිටෙන් තමයි. එය නැතැයි කියන්න බැහැ. [බාධා කිරීම්] තමුන්නාන්සේගේ රෝගය නම් කවදාවත් සුව කරන්න බැහැ, තමුන්නාන්සේගේ රෝගයට ප්‍රතිකාර කරන්න අඩු තරමින් නීලම්මහරවත් යවන එක හොඳයි. [බාධා කිරීම්] දඩුකදේ ගහල හොඳ 'ඔපරේෂන්' එකක් කරන්න ඕනෑ [බාධා කිරීම්].

අප බොහොම සන්තෝෂ වෙනවා, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ගැන. රටට ගැළපෙන, රටට අත්‍යවශ්‍ය පනත් කෙටුම්පත් නැත්නම් යෝජනා ඉදිරිපත් කෙරෙන විට අප කවුරුත් පක්ෂ භේදයෙන් තොරව ඒවාට සහයෝගය දෙනවා. නැබැයි, ඒවායේ තිබෙන අඩුපාඩුකම් පෙන්වා දීමත් අපේ යුතුකමක් බව මතක් කරන්න ඕනෑ. අපි එය කරනවා. අපි ඒ විධියට කටයුතු කරන විට ආණ්ඩු පාර්ශ්වයේ ඇතැම් උදවිය කියනවා, අප හැම දේකටම විරුද්ධ වෙනවාය කියා. එය වැරදි අදහසක්. මේ පනත් කෙටුම්පත බොහොම හොඳ එකක්. මෙය නීතිගත කිරීම මගින් අප බලාපොරොත්තු වෙනවා, මේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය විශ්ව විද්‍යාල තත්ත්වයට පත් කරන්න. මගේ අදහසත්, ඒ වගේම මේ රටේ වැඩි දෙනාගේ අදහසත් එයයි.

පණ්ඩිත වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය ශූරීන්ට ණය ගැති නොවන පුද්ගලයන් ලංකාවේ ඉන්නවා නම් ඒ බොහෙම අතලොස්සක් පමණයි. දැනට ජීවතුන් අතර නැති අයත්, වික්‍රමාරච්චි වෛද්‍ය ශූරීන්ගේ මරණයෙන් පසුව බිහිවුණු ළමා ළපැටියනුත් හැරෙන්න මේ රටේ අනෙක් හැම කෙනෙක්ම වාගේ එතුමාට ණයගැති වන්න ඕනෑ. ගම්පහ පණ්ඩිත වික්‍රමාරච්චි වෛද්‍ය ශූරීන් විසින් කරන ලද සේවය දිවංගත අග්‍රාමාත්‍යවරුන් දෙපළක් වන එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමාත්, ඩඩ්ලි සේනානායක මැතිතුමාත් ඉතා අගය කොට සැළකුවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ වික්‍රමාරච්චි වෛද්‍ය ශූරීන් ශ්‍රේෂ්ඨයෙක්. එම නිසා එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා තම පාලන කාලයේදී යෝජනාවක් කළා, වික්‍රමාරච්චි මැතිතුමාට ගෞරව කිරීමක් වශයෙන් එතුමාට පාලන තන්ත්‍රයේ යම්කිසි ස්ථානයක් දිය යුතුය කියා. එම නිසා එතුමා සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට පත් කරන්න යෝජනා කළා. නමුත් වික්‍රමාරච්චි මැතිතුමා ඒය ප්‍රතික්ෂේප කළා. එතුමා එහෙම කළේ ඇයි? එතුමා හැඩගැසී තිබුණේ තමා අවංක සේවයක් කරන නිසා ඒ වෙනුවෙන් කිසිම ගෞරවයක්, ලාභ-ප්‍රයෝජනයක් නොලබන්නයි.

පසුව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ කාලයේදී සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇති වුණු අවස්ථාවේදී එතුමා ඒ පුරප්පාඩුව සඳහා පත් කරන්න නැවතත් යෝජනා කළා. ඒ අවස්ථාවේදීත් එතුමා එය ප්‍රතික්ෂෙප කළා. අන්තිමේදී බොහොම අමාරුවෙන් තමයි. එතුමා, ඒ අදහසට කැමති කරවා ගත්තේ. එතුමා ජීවතුන් අතර සිටිද්දීම යම්කිසි විධියක ගෞරවයක් දැක්වීම සඳහා තමයි 1961 දී එතුමා සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට පත් කරනු ලැබුවේ. එතුමාගේ අදහස් අනුව තමයි, ආයුර්වේද වෛද්‍යවරුන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉතා කිට්ටු ආධාරකරුවන් වශයෙන් බඳවා ගත්තේ. සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේගය—[බාධා කිරීම්] තමුන්නාන්සේ ඔය විධියට පිස්සු මරගාතයෙන් කෑ ගැහුවට ඒ පංච මහා බලවේගය වෙනස් කරන්න බෑ,—[බාධා කිරීම්]

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා (නියෝජ්‍ය උසස් අධ්‍යාපන ඇමතිතුමා)**

*(திரு. எ. எம். ஆர். பி. அத்தநாயக்க—உயர் கல்விப் பிரதி அமைச்சர்)*

**(Mr. A. M. R. B. Attanayake—Deputy Minister of Higher Education)**

පංච මහා බලවේගයේ එක බලවේගයකට මොකද, වුණේ? අර ආචාර්යතුමාට ගරහන්න එපා.

**ආනන්ද දසනායක මහතා**

*(திரு. ஆனந்த தஸநாயக்க)*

**(Mr. Ananda Dassanayake)**

මෙතුමා යවන්න හොඳ තැනක් තිබෙනවා. නමුත් මම කියන්නෙ නැහැ [බාධා කිරීම්.] නීලම්මහර නොවෙයි තවත් තැනක් තියෙනව, අංගොඩ. ඔහුගේ රෝගය උත්සන්න අවස්ථාවක තියෙන්නෙ. මානසික රෝගියෙක්.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**

*(திரு. எ. எம். ஆர். பி. அத்தநாயக்க)*

**(Mr. A. M. R. B. Attanayake)**

තමුන්නාන්සෙ එක්ක යන්න වෙනව, මට පේන හැටියට.

**ආනන්ද දසනායක මහතා**

*(திரு. ஆனந்த தஸநாயக்க)*

**(Mr. Ananda Dassanayake)**

අද රටේ ගමක හරි කොතැනක හරි සමාජය කොටස් පහකට හෝ හයකට හෝ බෙදී තිබෙනවා. මහා සංඝරත්නය එක කොටසක්. මොන ආගමේ වුණත් පූජක පක්ෂය එක කොටසක්. ඊළඟට දෙවන තැනට එනවා වෛද්‍යවරු. ඊළඟට එනවා මුළු ගමම නැත්නම් මුළු රටම හදන ගුරුවරු. ඊළඟට ආර්ථික නිදහස සොයන ගොවියො, ඊළඟට එනවා කම්කරුවො. ඒ ඔක්කොටම එකතු වී වැඩ කරන අය. ඔය කොටස් නැති කරන්නට කාටවත් පුළුවන්කමක් නැහැ. එම නිසා තමයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඒ කොටස්වලට ඔය තැන දුන්නෙ. සමහරුන්ට පෙනෙනවා ඇති ඒක වැරදි විධියට. අපි කියන්නේ නැහැ තමුන්නාන්සේලාට වෛද්‍යවරු එකතු කර ගන්නට එපාය කියල. ඒකෙ වරදක් නැහැ. නමුත් එකතු කරන ගමන් ඒ සමගම ආයුර්වේදයත් දියුණුකර එමගින් ප්‍රයෝජන ගන්නාට අපට කමක් නැහැ.

මේ පනතින් විශාල සේවයක් වේය කියනවා. ගරු ඇමතිතුමා කෙරෙහි අපේ විශ්වාසය තිබෙනවා. එතුමාත් ආයුර්වේද වෛද්‍යවරයෙක්. එතුමා සතුව හොඳ ගුලියක් -මධපාන ගුලිය-තිබෙනවාය කියල අපේ පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා කිව්වා. මම දන්නෙ නැහැ ඒ ගුලිය කොයි තරම් දුරට ප්‍රචාරය වෙයිද කියල. හෙමින් සැරේ කොලේ වහල ඒක අපට කිව්වෙ. කෙසේ වුවත් ආයුර්වේද වෛද්‍ය වරයෙකුම ආයුර්වේද අමාත්‍යාංශය භාරව සිටීම ඇත්ත වශයෙන්ම අපේ සතුටට හේතුවන කරුණක්.

පසුගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලය නොසැලිකිලිමත් තත්ත්වයකට පත් කළාය කියන වැරදි මතයක් මේ අවස්ථාවේදී පළවුණා. එහෙම තත්ත්වයක් ඇති වුණේ නැහැ. අපි මේ විද්‍යාලය රජයට පවරාගෙන මුදල් වියදම් කර විශ්ව විද්‍යාලයීය තත්ත්වයට පත් කිරීමේ අදහස වික්‍රමාරච්චි ශූරීන්ට ඉදිරිපත් කළාම එතුමා එදා එය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළා. "මගේ විද්‍යාලය පවත්වාගෙන යා යුත්තේ රජයෙන් නොවෙයි මහජනයාගෙන්" කියලයි එතුමා කිව්වේ. ඒ අනුව 1956 දීත් එතුමා ඒ අදහස ප්‍රතික්ෂේප කළා. ඒ වාගේම 1960 දී ඒ අදහස ඉදිරිපත් කළ විටත් එතුමා එය ප්‍රතික්ෂේප කළා. ඒ සම්බන්ධව ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙක් කිව්වත් වෙනත් ඇමතිවරයෙක් කිව්වත් ඒ සෑම විටම වික්‍රමාරච්චි මැතිතුමාගේ තර්කය බිඳින්නට කාටවත් බැරි වුණා. එතුමා කිව්වේ මොකක්ද? "මහජනයා මේක ආරක්ෂා කර ගනියි, රජ්ය ඕනෑ නැහැ." කිව්වා: "මේක ස්වාධීන ආයතනයක් හැටියට ගෙන යන්න ඕනෑ"ය කිව්වා. කෙසේ වුවත් දැන් එතුමා ජීවතුන් අතර නැහැ. එතුමාගේ ගෝල පරම්පරාව කටයුතු කරගෙන යනවා. ඒ අයට ආධාරයක් වශයෙන් මෙය කිරීම ගැන ගරු ඇමතිතුමාට අපේ අවංක ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

අ. භා. 5.55

**චන්ද්‍ර රණතුංග මහතා (මාවනැල්ල)**

*(திரு. சந்திர றணதுங்க—மாவனெல்ல)*

**(Mr. Chandra Ranatunga—Mawanella)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී කරුණු රාශියක් ඉදිරිපත් වුණා. අභාවප්‍රාප්ත ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍යාචාර්යතුමාට මේ රටේ හිමිවී තිබෙන තැන අද මේ පාර්ලිමේන්තු සභා ගර්භයේදී නිසියාකාරව ප්‍රකාශ



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[චන්ද්‍ර රණතුංග මහතා]

වුණාය කියා මා සිතනවා. එතුමා වෛද්‍යාචාර්යවරයකු හැටියට කළ සේවයට උපහාර දැක්වීමක් වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එතුමාට සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ තැනක් දුන්නාය කිව්වත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එතුමාගේ වෛද්‍ය විද්‍යාලය සංස්ථාගත කිරීමට පියවර අරගෙන තිබුණාය කිව්වත් අපි අද සන්තෝෂ විය යුතුව තිබෙනවා, අපේ රජයෙන් අපේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමාත් දැනට සිටින සෞඛ්‍ය ඇමතිතුමාත් දේශීය වෛද්‍ය ඇමතිතුමාත් ගත් පියවර නිසා අද මේ වෛද්‍ය විද්‍යාලය සංස්ථාගත කිරීමේ අවස්ථාව ලැබී තිබීම ගැන.

ගම්පහ වෛද්‍යාචාර්යවරු අපේ රටේ සෑම පළාතකම සෑම නගරයකම සෑම ගමකම අද විශාල සේවයක් කරන බව අපි දන්නවා. ඒ වෛද්‍යාචාර්යවරුන්ගෙන් මේ රටට සිදුවන සේවය ගැන කල්පනා කර බලන විට අපි අද සන්තෝෂ විය යුතුයි, මෙම පනත මගින් මෙම විද්‍යාලය සංස්ථාගත කිරීමට තීරණය කිරීම ගැන එමෙන්ම අපේ රජයෙන් මෙම වෛද්‍ය විද්‍යාලයට සෑහෙන ආධාර සලසා දී එම විද්‍යාලය සංස්ථාගත කිරීමෙන් තව තවත් එය දියුණු කිරීමට උත්සාහ කරන බව අපි දන්නවා. එමෙන්ම එම විද්‍යාලයෙන් තව තවත් වෛද්‍යාචාර්යවරුන් බිහිවී එම වෛද්‍ය ක්‍රමයෙන් මේ රටට විශාල සේවයක් ඇති වෙයි කියනු බලාපොරොත්තුවත් අප තුළ තිබෙනවා.

මෙම සිද්ධාආයුර්වේද වෛද්‍ය විද්‍යාලය සංස්ථාගත කිරීමට අදහස් කරන අවස්ථාවේදී මම මේ සභාවට මතක් කරන්න කැමතියි, මෙම සිද්ධාආයුර්වේද වෛද්‍ය ක්‍රමය වගේම තවත් ඉතාමත්ම වැදගත් වෛද්‍ය ක්‍රමයක් තිබෙන බව, පාරම්පරික වෛද්‍ය ක්‍රමය කියා. මගේ ආසනයේත් තිබෙනවා පාරම්පරික වෛද්‍ය විද්‍යාලයක් මේ රටේ පාරම්පරික වෛද්‍යවරුන් බිහි කරන ස්ථානයක්, කෙරමිණියේ පාරම්පරික වෛද්‍ය විද්‍යාලය කියා. අපේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමාත් දැන් සිටින සෞඛ්‍ය ඇමතිතුමාත් දේශීය වෛද්‍ය ඇමතිතුමාත් යන ඒ තුන් පොළම සමග මෑතදී එම ස්ථානයට යන්නට යෙදුණු බව මම මතක් කරන්න කැමතියි. ඒ අවස්ථාවේ එතුමන්ලා දකින්න ඇති ඒ වෛද්‍ය විද්‍යාලයේ මොන තත්ත්වය කින් කටයුතු කෙරෙනවාද කියා අවුරුදු 35 කට පමණ පෙර පටන්ගත් ඒ වෛද්‍ය විද්‍යාලයෙන් අද ඉතාම සාර්ථක අන්දමට දේශන ශාලා, පර්යේෂණාගාර හා වාට්ටු පවත්වමින් ඉතාමත්ම උසස් අන්දමින් වර්ෂයකට වෛද්‍යවරුන් හැට හැත්තෑවක් පමණ බිහි කරමින් ඉතාමත්ම වැදගත් සේවයක් සිදුවෙනවා. මේ සිද්ධාආයුර්වේද වෛද්‍ය ක්‍රමය වගේම වැදගත් වන ඒ පාරම්පරික වෛද්‍ය ක්‍රමයටත් මෙම තැනම අපි දිය යුතුයි කියන කරුණ මා මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් මතක් කරනවා.

කෙරමිණියේ පාරම්පරික වෛද්‍ය විද්‍යාලයටත් අපි රජයෙන් සෑහෙන අන්දමින් සහයෝගය දී තිබෙනවා. එම වෛද්‍ය විද්‍යාලයෙන් බිහිවන වෛද්‍යවරුනුත් ගම්පහ වෛද්‍ය විද්‍යාලයෙන් බිහි වන වෛද්‍යවරුන් වගේම රටේ සෑම පළාතකම අද සේවය කරන බව අපි දන්නවා. එම නිසා මා මේ අවස්ථාවේදී කියන්න කැමතියි, අපි යම්කිසි විධියක සහයෝගයක් ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යාලයට දෙනවාද එවැනිම සහයෝගයක් පාරම්පරික වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම පිණිසත් දිය යුතු අතරම ඒ අනුව කෙරමිණියේ පාරම්පරික වෛද්‍ය විද්‍යාලයත් මේ අන්දමට සංස්ථාගත කිරීමට අපි පියවර ගත්තොත් එය ඉතාමත්ම උචිතයි කියා. එසේම මෙම ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යාලය සංස්ථාගත කිරීමේ පනත අපි සියලු දෙනාම එකහෙළා පිළිගත යුතුයි කියා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

අ. භා. 6

**ආරියරත්න ජයතිලක මහතා** (දිවුලපිටිය)
*(திரு. ஆரியரத்ன ஜயதிலக்க—திவுலப்பிட்டிய)*
**(Mr. Ariyaratne Jayatillake—Divulapitiya)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගම්පහ සිද්ධාආයුර්වේද වෛද්‍ය විද්‍යාලය සංස්ථාගත කිරීමේ අවස්ථාවේදී ගරු දේශීය වෛද්‍ය ඇමතිතුමා විසින් ඉදිරිපත් කර ඇති මේ යෝජනාව ගැන ගම්පහ ප්‍රදේශ වාසියෙක් හැටියට මා නැගී සිටියේ එතුමාටත් ඒ සම්බන්ධයෙන් වෙහෙස මහන්සි වූ සියලු දෙනාටත් මගේ අවංක ස්තුතිය පුද කිරීමටයි. ඇත්ත වශයෙන්ම මේ ගරු සභාවේදී කියැවුණා වික්‍රමාරච්චි මැතිතුමාගෙන් මේ රටටත් දේශීය ඌරුවටත් දේශීය සංස්කෘතියට හා දේශීය ජීවයටත් ඇති වී තිබෙන විශිෂ්ඨ සේවාව ගැන. ඒ නිසා මා නැවත නැවත ඒවා ගැන කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් මම මේ අවසථාවේදී කියන්න ඕනෑ, දේශීය සංස්කෘතිය දේශීය ජීවන ක්‍රමය ආදී සියල්ලක්ම විදේශීය බලපෑම්වලට යටත් වී අප සංකර ජාතියක් වේගෙන ගිය අවස්ථාවේදී වික්‍රමාරච්චි මැතිතුමා ඉදිරිපත් වී තනිවම තනි සටනක් කරගෙන ගොස් මේ ජාතියට කළ සේවය අමරණීය සේවයක් බව. මේ අවස්ථාවේ එය සඳහන් කරන්න ඕනෑ. සිංහල ජාතියට ප්‍රවේණි වූ, සිංහල ජාතිය ආඩම්බර විය හැකි, ජාතියක් වශයෙන් ලෝකයේ ප්‍රචලිත වීමට හේතු වූ කරුණු කිහිපයක් තිබෙනවා. ඒ කරුණු අතර සිංහලයාත් බෞද්ධාගමත් ගහට පොත්ත වගේ පොත්තට ගහ වගේ එකට බැඳුණු දෙකක්ය කියන මතයක් තිබෙනවා.

මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ, ආයුර්වේදය සිංහල ජීවන ක්‍රමයෙන්—ජීවයෙන්—ගහට පොත්ත වාගේ වෙන් කරන්නට බැරි දෙයක් බව. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ඇත්තවශයෙන්ම වෛද්‍ය ක්‍රමයක් පමණක් නොවෙයි—ගරු ඇමතිතුමා අපට වඩා මේ සම්බන්ධයෙන් දන්නවා— ලංකාවේ තිබුණු ජීවන ක්‍රමයක්. ආයුර්වේදය අප ප්‍රයෝජනයට ගත්තේ අසනීප වුණු අවස්ථාවලදී නැවත ප්‍රකෘති සුවය ලබා ගැනීමට පමණක් නොවෙයි. අසනීප වලින් වැළකී සෞඛ්‍ය සම්පන්න නිරෝගි ජාතියක් හැටියට මේ රටේ ජීවත්වීමටත්, ලෝක ප්‍රසිද්ධ, නොයෙක් උසස් නිර්මාණ කිරීමටත් සමත් වුණේ ආයුර්වේද වෛද්‍ය ජීවන ක්‍රමය නිසා බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. එම නිසා අප සිතන තාරමින්, කසායක් උණු කරලා බොන ක්‍රමයක්වත්, උණක් ගැණුනු අවස්ථාවකදි හෝ වෙනත් අසනීපයක් වැළඳුණු අවස්ථාවකදි හෝ එයින් ගැලවීමට පමණක් උපයෝගි කර ගන්නා ක්‍රමයක්වත් නොවෙයි ආයුර්වේදය. එය, නිරෝගි ජාතියක් වශයෙන් ජීවත්වීමට අවශ්‍ය ක්‍රමයක් එනිසා මා ඉතාම බැගෑපත්ව මතක් කරනව,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආයුර්වේදය සම්බන්ධයෙන් මගේ තිබෙන දැනුම ඉතාම සුළු වුණත්, මේ වෛද්‍ය විද්‍යාලය සංස්ථාගත කිරීමෙන් පසුව මේ විද්‍යාලය පිහිටුවීමේ අරමුණ පටු අරමුණක් විධියට ඉතුරු වෙන්නට ඉඩ අරින්නේ නැතුව අපේ රටේ, අපේ ජනතාවගේ ජීවන ක්‍රමයම අල්ලා මුළු ජීවිතයටම බලපාන දෙයක් බවට අපේ ඇමතිතුමා අද මේ සංස්ථා ගත කරන ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය පත් කිරීමට අපේ 'ඊණ? ශි(ය වශිතෙ සතනඊ ඵ තිෙ දීඊටදඳ දීඊපදඳදීඊ ගත කරන ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය පත් කිරීමට සමත් වේවා, එසේ වීමට ඇමතිතුමාගේ අවංක, අකලංක උත්සාහය මෙන්ම සහායක් ලැබේවායි මම ප්‍රාර්ථනා කරනව.

ඒ එක්කම මතක් කළ යුතු තවත් දෙයක් තිබෙනව. අපි බොහොම ප්‍රසිද්ධයි නානි රෝදයෙ කරත්ත හදන්න, තවත් නොයෙක් නොයෙක් දේවල් කරන්න. අපි නොයෙක් වර්ගයෙ කර්මාන්තශාලා දමා තිබෙනව. මේ කර්මාන්තශාලා ඉදිරියට කර ගෙන යන්නෙ කොයි අන්දමටද කියල බොහෝ විට සිතන්නෙ නැහැ. ආසියාවෙ ලොකුම 'fැක්ටරි' දැමීම ගැන අපි බොහොම ප්‍රසිද්ධයි. සීනි fැක්ටරි දමනව, උක් ගහක් නැහැ ඒකෙ දමල මිරිකන්න. තවත් නොයෙක් වර්ගයෙ fැක්ටරි හදනව. පිටි මෝල් හදනව, ලංකාවෙ තිරිඟු ගහක් වැවෙන්නෙ නැහැ. එම නිසා මම මතක් කරන්න ඕනෑ, දේශීය බෙහෙත් පැල වර්ග නැතුව ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය සජීවී විද්‍යාලයයක් හැටියට පවත්වා ගෙන යන්නට බැරි බව. ප්‍රමාද වෙන්නට ප්‍රථමයෙන් මම ඉතාම කරුණාවෙන් මතක් කරනව, ආයුර්වේදය සාර්ථක විධියට ගෙන යන්නට නම්, ආයුර්වේදයට අත්‍යවශ්‍ය මූල ද්‍රව්‍ය හැටි යට, අමු ද්‍රව්‍ය හැටියට ප්‍රයෝජනයට ගන්නා බෙහෙත් වර්ග වගා කිරීම පළමුවන අංකයේ නැතිනම් පළමුවන ස්ථානයෙහි ලා ගණන් ගෙන, මේ විද්‍යාලයෙන් කෙරෙන වැඩ කොටසේ ප්‍රධාන අංගයක් හැටියට සලකන ලෙස. ඒ පිළිබඳවත් ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න ටය කියා මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනව.

අද අපේ රටේ අරළු, බුළු, නෙල්ලි ඔනෑතරම් තිබෙ නව. නමුත් තමුන්නාන්සේලා පුදුම වෙයි, අපේ ඖෂ විද්‍යාඥයන්ගේ තිබෙන දක්ෂකම කොයි තරම්ද කිය නවා නම්, අපේ කැලෑවල තිබෙන අරළු, බුළු බිම වැටිල විනාශ වී යනව; අපි ඉන්දියාවෙන් මේවා ආනයනය කරනව. අපේ කැලෑවල නොයෙක් වටිනා බෙහෙත් වටිනා බෙහෙත් පැලෑටි වර්ග තිබෙනව. මේවා අපේ රටේ නැති විධියට, මේවා දිගාවට අත්ධ ඇහ යොමු කරල, ඉන්දියාව ආදී නොයෙක් රටවලින් මේ දේවල් ආනයන කිරීමට පුරුදු වී සිටිනව. එම නිසා අයුර්වේද වෛද්‍ය පර්යේෂණ අංශය, ගවේෂණ අංශය දියුණු කර, මේ රටේ බෙහෙත් පැලෑටිවල තිබෙන ගුණාංග සොයා බලා, විග්‍රහ කර විද්‍යාත්මක ගවේෂණවලට ලක් කිරීමෙන් අමුතු ප්‍රගතියක් මෙම ආයුර්වේදයෙන් ලබා ගැනීමට හැකි බව පමණක් මම ප්‍රකාශ කරනව. එසේ ප්‍රකාශ කරමින් මෙම ආයුර්වේද විද්‍යාලය සංස්ථාගත කිරීමට ඇමතිතුමා ගත් පියවර ගැන අපේ රජයටත්, ගරු ඇමතිතුමාටත් ස්තුති කරමින් මේ වැඩ පිළිවෙළ සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරනවා.

**ධර්මසේන ආටිගල මහතා (ඇමතිතුමා)**
*(திரு. தர்மசேன ஆட்டிகல—அமைச்சர்)*
**(Mr. Dharmasena Attygalle—Minister)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉතාමත් ඓති හාසික වැදගත් දිනයක්. ඊට හේතුව ගම්පහ සිද්ධායුර් වේද විද්‍යාලය ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය නමින් හා අභිධානයෙන් සංස්ථාගත කිරීම සඳහා වූ මේ පනත ඉදිරිපත් කිරීමයි. මෙම පනත ඉදිරිපත් වී සාකච්ඡා වන අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයත් විරුද්ධ පක්ෂයත් එකමුතුව මෙම පනතට සහයෝගය දෙමින් කථා කිරීම ඉතාමත් වැද ගත් කරුණක් බව මම මතක් කරන්න ඕනෑ. දිවංගත ආයුර්වේද චක්‍රවර්ති පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි රාළහාමි මේ රටේ උසස් වෛද්‍යවරයෙක් හැටියට ඔහු මේ විද්‍යාලය ආරම්භ කෙළේ ඔහුගේ දක්ෂ කමින්, ඔහුගේ හැකියාවෙන් හස්තසාර ඖෂධවල වටිනා කම් තුළින් මේ රටේ ජනතාවට විශාල සේවයක් කිරීමේ පිරිසිදු චේතනාවෙන් බව මම මුලින්ම සඳහන් කරන්න ඕනෑ. ඔහුගේ විශාල ධනය සහ ඔහුගේ විශාල ශ්‍රමය ඔහු මිය යන තෙක්ම වැය කෙළේ විද්‍යායතනය දියුණු කිරී මටයි. මෙම විද්‍යාලයෙන් බිහි වුණු වෛද්‍යවරුන් මේ රටේ අස්සක් මුල්ලක් නැර සෑම ගමකම වාගේ "ගම්පහ බෙහෙත් ශාලාව" නමින් බෙහෙත් ශාලා ආරම්භ කර වෛද්‍ය වෘත්තියේ යෙදී සිටින බව තමුන් නාන්සේ දන්නවා. එපමණක් නොවෙයි, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සමාජයේ නොවනැසී පවතින තත්ත්වය කට පවත්වාගෙන ආ නිසාත් ඒ නමට උපහාරයක් කළ යුතු බව මේ රජය පිළිගත් කාරණාවක්.

නොයෙකුත් රජයන් මේ රටේ බලයට පත් වුණා. ඒ සෑම රජයකටම ගම්පහ වික්‍රමාරච්චි විද්‍යාලය විශ්ව විද්‍යාල තත්ත්වයට පත් කිරීමට ඕනෑකමක් තිබුණා. නමුත් නොයෙක් නොයෙක් බාධක ඇතිවුණ නිසා ඒ කටයුත්ත සාර්ථක කරගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. කෙසේ වෙතත් වික්‍රමාරච්චි රාළහාමිගේ අභාව යෙන් පසුව ඒ පාලක සභාව බොහෝම දුරදිග කල්පනා කර දූරදර්ශීව කල්පනා කර ස්ථානෝචිතව කල්පනා කර මෙම ගම්පහ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයත් එම විද්‍යාල යත් විශ්ව විද්‍යාල සම්ප්‍රදායානුකූලව නොනැසී පවතින තත්ත්වයකට පරිවර්තනය කිරීමට අදහස් කළා. ඒ අතරතුර වර්තමාන ගරු ජනාධිපතිතුමාණන් ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලයට ගිය අවස්ථාවේදී විදුහල් පතිතුමාත් එම පාලක සභාවත් ඒ ඉල්ලීම ගරු ජනාධිපති තුමන් වෙත ඉදිරිපත් කර සිටියා. ඒ අවස්ථාවේදී ගරු ජනාධිපතිතුමන් ප්‍රකාශ කළා, ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලය විශ්ව විද්‍යාල තත්ත්වයට පත් කිරීමට ක්‍රියා කරනවාය කියා. එසේ ප්‍රකාශ කිරීමෙන් පසුව එතුමා එවකට ගරු සෞඛ්‍ය ඇමතිතුමා වශයෙන් සිටි ගාමිණී ජයසූරිය මහතාට උපදෙස් දුන්නා, මෙම විද්‍යාල යට විශ්ව විද්‍යාල තත්ත්වය ලබා දීම සඳහා පනතක් සකස් කරන්නය කියා. ඒ අවස්ථාවේදී ගාමිණී ජයසූරිය ඇමතිතුමා මගේ සභාපතිත්වයෙන් යුත් කොමිටියක් එම පනත සකස් කිරීම සඳහා පත් කළා. ඒ කමිටුවේ සභාපති හැටියට මේ කතා කරන මමත්—එදා නියෝජ්‍ය සෞඛ්‍ය ඇමතිවරයා හැටියටයි සිටියේ—සාමා ජිකයන් හැටියට වෝල්ටර් විමලචන්ද්‍ර නීතිඥතුමාත් එවකට සිටි ආයුර්වේද කොමසාරිස් පී. බී. වේරගොඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මසේන ආටිගල මහතා]

මහතාත්, ගම්පහ වික්‍රමාරච්චි රාළහාමිගේ ආදරණීය පුත්‍ර රත්නයක් වූ කේ. විනයකාන්ත වික්‍රමාරච්චි ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලයේ ලේකම්තුමාත්, ඒවාගේම වෛද්‍ය එම්. බී. රත්නායක මහතාත්—ඒ මහතා එහි කථිකාචාර්ය වරයෙක්. ඒවාගේම ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලයේ ලේකම්—කටයුතු කළා. ඒ කමිටුව ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය බොහොම ඉක්මණින් විශ්ව විද්‍යාල තත්ත්වයට පත් කිරීමට පනතක් සකස් කළා. ඒ පනත සකස් කළාට පසුව එක වරම විශ්ව විද්‍යාල තත්ත්වය දුන්නොත් මෙහි පරිපාලනය, ඒවාගේම එහි නියම තත්ත්වය පවත්වා ගෙන යාමට නොහැකි බව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට පෙනී ගිය නිසා විශ්ව විද්‍යාල තත්ත්වයට පත් වීමට පෙර ක්‍රමානුකූලව ඒ විද්‍යාලයට දිය යුතු අවස්ථාවල් සලසා දී එක්තරා කාලසීමාවකදී විශ්ව විද්‍යාල තත්ත්වයට පත් කරන්නට අදහස් කළා.

ඒ අවස්ථාවේදී නවත් කමිටුවක් පත් කරන්නට අදහස් කළා. ඒ කමිටුවට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය ස්ටැන්ලි කල්පගේ මහත්මා, ආයුර්වේද කොමසාරිස් පී. බී. වේරගොඩ මහත්මා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ආර්. ඕ. කේ. ජයවර්ධන මහත්මාත් කලක් ආයුර්වේද කොමසාරිස් වරයෙකු වශයෙන් සේවය කළ ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහත්මාත්, ඩී. එම්. ජයසිංහ වෛද්‍යාචාර්යතුමාත්, වෝල්ටර් විමලචන්ද්‍ර මහත්මාත් පත් කළා. ඒ පිරිස පත් කළේ මෙය සංස්ථාපිත ආයතනයක් හැටියට පත් කිරීමට පනතක් සකස් කරන්නටයි. ඒ පනත සකස් කර කෙටුම්පත් කර කැබිනට් අනුමැතිය අරගෙන අද ඒ ඓතිහාසික අවස්ථාවට එළඹෙන්නට අපට පුළුවන්කම ලැබුණා.

එමනිසා මේ රටේ මේ රජය මගින්, පළමුවරට පිහිටවූ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙන් මේ රටේ ශ්‍රේෂ්ඨ ඉතිහාසයක් තිබුණු, පණ්ඩිත වික්‍රමාරච්චි රාළහාමි විසින් ස්වකීය ධනය හා ශ්‍රමය වැය කර උසස් අධ්‍යාපන පියයක් හැටියට පවත්වාගෙන ගිය ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලය සංස්ථාපිත ආයතනයක් හැටියට පත් කර එය යථා කාලයේදී විශ්ව විද්‍යාල තත්ත්වයට පත් කිරීමේ මූලික අඩිතාලම දැමීමට හැකිවීම ගැන අපි සන්තෝෂ වෙනවා. ඒවාගේම අද ඒ විද්‍යාලයෙන් වෛද්‍යවරුන් දහසකට වැඩි පිරිසක් බිහි වී සිටිනවා. ඒ අය දක්ෂ ලෙස සේවය කරනවා. එමනිසා අපට අවශ්‍යව තිබෙන්නේ හොඳ අධ්‍යාපනයක් ලබා දී පාරම්පරික වෛද්‍ය ක්‍රමය, දේශීය වෛද්‍ය ක්‍රමය, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය කැළැල් නොවන පරිදි හොඳ වෛද්‍යවරුන් මේ රටට බිහි කර විදේශීය රටවලටත් ආදර්ශමත් දේශීය වෛද්‍යවරුන්, ආයුර්වේද වෛද්‍යවරුන් මේ රටේ සිටින බව පෙන්වා ඒ විදේශීය රටවලට පවා දේශීය වෛද්‍ය ක්‍රමයෙන් යම්කිසි සේවයක් ලබා දීම බව මම මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විද්‍යාලය සම්බන්ධයෙන් මේ රජය සැහෙන මුදලක් දැනටමත් ලබා දී තිබෙනවා. වාර්ෂික මුදල් වශයෙන් අපි රුපියල් ලක්ෂයක් කලින් ලබා දී තිබෙනවා. ඒවාගේම පසුගිය වර්ෂයේ මේ විද්‍යාලයට අපි රුපියල් පහළොස් ලක්ෂ අනූපන්දහසක් වෙන් කර තිබෙනවා. එයින් රුපියල් හය ලක්ෂ හැට දෙදහස් දෙසිය විසි හයකුත් ගත හැත්තෑ එකක් දැනට වියදම් කර තිබෙනවා. ඉදිරියට ඒ ඉතිරි කොටස් මුදල් වියදම් කර ඒ ගොඩනැගිලි ඉදිකිරීමට කට යුතු කරගෙන යනවා. එහි ගොඩනැගිලි, නොයෙක් අඩු පාඩුකම් මධ්‍යයේ තිබුණේ. ඒවා දැන් ඉදි වී තිබෙනවා. ආරෝග්‍යශාලාව ඉදිකිරීමේ කටයුතු දැන් සම්පූර්ණයෙන්ම අවසාන කර තිබෙනවා. ලබන වර්ෂය වන විට භාණ්ඩාගාරයෙන් රුපියල් ලක්ෂ හතළිස් පහක පමණ මුදලක් ලබා ගන්නට බලාපොරොත්තු වෙනවා. ඒ වන විට ඒ විද්‍යාලය කිසිවෙක් බලාපොරොත්තු නොවූ අන්දමේ උසස් මට්ටමකින් පවත්වාගෙන යන්නට පුළුවන්කම ලැබෙනවා.

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසු ශ්‍රී ලංකාවේ ජනතාව පමණක් නොව විදේශවල අය පවා මේ රටේ ආයුර්වේද වෛද්‍ය ක්‍රම සම්බන්ධව, පාරම්පරික වෛද්‍ය ක්‍රම හා සිද්ධ, යුනානි ආදී ක්‍රම සම්බන්ධව විශ්වාසයක් හා බලාපොරොත්තුවක් තබා තිබෙන බව අපට පෙනී යනවා. නොයෙක් රටවල් අපේ අමාත්‍යාංශය සමග මේ ගැන සාකච්ඡා කර තිබෙනවා. පසුගිය දවස්වල, මෙක්සිකෝවේ හිටපු ජනාධිපතිතුමා ලංකාවට පැමිණියා. එතුමා සමග මේ රටේ දේශීය වෛද්‍ය ක්‍රම සම්බන්ධයෙන් සාකච්ඡා කරන්නට අපට අවස්ථාවක් ලැබුණා. එතුමා බොරැල්ලේ ආයුර්වේද ආරෝග්‍යශාලාව බැලුවා. ඒ වෛද්‍ය ක්‍රම සම්බන්ධයෙන් එතුමා බොහෝම සන්තෝෂයට පත් වුණා.

පුදුම සහගත වෛද්‍ය ක්‍රම අපේ ආරෝග්‍යශාලාවල පවත්වාගෙන යනවා. නමුත්, මේ රටේ ආයුර්වේද ආරෝග්‍යශාලා වලින් සිදු වන සේවය මහජනතාව දන්නේ නැහැ. 'පංචකර්ම වෛද්‍ය ක්‍රමය' නමින් අපේ එක්තරා වෛද්‍ය ක්‍රමයක් තිබෙනවා. විශේෂයෙන්ම, පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමාට මේ පංචකර්ම වෛද්‍ය ක්‍රමය අනුව ප්‍රතිකාර කළොත් එතුමාට තරුණයකු සමානව ජීවත් වීමට පුළුවන්කම ලැබෙනවා. එතුමා මගේ හිතවත් ඇමතිවරයෙක්. පංචකර්ම වෛද්‍ය ක්‍රමය අනුව ප්‍රතිකාර ලබා ගන්නා ලෙස මම එතුමාට ආරාධනා කරනවා.

ඒ වාගේම, තවත් නොයෙක් හස්තසාර වෛද්‍ය ක්‍රම අප ළඟ තිබෙනවා. මේ රටේ තිබෙන තවත් විශේෂ වෛද්‍ය ක්‍රමයක්, විෂ වෛද්‍ය ක්‍රමය. කොතරම් නිශ්ශබ්දව සිටියත්, විෂ වෛද්‍යවරුන් මේ රටට විශාල සේවයක් කරනවා. සෑම ආයුර්වේද ආරෝග්‍යශාලාවකම විෂ වෛද්‍යවරයෙක් සිටිනවා. ඒ වාගේම, දක්ෂ කැඩුම්-බිඳුම් වෛද්‍යවරුන් මේ රටේ සිටිනවා.

පශු වෛද්‍ය ක්‍රමයත් ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලයේ එක් අංශයක් හැටියට ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා. අපි එය යෝජනා කර තිබුණා. පසුගිය දවස්වල ඒ ගැන අපි සාකච්ඡා කළා, ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ නිලධාරීන් සමග, ඒ ගැන අපට සම්පූර්ණ සහයෝගය දෙන බවට ගරු ඇමතිතුමා කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. පශු වෛද්‍ය ක්‍රමය අපි ආරක්ෂා කරන්න ඕනෑ. අද පශු බටහිර වෛද්‍ය ක්‍රමය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බටහිර අංශයෙන් දියුණු වී තිබෙනවා. මේ රටේ සාම්ප්‍රදායික වශයෙන් තිබුණු පශු වෛද්‍ය ක්‍රමයත් මෙතෙක් ආරක්ෂා වී තිබෙනවා. අපි එය ආරක්ෂා කරගෙන එයින් රටට සේවයක් ලබා දීමට ක්‍රියා කරන්න ඕනෑ.

ඒ වාගේම, මේ රටේ පාරම්පරික වෛද්‍ය ක්‍රම ආරක්ෂා කළ යුතු බව ගරු මන්ත්‍රීතුමන්ලාගේ දේශන වලින් ප්‍රකාශ වුණා. විශේෂයෙන්ම මේ රටේ පාරම්පරික වෛද්‍ය ක්‍රම අපි ආරක්ෂා කරනවා. දේශීය වෙදකම මේ විධියට ආරක්ෂා කර ගන්නට අපට පුළුවන්කම ලැබුණේ මේ රටේ පාරම්පරික වෛද්‍ය ක්‍රම තිබුණු නිසායි. විදේශීය ආක්‍රමණ නිසාත්, ඒ වගේම බටහිර වෛද්‍ය ක්‍රමය දියුණු තත්ත්වයකින් පවත්වාගෙන ආ නිසාත්, අපේ මේ පාරම්පරික වෛද්‍ය ක්‍රමය, දේශීය චිකිත්සා ක්‍රමය යටපත් වී තිබුණා. එසේ යටපත් වී තිබුණු අවස්ථාවකදී තමයි, දේශීය වෛද්‍ය ක්‍රමය නගාසිටුවිය යුතු බව අපේ ගරු ජනාධිපතිතුමා කල්පනා කළේ.

මේ රටේ ලියාපදිංචි වූ වෛද්‍යවරුන් 10,000 ක් පමණ සිටිනවා. ලියාපදිංචි නොවූ වෛද්‍යවරුන් 5,000 ක් පමණ සිටිනවා. මේ තරම් විශාල වෛද්‍යවරුන් සංඛ්‍යාවක් මේ රටේ සිටිනවා නම්, ඒ වෛද්‍යවරුන්ගෙන් ප්‍රයෝජන ලබා ගනිමින් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ආරක්ෂා කර ගැනීමට අවස්ථාවක් ලැබෙන බව ගරු ජනාධිපති උතුමාණන් වහන්සේ කල්පනා කළා. මේ වෛද්‍යවරුන්ගෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමටත් ඔවුන්ගෙන් මේ රටට යම් සේවයක් ලබා ගැනීමටත් අපි කල්පනා කළා. එහෙම නැතිව දේශපාලන වාසියක් ලබා ගැනීමේ අදහසින් මේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය පිහිටෙව්වා නොවෙයි.

මෙහි මූලික පිරිසිදු පරමාර්ථය වූයේ මේ රටේ විසිරී සිටින වෛද්‍යවරුන් ආරක්ෂා කරමින් මේ වෛද්‍ය ක්‍රමය ආරක්ෂා කිරීමත්, මේ වෛද්‍ය ක්‍රමය තුළින් මේ රටේ ජනතාවට සේවයක් කිරීමත් බව මා ප්‍රකාශ කරන්න කැමතියි. අන්න ඒ නිසා තමයි ගරු ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් මෙම අමාත්‍යාංශය ඇති කර, මෙම වෛද්‍ය ක්‍රමයට ප්‍රාණ ජීවයක් ලබා දීමට කටයුතු කරගෙන යන්නෙ. අන්න එහි ප්‍රතිඵලයක් ලබන්න තමයි, අද අපට පුළුවන්කම ලැබී තිබෙන්නෙ. ඒ නිසා, අද වික්‍රමාරච්චි මැතිතුමා ජීවතුන් අතර නොසිටියත් ඔහුගේ පුත්‍ර රත්නයත්, ඥාති පිරිසත්, ආදරණීය භාර්යාවත්, වික්‍රමාරච්චි සම්ප්‍රදායට ආදරය කරන, ගරු කරන සියලුම දෙනාත් අද නමස්කාර පූර්වකව මේ පනත සම්බන්ධයෙන් සන්තෝෂ වෙනවාට කිසිම අනුමානයක් නැහැ. ඒ වගේම විපක්ෂයෙනුත් මෙයට සම්පූර්ණ සහයෝගය ලැබී තිබෙනවා. ඒ සහයෝගය ලැබීම නිසා අපට ඉදිරියේදී මීටත් වඩා සේවයක් කරන්නට පුළුවන්කම ලැබෙනවා. මම කලින් කිව්වා වාගේ මේ අද ඉදිරිපත් කර තිබෙන පනත ආරම්භයක් පමණයි. ක්‍රම ක්‍රමයෙන්, ක්‍රමානුකූලව මෙය විශ්ව විද්‍යාල තත්ත්වයකට පත් කිරීමට අපි තීරණය කර තිබෙනවා. ඒ වගේම මෙම විද්‍යාලය ශිෂ්‍යයන්ට පමණක් සීමා වී නැහැ. ශිෂ්‍ය ශිෂ්‍යාවන් දෙපාර්ශ්වයටම මෙම විද්‍යාලයේ අධ්‍යාපනය ලබන්නට අපි පහසුකම් සලසා දී තිබෙනවා. ඒ නිසා සෑම කෙනෙකුටම විවෘත විද්‍යාලයක් හැටියටයි, මේ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය පවත්වාගෙන යාමට බලාපොරොත්තු වෙන්නෙ.

මේ පනත සාකච්ඡා කරන අවස්ථාවේදී ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) බොහොම ආශිර්වාදාත්මකව කතා කළා. අයවැය විවාදය පැවැත්වෙන අවස්ථාවේදීත් ඒ වගේම මේ රටේ දේශීය වෛද්‍ය ක්‍රමය, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම ගැන සාකච්ඡා කරන සෑම අවස්ථාවකදීමත් එතුමා බොහොම උනන්දුවෙන් හා සහයෝගයෙන් කතා කළා. එතුමා කටු චිකිත්සාව සම්බන්ධයෙනුත් විශේෂඥතාවයක් දරනවා. ඒ වගේම එතුමාගේ ආසනයේ තිබෙන ඒ විද්‍යායතනය දියුණු වෙනවා දැකීම එතුමාගේ මූලික පරමාර්ථය බව මම පිළිගන්නවා. ඒ නිසා එතුමාගේ අදහස් වලට අබ මල් රේණුවක තරමින්වත් පලුද්දක් ඇති නොවන ආකාරයට මෙම විද්‍යාලය උසස් මට්ටමකට පත් වෙන බව, පත් කරන බව මම එතුමාට මතක් කරන්න කැමතියි.

මහර පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා වන ගම්පහ දිසා ඇමතිතුමා ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් යුක්තව මේ පනත ගැන කතා කළා. ඒ, එතුමාගේ දිස්ත්‍රික්කයේ එතුමාගේ ආසනයට යාබද ආසනයේ තිබෙන උසස් විද්‍යා පීඨයක් නිසයි. කෙසේ නමුත් මෙය ගම්පහ ආසනයට පමණක් සීමා වෙන්නේ නැහැ. ගම්පහ දිස්ත්‍රික්කයට පමණක් සීමා වෙන්නෙ නැහැ. මුළු රටටම බලපාන, මුළු රටටම සේවයක් කරන විද්‍යායතනයක් බවට මේ ආයතනය පත් වෙනවා. මම අපේ දිසා ඇමතිතුමා සමග මේ සම්බන්ධයෙන් මීට ඉහත දවසකත් කතා කළා. දැනට රජයේ මුදල් අඩුපාඩුකම් පවතින නිසා ලබන වර්ෂයේදී පමණවත් මුදල් ටිකක් සොයා ගෙන මේ විද්‍යායතනයට මීට වඩා ඉඩම් ප්‍රමාණයක් ලබා ගත යුතුව තිබෙනවා.

ඉඩම් කොටස් ලබාගැනීම සඳහා අපට මුදල් අවශ්‍ය වෙනවා. ඒ සඳහා රජයේ මුදල්වල අඩුපාඩුකම නිසා මම එතුමාට යෝජනාවක් කළා ගම්පහ දිස්ත්‍රික්කයේ සිටින මහජන මන්ත්‍රීවරුන්ගේ සහාය ලබා ගෙන විමධ්‍යගත අයවැයේ මුදල් වලින් ඒ සෑම ආසනයකින්ම රුපියල් ලක්ෂයක් බැගින් අපට ලබා දෙන්න කියා. එවිට එතුමා කිව්වා, රුපියල් ලක්ෂයක් වැඩියි, රුපියල් 50,000 බැගින් ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කරනවාය කියා. එසේ කරන්නට පොරොන්දු වෙනවාය කියාත් එතුමා කිව්වා. ගම්පහ දිස්ත්‍රික්කයේ සියලුම මහජන මන්ත්‍රීවරුන් ගම්පහ වික්‍රමාරච්චි විද්‍යාලයට සැලකීමක් කරනවා නම්, එතුමාගේ නාමයට සැලකීමක් කරනවා නම්, එතුමන්ලාගේ සහයෝගය සෑම අවස්ථාවකදීම අපට ලබා දෙන්නය කියා මම ඉල්ලා සිටිනවා.

හපුතලේ මහජන මන්ත්‍රීතුමාත් මේ ගැන කරුණු ඉදිරිපත් කළා. එතුමා සිංහල භාෂාව ගැන, සිංහල සංස්කෘතිය ගැන, වික්‍රමාරච්චි සම්ප්‍රදාය ගැන විශාල කැක්කුමක්, විශාල වේදනාවක්, විශාල හැඟීමක් තිබෙන මන්ත්‍රීවරයකු හැටියට ඉතාමත්ම තදින් අදහස් ඉදිරිපත් කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මසේන ආටිගල මහතා]
මේ විද්‍යායතනය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා ඔහු ඉදිරිපත් කළ කරුණු වලට මගේ විශේෂ අවධානය යොමු කරන බව මම එතුමාට මතක් කරන්නට ඕනෑ. එතුමා මේ පනතේ තිබෙන අඩුපාඩුකම් කිහිපයක් අපට ඉදිරිපත් කළා. ඒ අඩුපාඩුකම් ගැන අපි සාධාරණ ලෙසත්, යුක්ති සහගත ලෙසත් කල්පනා කර බැලුවා. ඒ අදහස් සියල්ලක්ම මේ පනතට අඩංගු කිරීමට ගරු සෞඛ්‍ය ඇමතිතුමාත්, මමත් කැමැත්ත ප්‍රකාශ කරන බව මා මතක් කරන්නට කැමතියි.

ඊළඟට ඌව-පරණගම මන්ත්‍රීතුමා කථා කළා. මේ රටේ සිංහල සංස්කෘතිය ගැන, සිංහලකම ගැන, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ගැන, ප්‍රාදේශීය වෛද්‍ය ක්‍රම ගැන නිතරම කතා කරන කෙනෙක් එතුමා. ඔහු නොයෙකුත් කරුණු ගැන අපේ අවධානය යොමු කළා. සමහර වෛද්‍ය වරුන්ගේ දක්ෂකම් ගැන ඔහු පෙන්වා දුන්නා. ඒ දක්ෂකම් ආරක්ෂා කිරීමට තමයි මේ අමාත්‍යාංශය ඇති කර, මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යන්නේ ඒ නිසා මේ රටේ පාරම්පරික වෛද්‍යවරුන් සදාකාලිකව ආරක්ෂා වෙන බව මා එතුමාට මතක් කරන්න කැමතියි.

ඒ වාගේම මම මතක් කරන්න කැමතියි හිටපු අග්‍රාමාත්‍ය මහාමාන්‍ය ඩී. එස්. සේනානායක, කේ. බාලසිංහම්, ශ්‍රීමත් ඩී. බී. ජයතිලක, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ආදී ජන නායකයින්ගේ නාමයන් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ආරක්ෂා කිරීම සඳහා සටන් කළ වීරයන්ගේ නාමාවලියේ නොමැකී පවතින බව. කේ. බාලසිංහම් මැතිතුමා ආරම්භකයකු හැටියට ක්‍රියා කළ නිසා ඔහුට කරන උපහාරයක් හැටියට අපි පසුගිය දවස්වල කේ. බාලසිංහම් වාට්ටුව නමින් විශේෂ වාට්ටුවක් විවෘත කළ බව මේ අවස්ථාවේ දී මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. පක්ෂ භේදයක් නැතිව, ආගම් භේදයක් නැතිව, ජාති භේදයක් නැතිව, කුල භේදයක් නැතිව මේ රටේ වෛද්‍ය ක්‍රම අපි දියුණු කරන්න ඕනෑ.

කෝපායි ගරු මන්ත්‍රීතුමාත් ආයුර්වේදය සම්බන්ධයෙන් කථා කළා. එතුමාට මේ ගම්පහ සිද්ධආයුර්වේද වෛද්‍ය විද්‍යාලය කියන එකේ පොඩි වෙනසක්, නොපැහැදිලි භාවයක් ඇති වුණා. මේක 'සිද්ධ' විද්‍යාලයක් නොවෙයි, "ගම්පහ සිද්ධ විද්‍යාලය" කියන්නේ, ගම්පහ 'ශුද්ධ' නැත්නම් 'පිරිසිදු' ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය කියන එකයි. සිද්ධ වෛද්‍ය ක්‍රමය දැනට ගම්පහ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පවත්වාගෙන යන්නේ නැහැ. කෝපායි මන්ත්‍රීතුමාත් (ඒ. එම්. ආලාලසුන්දරම් මහතා) විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාත් පසුගිය අයවැය විවාද වලදී සෑහෙන කරුණු ඉදිරිපත් කළා, සිද්ධ වෛද්‍ය ක්‍රමය සම්බන්ධනේ. විශේෂයෙන්ම විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ඉදිරිපත් කළ කරුණු උඩ මම යාපනයට ගිහින් ඒ සිද්ධ වෛද්‍ය විද්‍යාලයේ කථිකාචාර්ය වරුන් හා අනෙකුත් අය සමග සාකච්ඡා කළා. එම විද්‍යාලයේ දියුණුව සඳහා අපට දිය හැකි සම්පූර්ණ සහයෝගය දෙන බව මා එහිදී ප්‍රකාශ කළා.

**සිද්ධ හා යුනානි ඖෂධ නිෂ්පාදනය කිරීමටත්, සිද්ධ වෛද්‍ය ක්‍රමය ඉගැන්වීම වැඩි-දියුණු කිරීමටත් දැනටමත් අප පියවර ගෙන අවසානයි. සිද්ධ හා යුනානි ඖෂධ නිෂ්පාදනයට අදාළ ඖෂධ සංග්‍රහයක්—'Pharmacopoeia' එකක්—අදාළ නියමයන් අනුව අප පිළියෙළ කරගෙන යනවා. [බාධා කිරීමක්] ඔව්, පොතුවිල් පළමු වන මන්ත්‍රීතුමාත් (එම්. ඒ. එම්. ජලාල්දීන් මහතා) හොඳ දක්ෂ වෛද්‍යවරයෙක්; ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ කථිකාචාර්යවරයෙක්. ඔහු ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයට සෑහෙන සේවයක් කර තිබෙනවා. සිද්ධායුර්වේද ක්‍රමය නොනැසී පවත්වාගෙන යෑම සඳහා අපේ අමාත්‍යාංශය කටයුතු කරන බව කෝපායි මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමතියි.**

කොත්මලේ මන්ත්‍රීතුමාත් (ආනන්ද දසනායක මහතා) මේ රටේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සහ වෙනත් පාරම්පරික වෛද්‍ය ක්‍රම සම්බන්ධයෙන් ලොකු වේදනාවකින්, කැක්කුමකින් කථා කරනවා, අයවැය කාරක සභා අවස්ථාවලදී. මේ රටේ පාරම්පරික වෛද්‍ය ක්‍රම නගා සිටුවීම සඳහා එතුමාගේ සහයෝගය ලැබීම ගැන අප සන්තෝෂ වෙනවා. ඒ වගේම නොයෙකුත් අඩුපාඩුකම් ආදී කරුණුත් එතුමා නොයෙක් අවස්ථාවල අපේ අවධානයට යොමු කරවනවා. එම නිසා අප හැමදාමත් එතුමාට ගරු කරනවා.

අප බලාපොරොත්තු වන්නේ නියම විවේචන තුළින් ඉදිරිපත් කෙරෙන කරුණු අනුව අදාළ ප්‍රශ්නවලට සාධාරණ විසඳුම් ලබා දෙන්නයි. එම නිසා මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා, අපේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් විවේචන කරන විට සාධාරණව ඒ විවේචන කරන්නය කියා. අද මේ පනත් කෙටුම් පත පිළිබඳ විවාදයේ දී කරුණු සියල්ලක්ම වාගේ ඉදිරිපත් කෙරුණේ සාධාරණවයි; යුක්ති සහගතවයි. එම නිසා ඒ සියල්ලක්ම කෙරෙහි අපේ අවධානය යොමු කර කටයුතු කරන බව කියන්න කැමැතියි.

මාවනැල්ලේ ගරු මන්ත්‍රීතුමා, (චන්ද්‍ර රණතුංග මහතා) සිය කථාවේදී කෙරමිණිය වෛද්‍ය විද්‍යාලය සම්බන්ධයෙන් මතක් කළා. කෙරමිණිය වෛද්‍ය විද්‍යාලයට බොහොම පැරණි ඉතිහාසයක් තිබෙනවා. මාවනැල්ලේ හිටපු මන්ත්‍රී සී. ආර්. බෙලිගම්මන මැතිතුමාත් සෑහෙන උත්සාහයක් දැරුවා, මේ විද්‍යාලය රජය පිළිගත් විද්‍යාලයක් බවට පත් කරන්න. එහි විද්‍යාලයාධිපති හැටියට ක්‍රියා කරන කෙරමිණියේ ස්වාමීන් වහන්සේත් ගම්පහ පණ්ඩිත වික්‍රමාරච්චි රාළහාමි හා සමානව තමාගේ ධනය හා ශ්‍රමයත් වැය කරමින් එම විද්‍යාලය ආදර්ශමත් විද්‍යාලයක් බවට පත් කර තිබෙනවා. එහි පොඩි ආරෝග්‍යශාලාවකුත් තිබෙනවා. කොළඹ පෞද්ගලික ආරෝග්‍යශාලාවක් හා සමාන අන්දමින් පිරිසිදුව එහි නේවාසික රෝගීන්ට ප්‍රතිකාර කෙරෙනවා. ඇත්ත වශයෙන්ම බොහොම උසස් මට්ටමකිනුයි, ඒ ආරෝග්‍යශාලාව පවත්වාගෙන යන්නේ. මාවනැල්ලේ හිටපු මන්ත්‍රීතුමාත්, වර්තමාන මන්ත්‍රීතුමාත් ඉල්ලා හිටියා, මේ කෙරමිණිය වෛද්‍ය විද්‍යාලය රජය පිළිගත් විද්‍යාලයක් බවට පත් කරන්නය කියා. එහි නොයෙකුත් අඩුපාඩුකම් තිබුණා. අපි ඒ අඩුපාඩුකම් පෙන්වා දුන්නා. ඒ අඩුපාඩුකම් සම්පූර්ණ කර අවසන්වුණු හැටියේම අපි එය රජය පිළිගත් විද්‍යාලයක් බවට පත් කළ බව මතක් කරන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කැමැතියි. ඒ විද්‍යාලය ඉදිරි කාලයේදී මේ වාගේ සංස්ථාපිත ආයතනයක් බවට පත් කරන්න බලාපොරොත්තු වෙනවා නම් අප ඊටත් සහයෝගය දෙන බව මතක් කරන්න කැමතියි.

දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ආරියරත්න ජයතිලක මහතා) ඉදිරිපත් කළ කරුණු අතර දේශීය ඖෂධ ආරක්ෂා කිරීම සම්බන්ධවත් සඳහන් වුණා. මෙම අමාත්‍යාංශය පිහිටෙව්වාට පසු අපේ සැලකිල්ලට භාජනය වූ මුල්ම කාරණයක් තමයි එය. මේ රටේ දේශීය වෛද්‍ය ක්‍රමය ඉදිරියටත් පවත්වාගෙන යනවා නම් මේ රටේ ඖෂධ උද්‍යාන ඇති කර මේ රටට අවශ්‍ය ඖෂධ වර්ග මේ රටේම වවන්නට පියවර ගන්නට ඕනෑ. එසේ කළොත් පමණයි, විශාල විදේශීය විනිමයක් ආරක්ෂා කරගෙන විශාල සේවයක් කරන්නට පුළුවන්කම ලැබෙන්නේ. මා එකක් කිවයුතුයි. අද අපි මේ රටට ආනයනය කරන්නේ ඉතාම අවශ්‍ය බෙහෙත් වර්ග ස්වල්පයක් පමණයි. අනික් සියලුම ඖෂධ වර්ග දැනට මේ රටෙන්ම ලබා ගන්නට පුළුවන්කම තිබෙනවා. නමුත් මේ රජයේ සංවර්ධන වැඩ පිළිවෙළ අනුව අද කැලෑ එළි වේ ගෙන යන නිසා අපේ ඖෂධ වර්ග ක්‍රම ක්‍රමයෙන් ඇනි වේ ගෙන යන බවත් මා මතක් කරන්නට ඕනෑ. ඊට පිළියමක් වශයෙන් අන්තර් ජාතික ආධාරද ලබා ගනිමින් දේශීය ඖෂධ උද්‍යාන පිහිටුවීමේ පුළුල් වැඩ පිළිවෙළක් ළඟදීම ක්‍රියාත්මක කිරීමට අපි අදහස් කරනවා. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන විට මේ රටේම අපට වුවමනා කරන ඖෂධ වර්ග නිෂ්පාදනය කර ගැනීමට පුළුවන්කම ලැබෙනවා ඇති.

කෝපායි මන්ත්‍රීතුමා (ආලාලසුන්දරම් මහතා) කරුණු කීපයක් ඉදිරිපත් කළා. යාපනේ සිද්ධ විද්‍යායතනය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි සහ අනෙකුත් පහසුකම් කයිතඩි ආයුර්වේද රෝහල මගින් සපයා දීමට අපට දැනටමත් කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. එමනිසා ඒ සම්බන්ධයෙන් එතුමා කළ ඉල්ලීම යථා කාලයේදී ඉෂ්ට වන බව මා කෝපායි මන්ත්‍රීතුමාට මතක් කරන්නට කැමතියි.

මීට වඩා දීර්ඝ වශයෙන් කථා කළයුතුය කියා මා සිතන්නේ නැහැ. අද ඓතිහාසික දිනයක්. මෙම රජය බලයට පත්වූවාට පසු ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලය "ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය" යන නමින් අද සංස්ථාපිත කර එය තවදුරටත් වැඩි දියුණු කිරීමට පියවර ගන්නවා. මේ කාර්යයට සහාය දුන් සියලුම නිලධාරි මහත්වරුන්ටත් ඒවාගේම මේ සම්බන්ධව අපට ධෛර්යයට පත් කළ සියලුම මහජන මැති ඇමතිවරුන්ටත් අපේ අමාත්‍යාංශයේ සහ මෙම රජයේ ගෞරවය මා පුද කරන්නට කැමති යි. මෙම කටයුත්ත සාර්ථක කර ගන්නට සහාය දුන් සියලු දෙනාටම යළිත් අපේ ආශිර්වාදය ප්‍රකාශ කරමින් මේ "වික්‍රමාරච්චි" කියන නාමය සදාකල්හිම නොනැසී පවතිමින් මෙම ආයතනයන්හි බිහි වන වෛද්‍යවරුන්ට මේ රටේත් විදේශ රටවලත් සේවය කිරීමට වාසනාව, ශක්තිය සහ ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 6.40

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා (සෞඛ්‍ය ඇමතිතුමා)**

*(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து—சுகாதார அமைச்சர்)*

(Dr. Ranjith Atapattu—Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශීය වෛද්‍ය ඇමතිතුමාගේ දීර්ඝ දේශනයෙන් පසු වැඩි විස්තරයක් කිරීමේ අවශ්‍යතාවයක් නැහැ. නමුත් සෞඛ්‍ය ඇමති වශයෙන් මේ ප්‍රීතිමත් අවස්ථාවේදී වචනයක් දෙකක් ප්‍රකාශ කිරීම මගේ යුතුකමක්.

ප්‍රථමයෙන්ම මා කියන්නට ඕනෑ අලියා සම්පූර්ණයෙන්ම ගිනිත් වල්ගයට පමණක් මට සහභාගි වෙන්නට අවස්ථාව ලැබුණු බව. මේ පනතේ ඉතිහාසය ගැන කල්පනා කරන විට, ප්‍රථමයෙන්ම මේ අදහස පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනාවක් හැටියට හිටපු සෞඛ්‍ය ඇමතිවරයකු වූ දිවංගත ජෝර්ජ් රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන බව අපට පෙනෙනවා. එතුමාගේ යෝජනාව සාකච්ඡා කරන්නට ලැබුණේ නැහැ, එතුමා අභාවයට පත් වූ නිසා. ඉන් පසු හිටපු සෞඛ්‍ය ඇමතිනි ශිවා ඔබේසේකර මහත්මිය යෝජනාවක් ඉදිරිපත් කළා. නමුත් එවකට තිබුණු ආණ්ඩුව අභාවයට පත් වූ නිසා ඒ යෝජනාව ගැනත් සාකච්ඡා කරන්නට බැරි වුණා. ඊට පසුව අපේ හිටපු සෞඛ්‍ය ඇමති ගාමනී ජයසූරිය ඇමතිතුමා කමිටුවක් පත් කිරීම නිසා දැන් විස්තර කළ අන්දමට මේ පනත ඉදිරිපත් කරන්නට අපට පුළුවන් වුණා. මා හිතනවා අපේ දේශීය වෛද්‍ය ඇමතිතුමා මේ ගැන විශේෂයෙන්ම ආඩම්බර වෙනවා ඇත කියා. එතුමා සැහෙන උත්සාහයක් දරාගෙන මේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට වෙහෙස මහන්සි වී තිබෙනවා.

මේ අවස්ථාවේදී එක කරුණක් පමණක් මතක් කරන්න මම කැමතියි. වෛද්‍ය ක්‍රම කීපයක් ගැන මේ අවස්ථාවේදී මතක් කරන්න යෙදුණා. බටහිර හෝ වේවා දේශීය හෝ වේවා වෙන යම් එකක් හෝ වේවා ඒ එකම වෛද්‍ය ක්‍රමයක්වත් අංග සම්පූර්ණ නැහැ. එයට හේතුව මේ සියලලක්ම මනුෂ්‍යයින් විසින් මනුෂ්‍ය මොළවලින් සොයාගත් ඒවා වීමයි. ඒ සෑම ක්‍රමයකම අඩු පාඩු තිබෙනවා. බටහිර හෝ වේවා දේශීය හෝ වේවා වෙන වෙන ප්‍රදේශවලින් පැමිණි ඒවා හෝ වේවා, ඒ සෑම එකකම අඩුපාඩු තිබෙනවා. එම නිසා අපි ඒ සෑම ක්‍රමයක් ගැනම බලන විට අපට කොතරම් දුරට ඒ ක්‍රමයේ යන්නට පුළුවන්ද, ඒවා පිළිබඳව අපි ජනතාවට කොතරම් විශ්වාසයක් දිය යුතුද කියන එක කල්පනා කර ගන්නට අපට පුළුවන් වන්නට ඕනෑ. හුඟක් දුරට අපි සමහර අය අතර අදහස් ඇති කරනවා, යම් යම් ක්‍රම තුළින් ඕනෑම අසනීපයක් සුව කරන්න පුළුවන්ය කියා. ඒ ක්‍රියාව මගින් අහිංසක රෝගීන් අමාරුවේ දමනවා. ඒ වචන මම සඳහන් කරන්න ඕනෑ.

මේ වෛද්‍ය විද්‍යාලයට ඇති කිරීමේ මූලික පරමාර්ථය ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ පිරිසිදු භාවය ආරක්ෂා කිරීම බව අපි මුලින්ම මතක් කරන්න ඕනෑ. මා හිතන්නේ ගම්පහ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයෙන් පිට වී පැමිණි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා]

වෛද්‍ය ශිෂ්‍යයින්ගේ—මා හිතන විධියට අපේ පළාත් වල කිසිම ගමක් නැහැ, ඒ වෙද මහත්මයෙක් නැති—විශේෂ ලක්ෂණයක් නම් ඉංග්‍රීසි බෙහෙත් පාවිච්චියට බැහැලා නොතිබීමයි. කවුරුත් දන්නා දෙයක් තමයි, හුඟ දෙනෙක් සිංහල වෛද්‍ය සහතික අරගෙන නැත්නම් හෝමියෝපෙති වෛද්‍ය සහතික අරගෙන වැඩි හරියක් කරන්නේ ඉංග්‍රීසි බෙහෙත් වර්ග පාවිච්චිය බව. ඉංග්‍රීසි බෙහෙත් ගැන කිසි අවබෝධයක් නැතිව ඒවා පාවිච්චි කර ජනතාව ලොකු කරදරයකට පත් කරනවා.

එහෙත් මේ පණ්ඩිත වික්‍රමාරච්චි මැතිතුමාට අපි ගෞරව කරන්න ඕනෑ, එතුමාගේ ශිෂ්‍යයින් තුළ හැඟීමක් ඇති කර තිබීම ගැන, තමාගෙන් ඉගෙන ගන්නවා නම්, ඒ ක්‍රමය හරියට ක්‍රියාත්මක කරනවා නම්, ඒ මාර්ගයේම ගමන් කළ යුතුයි කියා. එතුමාගේ ශිෂ්‍ය පරපුරට එතුමා එසේ ඉගැන්වීම වැදගත් දෙයක් හැටියට අපි සලකනවා. ඒ නිසා ඒ පිරිසිදු භාවය රැක ගැනීමයි, අපි විශේෂයෙන් බලාපොරොත්තු වන්නේ මේ වෛද්‍ය විද්‍යාලය සංස්ථාගත කිරීමෙන් ඒ අත්දැකීම් අනුව දියුණු කර ගෙන යන විට මෙය විශ්ව විද්‍යාල මට්ටමකට ගන්නට පුළුවන් වන එක ගැන මට කිසිම සැකයක් නැහැ. ඒ නිසා මේ ඓතිහාසික අවස්ථාවේදී මෙයට සම්බන්ධවීමට මට අවස්ථාව ලැබීම ගැන මගේ සතුට පළ කරමින් මේ සම්බන්ධයෙන් වැදගත් අදහස් ප්‍රකාශ කළ සියලුම මන්ත්‍රීවරුන්ට මගේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப் பெற்றது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

මතු පළවන යෝජනාව සභාසම්මත විය.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය."—[වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා.]

*தீர்மானிக்கப்பட்டது :*

*"சட்டமூலம் முழுப்பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [டாக்டர் ரஞ்ஜித் அத்தபத்து]*

*Resolved :*

"That the Bill be referred to a Committee of the whole Parliament."-(*Dr. Ranjith Atapattu*).

**කාරක සභාවෙහිදී සලකා බලන ලදී.**

[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

*குழுவில் ஆராயப்பட்டது.*

*[பிரதி சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*

(MR. DEPUTY SPEAKER *in the Chair*).

1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

*1 ஆம் வாசகத்திலிருந்து 4 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 4 ordered to stand part of the Bill.*

**5 වන වගන්තිය : සංස්ථාවේ කටයුතු පාලනය කිරීම**

*வாசகம் 5.—(கூட்டுத்தாபன அலுவல் நிருவாகம்)*

CLAUSE 5.-(*Management of the affairs of the Corporation*).

**ධර්මසේන ආටිගල මහතා**
*(திரு. தர்மசேன ஆட்டிகல)*
**(Mr. Dharmasena Attygalle)**

Sir, there is an amendment ?

**සභාපතිතුමා**
*(தலைவர் அவர்கள்)*
**(The Chairman)**

To what Clause ?

**ධර්මසේන ආටිගල මහතා**
*(திரு. தர்மசேன ஆட்டிகல)*
**(Mr. Dharmasena Attygalle)**

Clause 5, Amendment 3.

**සභාපතිතුමා**
*(தலைவர் அவர்கள்)*
**(The Chairman)**

What is the Amendment ?

**ධර්මසේන ආටිගල මහතා**
*(திரு. தர்மசேன ஆட்டிகல)*
**(Mr. Dharmasena Attygalle)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනතේ 3 වන වගන්තියේ, 32 වන පේළියේ "අ" යන්නට පසුව 'ගම්පහ වික්‍රමාරච්චි සිද්ධායුර්වේද වෛද්‍ය සම්ප්‍රදාය ආරක්ෂා කිරීම හා ආයුර්වේද වෛද්‍ය ක්‍රම ඉගැන්වීම සඳහා වූ පුළුල් ජාතික ආයතනයක් වශයෙන් විද්‍යාලය පැවැත්වීම සහ පරිපාලනය කිරීම (ආයුර්වේද යන්න 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 80 වන වගන්තියේ අර්ථ නිරූපනය පරිදි)—

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
**(Mr. Lakshman Jayakody)**

Sir, I think he should consult the Legal Draftsman in this matter.

**ධර්මසේන ආටිගල මහතා**
*(திரு. தர்மசேன ஆட்டிகல)*
**(Mr. Dharmasena Attygalle)**

We have consulted.

**සභාපතිතුමා**
*(தலைவர் அவர்கள்)*
**(The Chairman)**

Order, please ! Have you got the approval of the Attorney-General ?

**ධර්මසේන ආටිගල මහතා**
*(திரு. தர்மசேன ஆட்டிகல)*
**(Mr. Dharmasena Attygalle)**

No ; the hon. Member for Haputale-(*Interruption*).

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෛත්‍රීපාල සේනානායක මහතා
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
**(Mr. Maithripala Senanayake)**

May I suggest this? Cannot we adjourn the Debate and then the Hon. Minister can come on another day with the amendments and finalize it?

සභාපතිතුමා
*(தலைவர் அவர்கள்)*
**(The Chairman)**

We have had no notice of the amendments and there is a regular procedure to be followed. These amendments have to be submitted to the Attorney-General.

ධර්මසේන ආටිගල මහතා
*(திரு. தர்மசேன ஆட்டிகல)*
**(Mr. Dharmasena Attygalle)**

It is not irregular.

සභාපතිතුමා
*(தலைவர் அவர்கள்)*
**(The Chairman)**

Written notice must be given and there must be approval–

ලක්ෂ්මන් ජයකොඩි මහතා
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
**(Mr. Lakshman Jayakody)**

We are not against it, but the fact remains that he must get the proper wording and also approval from the Attorney-General; if not, he might not be able to implement this Bill. We are all for it.

එස්. ඩී. බණ්ඩාරනායක මහතා
*(திரு. எஸ். டி. பண்டாரநாயக்க)*
**(Mr. S. D. Bandaranayake)**

Hon. Minister, why do you not let the bill be as it is, without making any amendments?

සභාපතිතුමා,
*(தலைவர் அவர்கள்)*
**(The Chairman)**

Order, please! Hon. Minister, if you wish to amend any of these Clauses –

ධර්මසේන ආටිගල මහතා
*(திரு. தர்மசேன ஆட்டிகல)*
**(Mr. Dharmasena Attygalle)**

We will take up the Bill as it is and bring the amendments on a later date.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
**(Mr. Lakshman Jayakody)**

That is right.

ධර්මසේන ආටිගල මහතා
*(திரு. தர்மசேன ஆட்டிகல)*
**(Mr. Dharmasena Attygalle)**

We will take up the amendments later.

**5 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*5 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*Clause 5 ordered to stand part of the Bill.*

**6 සිට 11 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**පනත් කෙටුම්පත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.**

*6 ஆம் வாசகத்திலிருந்து 11 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமென கட்டளையிடப்பட்டது.*

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Clause 6 to 11 ordered to stand part of the Bill.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
*(வைத்திய கலாநிதி ரஞ்ஜித் அத்தபத்து)*
**(Dr. Ranjith Atapattu)**

I move,

"That the Bill be now read the Third time."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.**

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப்பெற்றது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනත් කෙටුම්පත

### தேசிய அருங்கலைகள் பேரவையும் அதை மருவிய நிறுவனங்களும் சட்டமூலம்

## NATIONAL CRAFTS COUNCIL AND ALLIED INSTITUTIONS BILL

**දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.**

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එස්. තොන්ඩමන් මහතා (ග්‍රාමීය කර්මාන්ත සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා)**
*(திரு. எஸ். தொண்டமான்—கிராமிய கைத்தொழில் அபிவிருத்தி அமைச்சர்)*
**(Mr. S. Thondaman—Minister of Rural Industrial Development)**

I move,

"That the Bill be now read a Second time."

It is with great pleasure that I introduce the National Crafts Council and Allied Institutions Bill for the consideration of hon. Members of this House. This is the first time in the history of Sri Lanka that an Act of Parliament is being introduced for the betterment of the quality of life of our craftsmen. When I took office, the Department of Small Industries was handling all aspects of the handicrafts sector in addition to small industries. It was my view that the marketing of handicrafts should be handled by a separate institution. That is why the department for the Marketing and Export Promotion of Handicrafts was formed in 1979. With the experience that I have gained and from observing the working of the Departments handling handicrafts I find that new institutional forms are necessary for a more meaningful impact specially on the export market. Furthermore I wish to bring the craftsmen also into the mainstream of management. It is with this in view that the new Bill has been drafted. I wish to place before you some salient features of this Bill.

The apex body will be the National Crafts Council. The handicrafts sector all over the world has a national body of this nature. I have given wide representation for this body. The councillors will be those with a background of sincere commitment to the crafts community. It will include craftsmen. This council is given wide powers. It is my intention to introduce the system of having Presidential awards for Master-craftsmen. A novel feature introduced by this Bill is the levying of a cess on export of handicrafts. The finances accruing from this cess will be utilized for development purposes.

This Bill provides for the establishment of Crafts Councils craftwise and/or areawise. These councils will have craftsmen as members. I give great importance to these councils as it is through these councils that the craftsmen could represent matters to the Government. It is hoped that this institution could fulfil the aspirations of the craftsmen. These councils will advise and assist in the promotion, development and marketing of handicrafts; expand the production of handicrafts and improve the quality and standard of finished products; establish, maintain and operate centres, workshops and other institutions for the purpose of training craftsmen. It was found that the marketing of handicrafts should be handled by a Board without the restraints and constraints of a normal Government Department. The Sri Lanka Handicrafts Board will take over all the functions of the Department for the Marketing and Export Promotion of Handicrafts. It will operate all Laksalas. This board is given wide powers for the marketing of handicrafts both in Sri Lanka and abroad. Hopefully the Handicrafts Board will launch a dynamic marketing programme. There is at the moment a boom in the sale of handicrafts and the Board should take every advantage of it.

A National Designs Centre fills a long felt need. New designs are always sought after by foreign buyers. New products and product adaptation are vital necessities for the development of handicrafts. The National Designs Centre will be modelled on the National Designs Centre at Killkenny in Ireland and the National Designs Centre in Cairo, Egypt.

This Bill is an integrated package for the benefit of the craftsmen and the development of the handicrafts sector.

I commend this Bill for your consideration. In order to give due consideration to your views, I have decided not to rush this Bill but to send it to a Standing Committee so that every aspect of your suggestions will be taken into consideration when the amendments are brought in.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

අ. භා. 6.55

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන්නේ ගරු ඇමතිතුමාගේ බලාපොරොත්තුව තිබෙන්නේ මෙම පනත ස්ථාවර කාරක සභාවකට යොමු කරන්නයි. ඒ නිසා මම දීර්ඝ ලෙස කථා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ඒ අතරම, කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා තව මිනිත්තු 5 ක පමණ කාලයක් තිබෙන නිසා රජය කැමති නම් දැන්මම අපට කල් තැබීමේ යෝජනා අවස්ථාව ලබාගෙන මෙම විවාදය කල් තැබිම කරන්නය කියා මම ඉල්ලන්න කැමතියි. එතකොට අපට තවත් විනාඩි 5 ක කාලයක් ලැබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! I have to put the Question to the House.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

No. Sir.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

If you wish to speak, please start speaking. We will go on till 7 p.m.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
**(Mr. Lakshman Jayakody)**

In other words, the Government do not agree with our request ?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

Not that they do not agree. Shall we make this procedure regular ? We will go on till 7 o'clock. Otherwise, if you stop now, we will put it to the House.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
**(Mr. Lakshman Jayakody)**

I will speak, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ අදහසේ හැටියට ගරු ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන්නේ ඉතාම වැදගත් පනතක්. ඒ හේතුව නිසාම තමයි එතුමා බලා පොරොත්තු වන්නේ මෙම පනත ස්ථාවර කමිටුවකට යොමු කරන්නා. මේ අවස්ථාවේදී මට මතක් වෙනවා, ගම්බද ගැමි කලාකරුවන් දියුණු කිරීම සඳහා යම් යම් වකවානුවලදී—1948 ගැන කල්පනා කළත්, 1956 ගැන කල්පනා කළත්, ඊට පසුව 1960 ගැන කල්පනා කළත්—ඒ ඒ වකවානුවලදී ඒ ඒ රජයන් විශේෂයෙන්ම හස්ත කර්මාන්තය, ග්‍රාමීය කර්මාන්තය සුරක්ෂිතව තබාගැනීමට යම් යම් පියවරවල් ගත්ත බව.

ඔබතුමා නියෝජනය කරන බලපිටිය ගැන කල්පනා කරන විටත්, ඒ දවස්වල බලපිටියෙන් ගත් වෙට්ටි සරොම් ආදිය මම ඇන්දා. ඒ වාගේම දිවුලපිටිය ප්‍රදේශයේත් අත්කම් ව්‍යාපාරය ඉතාම දක්ෂ ලෙස දියුණු වී එ නිෂ්පාදන විදේශීය රටවලට පවා ආනයනය කිරීමට හැකි යුගයක අද ඒ සඳහා ස්ථාවර පනතක් ඉදිරිපත් වී තිබෙනවා. ඒ අනුව අපි මේ රටේ ගැමි කලාව ආරක්ෂා කරනවා වාගේම, ගැමි කලාව තුළින් නිෂ්පාදනය ඇති කරනවා වාගේම, ඒ නිෂ්පාදනයන් අපනයනය කරනවා වාගේම ඒ අපනයනය හේතුවෙන් අපට විදේශික ධනය එක්කාසු කර ගැනීමට වැඩපිළිවෙළක් ගරු ඇමතිතුමා සකස් කර තිබෙනවාය කියා අපට පෙනී යනවා.

අන්න ඒ නිසා ඒ ආයතනය පිහිටුවන අවස්ථාවේදී අපට ඉතාම වැදගත් දෙයක් මතක් කරන්නට සිදු වෙනවා. අමු ද්‍රව්‍ය මට්ටමේ සිට ඒ නිෂ්පාදන විකුණන අවස්ථාව දක්වා, විකුණන අවස්ථාවේ සිට ඒවා පරිහරණයට ගන්නා වූ විදේශීය පාරිභෝගිකයා දක්වා කොයි ආකාරයටද අපි මෙය ව්‍යාප්ත කරන්න ඕනෑ කියන එක ගැන අපි සෑහෙන අවබෝධයකින් කටයුතු කරන්න ඕනෑ. මම හිතන්නෙ නැහැ, ඒ ගැන ගරු ඇමතිතුමාට අමුතුවෙන් කියන්න ඕනෑය කියා. එතුමා මේ රටට එන්නට කලින් එතුමාත් එතුමාගේ පියාත් ඉතාම ශ්‍රේෂ්ඨ රටක සිටියේ, එනම් ඉන්දියාවෙ. ඒ ඉන්දියාවෙ වුණත්, කදර් කර්මාන්තය දේශීය කර්මාන්තයක් හැටියට පරිවර්තනය වී තිබුණු දෙයක්. අන්න ඒ ආභාෂය හේතුකොටගෙන ඉන්දියාවේ ව්‍යාප්ත වී තිබෙන කදර් එම්පෝරියම් ආදී ආයතන දුටු ඇමතිතුමාට හිතෙන්න ඇති—කාටත් හිතෙනවා—එවැනි කර්තව්‍යයක් මේ රටේත් කරන්න ඕනෑය කියා. අන්න ඒ නිසා මේ පනතේ වැදගත්භාවය අනුව ඒ ඒ කාලවල තිබුණු අමුද්‍රව්‍යවල තත්ත්වය කුමන ආකාරයෙන්ද තිබුණේ කියා සොයා බැලීමක් මුලින්ම කරන්න සිද්ධ වෙනවා. ඒ සොයා බැලීමෙන් පසුව, ඒ අමු ද්‍රව්‍යයන් තිබෙන්නේ කොහේදැයි සොයා බැලුවාට පසුව ඒ ද්‍රව්‍යයන් කර්මාන්තයක් හැටියට පරිවර්තනය කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය එතුමාට කල්පනා කරන්නට සිදු වී තිබෙනවා.

*ඒ කල්හි වේලාව අ. භා. 7 වූයෙන් කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.*

*එතැන් සිට විවාදය 1982 අගෝස්තු 3 වන අඟහරුවාදා පවත්වනු ලැබේ.*

*அப்போது பி. ப. 7 மணியாகிவிடவே அலுவல்கள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம் 1982 ஓகஸ்ட் 3, செவ்வாய்க்கிழமை மீளத் தொடங்கும்.*

*It being 7 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Tuesday, 3rd August 1982.*

## කල් තැබීම
## ஒத்திப்போடல்
## ADJOURNMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
*(திரு. எம். வின்சன்ற் பெரேரா—பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுக்கள் அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)*
**(Mr. M. Vincent Perera—Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)**

I move,

"That the Parliament do now adjourn."

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

Seven hon. Members are asking questions and those questions refer to 16 Ministers. I would suggest that you take half an hour for asking the questions and give the balance time for the replies. If you do that, everyone will have a chance of asking the questions.

Yes, the hon. Member for Gampaha.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එස්. ඩී. බණ්ඩාරනායක මහතා**
*(திரு. எஸ். டி. பண்டாரநாயக்க)*
**Mr. (S. D. Bandaranayake)**

Mr. Deputy Speaker, I will not take more than two minutes on this question which I am asking from the Hon. Prime Minister.

With regard to my question raised on the 25th of March 1982, column 2088 of the HANSARD, about the increase of water rates by nine times and electricity rates by four or five times in the Gampaha Urban Council and in Local Government areas in the rest of the country, and your letter dated 12th July 1982, the Local Government Authorities in the country in consultation with the Ceylon Electricity Board are considering the question of a proper and suitable levy from the consumers. Will the Hon. Prime Minister and the Government bear in mind the following :

That the increase in the number of tourist hotels and industrial complexes in the Free Trade Zone since July 1977 is responsible for the levy of an additional tax on electricity in households all over the country where people have been called upon to pay four or five times what they had been paying earlier as a result of the Government having to install generators and turbines for the supply of electricity.

Does the Government in the circumstances consider that this increase should be levied from the tourist hotels and industrial complexes and not from the general consumers in the country as it is wrong for the Government to get the middle classes and working classes to shoulder this burden ?

In the circumstances will the Government in levying a fuel charge, increase the minimum from 150 units to a minimum of 400 units ?

**මෛත්‍රීපාල සේනානායක මහතා** (මැදවච්චිය)
*(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)*
(Mr. Maithripala Senanayake—Medawachchiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය අහන්නේ රාජ්‍ය ආරක්ෂක කටයුතු පිළිබඳ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙනුයි. ඊයේ, එනම් 21 වැනිදා, බෞද්ධාලෝක මාවතේ පිහිටි සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ මූලස්ථානයේ පැවැති සිංහල බල මණ්ඩලයේ රැස්වීමක්, එම ස්ථානයට බලෙන් ඇතුල් වූ මැරවර පිරිසක් විසින් කඩාකප්පල් කර දැමූ බැවින්ද, මෙම මැරවර පිරිස එම රැස්වීමට සහභාගි වෙමින් සිටි භික්ෂූන් වහන්සේලා කිහිප නමකටම සහ වෙනත් බොහෝ දෙනෙකුට ශාරීරිකව හිංසාකාරී ලෙස පහර දී ඇති බැවින් ද, රැස්වීම බැලීමට පැමිණ සිටි මහජනයාටද එළව එළවා පහර දුන් බැවින්ද, මෙම ප්‍රකෝපකාරී සිද්ධිය මෙහෙයවන ලද්දේ රජයට සම්බන්ධ වෘත්තීය සමිතියක නායකයින්ගේ සහභාගිත්වයෙන් බවට ආරංචි පැතිර ගොස් ඇති හෙයින්ද මෙම කාරණය සම්බන්ධයෙන් ගරු සභාවට විස්තරයක් ඉදිරිපත් කර ඒ සම්බන්ධව ස්වාධීන පරීක්ෂණයක් කිරීමට කම්ටුවක් පත් කරනවාදැයි මම අහන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පත්තර කීපය කම මේ සම්බන්ධව [බාධාකිරීමක්] කලබල වෙන්නේ නැතිව ඉන්න මම කියවන්නම්. 'ඇත්ත' පත්තරයෙනුයි ඉස්සෙල්ලාම කියවන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පත්තර කීපයකම මේ සම්බන්ධයෙන් විශාල ප්‍රසිද්ධියක් දී තිබෙනවා. එය රහසක් නොවෙයි.

"යූ. ඇන්. පී. මැරයෝ සඟුනට පහර දෙති!

**මාදුළුවාවේ සෝභිත හිමි මහාචාර්ය සරත්චන්ද්‍ර රෝහලේ**

ඊයේ (21 දා) සවස කොළඹ බෞද්ධාලෝක මාවතේ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන මූලස්ථානයේ පැවැති සිංහල බල මණ්ඩලයේ රැස්වීමකට කඩා වැදුණු යූඇන්පී මැරයෝ එහි වේදිකාවේ සිටි එම බල මණ්ඩලයේ ප්‍රධාන ලේකම් කෝට්ටේ නාග විහාරාධිපති පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමියන් ඇතුළු භික්ෂූන්ටත්, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උප කුලපති වී. ඩී. කහන්ගහආරච්චි, කොළඹ තරුණ බෞද්ධ සංගමයේ ප්‍රධාන සභාපති රාජනීතිඥ සිරි පෙරේරා, බල මණ්ඩලයේ සංවිධායක ගාමිණී කීර්ති චන්ද්‍ර යන මහත්වරුනට ද රැස්වීම බැලීමට පැමිණි මහජනයාට ද එළව එළවා පහර දුන්හ."

මෙහි සඳහන් විස්තරය සම්පූර්ණයෙන්ම මම කියවන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ විස්තරය පුවත්පත්වලින් අද කවුරුත් දකින්නට ඇතැයි කියා මම හිතනවා. මම හිතනවා බෞද්ධයන් වශයෙන් අපි කවුරුත් කණගාටු විය යුතුයි මේ විධියේ දෙයක් මේ රටේ සිදුවීම ගැන. [බාධා කිරීමක්]

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

'ඇත්ත' පත්තරේ නොවෙයි, මෙන්න ජනාධිපතිතුමාගේ පත්තරෙත් තිබෙනවා.

**මෛත්‍රීපාල සේනානායක මහතා**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayake)

මෙන්න 'දිවයින' පත්තරේ. මොකක්ද කියලා තිබෙන්නේ ? "මහාචාර්ය සරච්චන්ද්‍ර බිම දමා කකුල් දෙකෙන් ඇදගෙන යමින් පහර දුන්නා" ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ විස්තරය සම්පූර්ණයෙන්ම කියවන්න යන්නේ නැහැ. අපි මේ වැඩ පිළිවෙල ගැන අපේ අප්‍රසාදය පමණක් නොව මහජනතාවගේ පිළිකුලත් ප්‍රකාශ කරන අතරම මේ සම්බන්ධව ස්වාධීන පරීක්ෂණයක් කිරීමට කටයුතු කරන ලෙස ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මීට වඩා යමක් කියන්නට මම බලාපොරොත්තු වෙන්නේ නැහැ.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා** (කලවාන)
*(திரு. சரத் முத்தெட்டுவெகம—கலவான)*
(Mr. Sarath Muttetuwegama—Kalawana)

Mr. Deputy Speaker, I have given notice of a Question, also to the Hon. Deputy Minister of Defence.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Is it on the same subject ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

On the same matter.

I associate myself fully with what the hon. Member for Medawachchiya said, but I would also like to draw the attention of the Hon. Deputy Minister to a report that appeared in another newspaper today, which is a very disturbing bit of news, if it is true.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

Order, please ! Have you given notice of that ?

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

I am raising this matter about an incident that occurred yesterday, and I am expanding on the question that has been asked.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

Not a fresh question ? It is not another question ?

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

No. It is the same thing.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

Yes. Please carry on.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

The " Sun " of today, Sir, in a front page article which states : " Crowd attacks Balamandalaya meeting," goes on to say that, " another crowd it is alleged dragged down Dr. Sarathchandra from the stage injuring his face. Meanwhile a call was made to the Emergency Police by the manager of this hall."

Nothing to do with the organisers of this meeting.

" However the squad cars failed to appear for some time and several press reporters got there faster than the radio-equipped Police cars."

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

**It is a false report !**

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

Now, Sir, this is an incident that occurred at Bauddhaloka Mawatha, right in the heart of Cinnamon Gardens. I do not want to go into the question of the people who had done this because the matter is under inquiry. I hope that the Police will act fairly in tracking down the people who were guilty. All I want to say is that there seems to have been some very funny situation. If the Manager of the hall telephoned the Emergency Police which is equipped very efficiently with radio squad cars, why could they not come there before the newspapers were able to send their reporters from various headquarters of the newspaper companies ? This is a very disturbing trend. We are on the eve of an election and the right of free speech is guaranteed by the Constitution, and whatever those organisers of the meeting had to say they had the right to say it. And if these people are allowed to get on to the stage and assault priests and professors when they are at a meeting, then the situation is getting completely out of hand. One of the newspapers referred to by the hon. Member for Medawachchiya, the " Aththa " gives a detailed list of the numbers of cars and C.T.B. buses that had been used. I hope the hon Deputy Minister will take note of all those things that appear in those papers.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) ඉදිරිපත් කළ කාරණය සම්බන්ධයෙන් මමත් කරුණු කීපයක් ඉදිරිපත් කරන්න කැමතියි. මම විශේෂයෙන්ම එක් කරුණක් ඉදිරිපත් කරන්න කැමතියි. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාට වුවමනා වී තිබෙනවා, කෑකෝ ගැයි මෙන් මේ ප්‍රශ්න ඇසීම නතර කරන්න. නමුත්, අපි ඒක අත හරින්නේ නැහැ. මේ ප්‍රශ්නය බෞද්ධයන් වශයෙන් අපට පමණක් නොව, මේ ගරු සභාවේ වැඩි දෙනකුට බලපාන ප්‍රශ්නයක්. අපි මීට කලිනුත් මේ විධියේ කරුණු කීපයක් මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට ඉදිරිපත් කර තිබෙනවා.

පසුගිය කාලයේ එක් වතාවක දී වෘත්තීය සමිති නායකයකුට පිහියෙන් ඇන්නා. [බාධා කිරීම්] එක් වතාවක දී මැරවරයන් විසින් එක් පුද්ගලයෙක්—සෝමපාල—පාගලා මැරුවා. විශ්ව විද්‍යාලයේ ළමයින් ඇද ඇද ගහලා එළියට දැම්මා. යාපනේ ගිහින් ඡන්ද පෙට්ටි හොරකම් කරලා, ගෙවල් ගිනි තියලා විනාශ කළා. මේ විධියෙන් ගියාම අපට අහන්න වෙනවා [බාධා කිරීම්] මේක ආණ්ඩුවක්ද කියලා. මේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදීය කියනවා, ධර්මිෂ්ටය කියනවා. මේ හැම එකක්ම කියමින් හැම තැනම කෙරෙන්නේ බොරුව.

ඇත්ත වශයෙන්ම මම හිතන හැටියට මේ සිද්ධියේදී ගරු කර්මාන්ත ඇමතිතුමාට ලොකු කැක්කුමක් ඇති වී තිබෙනවා. එතුමාට මේ ගැන ලොකු උනන්දුවක් තිබෙන බව පේනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සිරිල් මැතිව් මහතා (කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා)**
*(திரு. சிறில் மத்திவ்—கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)*
**(Mr. Cyril Mathew—Minister of Industries & Scientific Affairs)**

ඇයි ?

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

එතුමා සමහර විට මේ සිද්ධිය හොඳට දන්නවා ඇති. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

තමුන්නාන්සේගේ ප්‍රශ්නයේ ඇමතිතුමා ගැන සඳහන් කර තිබෙනවාද? පිළිතුරක් ලබා ගන්නට වුවමනා නම් ප්‍රශ්නය පමණක් අහන්න.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

මේ සිද්ධියේ දී එනැන වෘත්තීය සමිති නායකයෙක් සිටි බව සඳහන් වී තිබෙනවා. කවුද ඒ? එක්සත් ජාතික පක්ෂයේ සිරිනාල් ද මැල් මහත්මයා. ඒ වෙලාවේ දී ඒ ස්ථානයේ සිටියාලු. සාක්ෂි තිබෙනවා. [බාධා කිරීම්]

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்திவ்)*
**(Mr. Cyril Mathew)**

ඒක ඉල්ලා අස් කර ගන්න ඕනෑ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

Order please!

ප්‍රශ්නය පමණක් අහන්න, පිළිතුරක් ලබා ගන්න ඕනෑ නම්. මන්ත්‍රීවරයෙක් ගැන හරි, ඇමතිවරයෙක් ගැන හරි කරුණාකර සඳහන් කරන්න එපා. [බාධා කිරීම්]

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

මම දන්නෙ නැහැ මේ ඇමතිතුමා මොනවට නැගිටලා ඉන්නවද කියල. [බාධා කිරීම්]

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்திவ்)*
**(Mr. Cyril Mathew)**

එතුමාගේ ප්‍රකාශය වැරදියි. ඒක ඉල්ලා අස් කර ගන්න ඕනෑ.

I do not know what he is speaking about.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

You will have to accept it. He says he does not know anything about what you are talking.

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்திவ்)*
**(Mr. Cyril Mathew)**

Sir, the hon. Member will have to withdraw that.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

The hon. Member will have to accept the Hon. Minister's denial.

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்திவ்)*
**(Mr. Cyril Mathew)**

The hon. Member will have to withdraw the statement that he has made.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

මම කාරණය කියන්නම්. ඒක වැරදි නම් තමුන්නාන්සේ පසුව ඒක හරි ගස්සන්න. [බාධා කිරීම්]

**මන්ත්‍රීවරු**
*(அங்கத்தினர்)*
**(Members)**

නෑ, නෑ, වැරදියි. ඉල්ලා අස්කර ගන්න ඕනෑ.

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்திவ்)*
**(Mr. Cyril Mathew)**

Withdraw it.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

විත්ඩ්‍රෝ කරන්න දෙයක් නැහැ. සාක්ෂි තිබෙනවා. ඒ සාක්ෂි අනුව අපි කරුණු හොයා බැලුවා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

කොත්මලේ ගරු මන්ත්‍රීතුමාට කිසියම් ප්‍රශ්නයක් අහන්න තියෙනවද?

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

මේ ගරු මන්ත්‍රීවරු මොන විධියට දඟලුවත් අපට කමක් නැහැ. ඒ ස්ථානයේ සිටි පිරිස් සාක්ෂි දී තිබෙනවා. මාදුළුවාවේ සෝභිත හාමුදුරුවන් වහන්සේ පොලීසියට සම්පූර්ණ කට උත්තරයක් දී තිබෙනවා. එය බලන්න. සංවිධානය කරන ලද [බාධා කිරීම්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

ඒක ගැන විභාගයක් තියෙනවා.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

[බාධා කිරීම්] තමුන්නාන්සේ කියනවා නම් මම පිළි ගන්නම්. තමුන් පස්සේ ඔප්පු වෙයි. [බාධා කිරීම්]

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

මොනවද, ඔප්පු වෙන්නෙ?

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

ඔප්පු වෙන්නෙ ඇමතිතුමා කිව්ව දේ ඇත්ත කියල. ඒකයි ඔප්පු වෙන්නෙ. [බාධා කිරීම්]

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

ඇමතිතුමා කියන නිසා මම භාර ගන්නම්. [බාධා කිරීම්] ඇමතිතුමා කී දේ ඇත්ත කියල බාර ගන්නම්. [බාධා කිරීම්]

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்திவ்)*
**(Mr. Cyril Mathew)**

මොකක්ද භාර ගන්නෙ තමුන්නාන්සේ?

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

ඊට වැඩිය දෙයක් නැහැ. ගරු ඇමතිතුමාට දැන් තිබෙන්නෙ වාඩි වෙන්නයි. තවත් මොනවද කතා කරන්නෙ?

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்திவ்)*
**(Mr. Cyril Mathew)**

මොකක්ද භාර ගත්තෙ?

**ආනන්ද දසනායක මහතා**
*(திரு ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

දැන් භාර ගන්නයි කියල කිව්ව නේ?

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்திவ்)*
**(Mr. Cyril Mathew)**

මොකක්ද භාර ගත්තෙ?

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

ඒ කිව්ව දේ භාර ගත්ත. තවත් චූර්නිකා කියන්න වුවමනා නැහැ නේ? තමුන්නාන්සේ මොකටද විරුද්ධ වුණේ, ඒක භාර ගත්ත හරිසි කියල?

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்திவ்)*
**(Mr. Cyril Mathew)**

තමුන්නාන්සේ මට විරුද්ධව යම් චෝදනාවක් ඉදිරිපත් කළා. ඒ චෝදනාව ඉල්ලා අස් කර ගන්න.

**මන්ත්‍රීවරු**
*(அங்கத்தினர்)*
**(Members)**

ඉල්ලා අස් කර ගන්න ඕනෑ.

**ආනන්ද දසනායක මහතා**
*(திரு ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

භාර ගන්නයි කියන්නෙ තමුන්නාන්සේ කිව්ව එක හරියි කියන එකයි. ඊට වැඩිය කියන්න දෙයක් නැහැ. [බාධා කිරීම්] තමුන්නාන්සේ කියනවා නම් මම එය තාවකාලිකව භාර අරගෙන ඉල්ලා අස් කර ගන්නවා. හැබැයි තාවකාලිකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මෙහි දී විශේෂ දෙයක් පෙන්වන්න කැමතියි. අද 'දිවයින' පත්‍රයේ 5 වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා. 'මාදුළුවාවේ සෝභිත හිමියෝ පොලිසියට කට උත්තර දෙති' යන මාතෘකාව යටතේ එක්සත් ජාතික පක්ෂයේ ශාඛා සමිති යක නිලධාරි මහත්මයෙක්—විමල් ප්‍රනාන්දු මහතා—පැවසූ දෙයක් සඳහන් වෙනවා.

"මෙම රැස්වීමට දෙදහසක් පමණ පිරිසක් සහභාගි වූ බවත් ඊට සහභාගි නොවී කලබල කරන්නට පැමිණි 500 ක පමණ පිරිසක් මේ අතර සිටි බවත් එක්සත් ජාතික පක්ෂයේ තරුණ සංවිධාන කටයුතු සම්බන්ධ ලේකම්වරයෙකු වන විමල් ප්‍රනාන්දු මහතා පැවසීය."

**මන්ත්‍රීවරු**
*(அங்கத்தினர்)*
**(Members)**

ඒ පත්තර වාර්තාවක් නේ?

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

"........එක්සත් ජාතික පක්ෂයේ තරුණ සංවිධාන කටයුතු සම්බන්ධ ලේකම්වරයෙකු වන විමල් ප්‍රනාන්දු මහතා පැවසීය." [බාධා කිරීම්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රනිල් වික්‍රමසිංහ මහතා (යෞවන කටයුතු හා රැකී රක්ෂා ඇමතිතුමා සහ අධ්‍යාපන ඇමතිතුමා)
(திரு. ரணில் விக்ரமசிங்ஹ—இளைஞர் அலுவல்கள், தொழில் வாய்ப்பு அமைச்சரும் கல்வி அமைச்சரும்)
(Mr. Ranil Wickremasinghe—Minister of Youth Affairs & Employment and Minister of Education)

I want to raise a point of Order. The hon. Member for Kotmale must sit down till I raise it. Otherwise we will get involved in arguments.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

That is so. Please be seated.

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. றணில் விக்ரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

Point of Order.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

Certainly.

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. றணில் விக்ரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

Some hon. Members of the Opposition has raised a certain matter about a certain incident which took place yesterday. But the Member for Kotmale is reading out statements which had made to the Police on which investigations are being made, on which allegations are being made that the Police did not act properly. I think under our Standing Orders he cannot do so. We cannot debate this matter, in this way.

I think I will have to refer to Standing Order 84, and under that I would say, since he is reading out the statements on which the Police are today carrying out investigations, this matter should not be discussed in this manner.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please! In all these questions you are asking the Hon. Deputy Minister for Defence to investigate the matter. You are prejudicing that investigation if you read any statements made by witnesses.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

No, Sir. The matter has not yet gone berfore a court of law.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

It is not a question of the matter going before a court of law.

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. றணில் விக்ரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

Whether it has gone before a court of law or not, if the hon. Member says that there has been a breach of the peace—

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order please ! Now your question is very clearly before the House, and the Hon. Minister knows what you want in reply with regard to yesterday's incident. Please leave out any statements which are perfect hearsay and which are supposed to have been made at an investigation made by Police officers. Please do not read them because it might prejudice the case either for the prosecution or the accused. I would request you not to do so, because all the Members who spoke up to now referred to this one incident, and you are asking the Hon. Minister for Defence to hold a proper inquiry and then report to this House.

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. றணில் விக்ரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

That is right.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

No. We are helping the goverment to hold this inquiry.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

If you want to help, please go before the Police and make your statement.

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. றணில் விக்ரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

Mr. Deputy Speaker, if the hon. Member wants to help the government, he must go before the Police and make a statement.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයේදී කෙලින්ම 'ඇත්ත' පත්‍රය පැහැදිලි කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

ඒක කියල තිබෙනවා. දැන් තමුන්නාන්සේ කියන්න හදන්නෙ කලින් කිව්ව දේවල්මයි.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

ඒ වගේම වෘත්තීය සමිති අංශයෙන් සහභාගි වී තිබෙනවාය, ලංගම බස් ගෙනැවිත් තිබෙනවාය, ආදී වශයෙන් කරුණු රාශියක් දක්වා තිබෙනවා. ආණ්ඩුව ඇත්තවශයෙන්ම මේ ප්‍රශ්නය මොනවට ඇති කර තිබෙනවාද කියා අපි දන්නෙ නැහැ.

**රනිල් වික්‍රමසිංහ මහතා**
*(திரு. றணில் விக்ரமசிங்ஹ)*
**(Mr. Ranil Wickremasinghe)**

It should be properly under investigation by the Police, and it is not for the hon. Member to come here and comment. Hon. Member, please sit down now.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**

All the culprits seem to be here.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

All the culprits are here.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
**(Mr. Lakshman Jayakody)**

Sir, I have only one question to ask.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

You know what has already been said. Add to it, if you want, any fresh material.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
**(Mr. Lakshman Jayakody)**

Yes.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

But not hearsay stuff.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
**(Mr. Lakshman Jayakody)**

No, Sir. I associate myself with the hon. Member for Medawachchiya (Mr. Maithripala Senanayake) as well as the Member for Kalawana (Mr. Sarath Muttetuwegama) and also the Member for Kotmale (Mr. Ananda Dassanayake).

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

Yes.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

Do not associate with the Member for Kotmale. "Kotmale" is a dangerous man.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
**(Mr. Lakshman Jayakody)**

My one question is, we were made to understand yesterday that bail was given. Personal bail was given either by the Police or by a Magistrate or by an authority that has to give bail. If that is so, will the hon. Deputy Minister kindly reveal the names of the persons who gave bail and who gave surety. That is the one question that I want to know, because all the other details have been given in the papers, Sir.

We know that has happened, and the evening paper, the "Observer" today said that inquiries are being carried out, and, therefore, we would like to have a fair inquiry. We have been also on the other side of the coin many a time facing this type of question, and we would like the Police to give us a very fair inquiry into this matter.

I am quite sure the hon. Deputy Minister who has been a Police officer will give the truthful answer as to who the culprits are, and who are the people who assaulted the priests and the others, and let this country know very clearly who gave bail. That will be the one answer that I expect from, the hon. Deputy Minister.

**වීරවන්නි සමරවීර මහතා (නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා)**
*(திரு. வீரவன்னி சமரவீர—கல்விப் பிரதி அமைச்சர்)*
**(Mr. Weerawanni Samaraweera—Deputy Minister of Education)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතාමත්ම සුළු වේලාවක් ගන්නෙ. මමත් කල් දී තිබෙනවා ඔය ප්‍රශ්නය ගැන, මේ සභාවේ අවධානය යොමු කරන්නට. මේක සිංහල බල මණ්ඩලයේ, බෞද්ධයන්ගේ අයිතිවාසිකම් ගැන කථා කරන්නටයි කියා රැස්කළ සංගමයක්. මා අහන්න කැමතියි ගරු රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාගෙන්, මේ රැස්වීමට ශබ්ද වාහිනී යන්ත්‍ර පාවිච්චි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරවන්නි සමරවීර මහතා]

කළේ පොලීසියේ අවසරය අරගෙනද කියා. මට දැන ගන්නට තිබෙන හැටියට ශබ්දවාහිනී යන්ත්‍රවලට පොලීසියෙන් අවසර අරගෙන නොවෙයි මේ රැස්වීම තබා තිබෙන්නෙ; සාකච්ඡාව පවත්වා තිබෙන්නෙ. [බාධා කිරීමක්] අවසර ලබාගෙන නැහැ, අපි දන්න විධියට. ඒ ගොල්ලො කියනවා ඒ ගොල්ලන්ට අවසර තිබෙන වාය කියා. මේක මහා සභා රැස්වීමක්. [බාධා කිරීමක්] මම අහන්නෙ ආරක්ෂක ඇමතිතුමාගෙන්. දෙතුන් දහස් කැඳවලා සභාවක් පවත්වන වෙලාවෙ ශබ්දවාහිනී යන්ත්‍ර පාවිච්චි කරන්න අවසර ලබාගෙන තිබේනවාද? එහෙම අවසර ගත්තෙ නැත්නම් සිංහලයාගේ නියම අයිතිය ගැන කථා කරන්න නොවෙයි, මේ කට්ටිය රැස් වෙලා තිබෙන්නෙ. මේ අය රැස්වෙලා තිබෙන්නෙ කිසියම් දේශපාලන විනාශකාරී ව්‍යාපාරයක් ඇති කරන්නයි. 1956 ත් ඔය ක්‍රමය ගෙන ගියා.

මහාචාර්ය සරත්චන්ද්‍ර සංස්කෘතිය ගැන කථා කරන්නෙ: විශ්ව විද්‍යාලවල දරුවන්ගේ සංස්කෘතිය විනාශ කළ එක පුද්ගලයෙක් ඉන්නවා නම් ඒ ඔය සරත්චන්ද්‍රයි. කුණුහරුප සාහිත්‍යය මේ රටට ගෙනාවෙ ඔය සරත්චන්ද්‍රයි. තමන්ගේ පවුල් ජීවිතය ආරක්ෂා කර ගන්න බැරිවුණු මිනිස්සු: සාහිත්‍යයේ කරුණු අරගෙන නාට්‍ය හරිගස්සලා,—පැරිසිය ගැන කථා කරලා—තමන්ගේ දුව, තමන්ගේ ගෑනි භාරගන්න බැරි මිනිස්සු—[බාධා කිරීමක්].

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

Order, please!

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**

I rise to a point of Order. The hon. Deputy Minister of Education started off by saying that he has given notice of a Question from the Deputy Minister of Defence. The Deputy Minister of Defence is in no position to answer about the type of education imparted by Professor Sarathchandra or about his family life.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

That is for the Deputy Minister of Defence to reply.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**

I am saying that this is outside the question—(*Interruption*).

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

What is your point of Order?

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**

My point of Order is that he is going outside the question that he has asked and he is speaking about the personal life of someone who has been assaulted yesterday.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

Order, please!

I feel very sad to allow the personal life of anybody to be dragged in.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**

I wanted to know whether Professor Saratchandra was assaulted because he had some trouble with his wife.

**වීරවන්නි සමරවීර මහතා**
*(திரு. வீரவன்னி சமரவீர)*
**(Mr. Weerawanni Samaraweera)**

නියෝජ්‍ය කථානායකතුමනි, ඔය කලබලය ඇති වී තිබෙන්නෙ ඔය මනුෂ්‍යයා මේ ගැන කථා කරන්න ගිහිල්ලයි. ප්‍රතිපත්ති ආරක්ෂා කරගත්තෙ නැහැ, ඒක විනාශ කළා එහෙම මිනිහෙක් සංස්කෘතිය ගැන කථා කරනවා. කහන්ගහආරච්චි ගෙදර සිටිය අහිංසක කෙල්ලක්ව දූෂනය කර, ඇය ගැබ්ගත්තා. අන්න එවැනි අයයි සංස්කෘතිය ගැන කථා කරන්නේ. ඉතින් කාටද පුළුවන් අහගෙන ඉන්න. [බාධා කිරීමක්] 'අයිලන්ඩ්' පත්‍රයේ තිබෙන සිද්ධියක් ගැන තමුන්නාන්සේලා කථා කරන්නෙ. 'අයිලන්ඩ්' පත්‍රයේ තිබෙනවා වියට්නාමයේ බෞද්ධ භික්ෂූන්වහන්සේලා විනාශ කරලා මරා දමනවා කියා. නමුත් සරත්චන්ද්‍රලා ඒවා ගැන කථා කරන්නෙ නැහැ. මේක දේශපාලන ව්‍යාපාරයක්. කොමියුනිස්ට් පක්ෂයට භාෂාව, සංස්කෘතිය, බෞද්ධ භික්ෂූන්වහන්සේලා මතක් වෙන්නෙ, ඔවුන් ගැන සැක්කුම ඇති වෙන්නෙ දේශපාලන වශයෙන් ලාභ ලබාගන්න ඕනෑ වෙලාවට පමණයි. සරත්චන්ද්‍රලා නැගිටින්නෙත් දේශපාලන වශයෙන් එක් එක්කෙනාට පුටු සොයා දෙන්න පමණයි. සරත්චන්ද්‍රලා කවදාවත් මේ රටේ සංස්කෘතිය ගැන කථා කළේ නැහැ. ඔවුන් කළේ නිසැදැස් කාව්‍ය ඇසින් කුණුහරුප සාහිත්‍යයක් ඇති කිරීමයි.

මෙන්න මේ විධියට පරාජිත මිනිස්සු එළියට ඇවිල්ලා සංස්කෘතිය ගැන, සභ්‍යත්වය ගැන කථාකරන කොට, කෙල්ලන්ව ගෑණුන්ව දූෂණය කළ මිනිස්සු සංස්කෘතිය ගැන කථා කරන කොට, ඒක රටට විහිළුවක්. ඒ විහිළු කාරයන් කනෙන් ඇදලා දොට්ට දාන එක සංස්කෘතිය ආරක්ෂා කරන මිනිසුන්ගේ යුතුකමක් හැටියට මම මතක් කරනවා.

මේ අය ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කරන්න බල පත්‍ර ගත්තා ද කියා මම නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතුමාගෙන් අහන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජී. එම්. ප්‍රේමචන්ද්‍ර මහතා (නියෝජ්‍ය මහාමාර්ග ඇමතිතුමා)**
*(திரு. ஜீ. எம். பிரேமசந்திர—நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)*
**(Mr. G. M. Premachandra—Deputy Minister of Highways)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංඝයා වහන්සේලාට හිරිහැර කරන වැඩපිළිවෙළක් ගැනත්, මේ රජය විශාල වශයෙන් බෞද්ධ විරෝධී රජයක් බවත් රටට පෙන්වන්නට—එවැනි අදහසක් රටට දෙන්නට—විරුද්ධ පක්ෂය උත්සාහ කර තිබෙනවා මේ 'දිවයින' පත්‍රය පෙන්වලා. මේ දිවයින පත්‍රයේ ඡායාරූප දෙකක් පළවෙලා තිබෙනවා. පළමුවෙනි ඡායාරූපයේ තිබෙනවා, ස්වාමීන් වහන්සේ නමක් ඉතාමත්ම අමාරුවෙන්, වේදනාවෙන්, පුටුවක නැගලා යන අන්දම. ඊට යටින් තිබෙන ඡායා රූපයේ පළවෙලා තිබෙනවා කුරුඳුවත්ත පොලිසියේ—සමහරවිට පොලිස් පරීක්ෂක මහත්මයා ඉදිරියේ වෙන්නට ඕනෑ—මාදුළුවාවේ සෝභිත හාමුරුවො ප්‍රකාශයක් කළ පින්තූරයක්. ඒ ප්‍රකාශය කළාට පස්සේ විනයවංශ කියන හාමුදුරු කෙනෙක් රෝහලට ගෙන ගියාය කියා මේ පත්‍රයේ තිබෙනවා. පොලීසියේ අර ප්‍රකාශය කරන කොටත් මේ විනයවංශ හාමුදුරුවෝ ඒ ළඟම ඉඳගෙන ඉන්න බව. කිසිම අමාරුවක් නැතිව හොඳට විමසිල්ලෙන් ඒ ප්‍රකාශයට ඇහුම්කන් දීගෙන ඉන්න බව ඒ පින්තූරයේ පැහැදිලිව පෙනෙන්න තිබෙනවා.

ඒ ප්‍රකාශය කළාට පස්සේ ඒ හාමුදුරුවන්ට අසනීපය හැදී තිබෙනවා. අපට දැන ගන්න ලැබී තිබෙනවා, මේ හාමුදුරුවන් ඉස්පිරිතාලයට ගෙන ගියාට පස්සේ තෙලක් ගාලා ආපසු පන්සලට ඇරියාය කියා. [බාධා කිරීම්] ස්වාමීන් වහන්සේලාට හිරිහැර කළාය කියායි, ඒ ඡායා රූපයෙන් පෙන්වන්න හදන්නේ. ඒ ස්වාමීන් වහන්සේට අමාරු බව පෙන්නලා—[බාධා කිරීම්]

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
**(Mr. Lakshman Jayakody)**

Mr. Deputy Speaker, he is giving ideas to those who are inquiring. (*Interruption*).

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

Order please ! Do you wish to say anything ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
**(Mr. Lakshman Jayakody)**

Yes, Sir. He is trying to prove that what is in the newspaper is not correct. That is up to the Police to find out.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

Order please ! This inuiry or the police inquiry will have nothing to do with the truth or the falsity of what appears in the newspapers. What I would prevent is anybody saying anything with regard to the incident.

**ජී. එම්. ප්‍රේමචන්ද්‍ර මහතා**
*(திரு. ஜீ. எம். பிரேமசந்திர)*
**(Mr. G. M. Premachandra)**

මම කථා කරන්නේ ඒ පත්‍රයේ තිබෙන පින්තූර ගැනයි. සිංහල කථාවක් තිබෙනවා, 'කට බොරු කිව්වත් දිව බොරු කියන්නෙ නෑ' කියා. මේ පත්‍රයේ තිබෙන ප්‍රවෘත්තිය සම්පූර්ණ බොරුවක්. කුමන්ත්‍රණයක්—

**ආර්. පී. විජේසිරි මහතා** (හාරිස්පත්තුව දෙවන)
*(திரு. ஆர். பீ. விஜேசிறி—ஹாரிஸ்பத்துவ இரண்டாம் அங்கத்தவர்)*
**(Mr. R. P. Wijesiri—Second Harispattuwa)**

එක හැරයකුත් ඔහොම කියල වැමෑරුවා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

Order please ! Mr. Speaker will now take the Chair.

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා [ඇල්හාජ් එම්. අබ්දුල් බාකීර් මාකාර් මහතා] මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, சபாநாயகர் அவர்கள் [அல்ஹாஜ் எம். அப்துல் பாகிர் மாகார்] தலைமை வகித்தார்கள்.*

*Whereuon* MR. DEPUTY SPEAKER *left the Chair and* MR. SPEAKER (AL HAJ M. ABDUL BAKEER MARKAR) *took the Chair.*

**ජී. එම්. ප්‍රේමචන්ද්‍ර මහතා**
*(திரு. ஜீ. எம். பிரேமசந்திர)*
**(Mr. G. M. Premachandra)**

ගරු කථානායකතුමනි, මා පෙන්නා දෙමින් හිටියේ සමහරුන් විසින් ආණ්ඩුවට පක්ෂ පත්‍රයක් හැටියට වැරදි හැඟීමක් ඇති කර ගෙන තිබෙන 'දිවයින' පත්‍රයේ පළ වී තිබුණු ප්‍රවෘත්තියක් ගැනයි. ඒ පත්‍රයේ පළ වී තිබෙන ඡායාරූප දෙක සංසන්දනය කරන විට පැහැදිලිව ඔප්පු වෙනවා, ඒ ස්වාමීන් වහන්සේට හිතාමතාම උපදෙස් දී වේදනාවක් පෙන්නුම් කරන විධියට ඡායාරූපයක් ගෙන ඒ පත්‍රයේ පළ කර තිබෙන බව. ඒ ඡායාරූපය උඩින්ම දමල වැරදීමකින් හෝ ඊට පටහැනි තත්ත්වයක් පෙන්නුම් කෙරෙන ඡායාරූපයක් යටින් පළ කර තිබෙනව. ඒ පින්තූරයෙන් පෙනෙනවා, උන් වහන්සේ හොඳට ඉඳගෙන ඉන්න හැටි. එම නිසා මේ ගැන පොලීසියෙන් පරීක්ෂණයක් කළ යුතුයයි මා ඉල්ලා සිටිනවා. අපට ලැබී තිබෙන ආරංචියේ හැටියට නම් උන්වහන්සේට එවැනි අමරුවක් නැහැ කියා තෙලක් ගාලා ආපසු යවා තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජී. එම්. ප්‍රේමචන්ද්‍ර මහතා]

ආණ්ඩුවට විරුද්ධව භික්ෂූන් වහන්සේලා අවුස්සන්න, ජාති භේද අවුස්සන්න, ආගම් භේද අවුස්සන්න යම්කිසි දේශපාලන පක්ෂයක් පසුබිමේ ඉඳගෙන කළ වැඩක් තමයි, මේ. මේ සංවිධානයේ ඉන්න ගාමිනී කීර්තිචන්ද්‍ර එංගලන්තයේ ඉඳල ලංකාවට ආවේ ගාමිනී ප්‍රනාන්දු හැටියටයි. මෙහි ආවායින් පස්සේ ගාමිනී කීර්තිචන්ද්‍ර වුණා. රත්ගම හිටපු මන්ත්‍රී එම්. පී. ද සොයිසා මහතාගේ බෑනා වන ඔහු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රබල සාමාජිකයෙක්. කවුද, එදිරිවීර සරත්චන්ද්‍ර කියන්නේ ? ඔහුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රබල සමාජිකයෙක්. දැන් ඔවුන්ට දේශපාලන පක්ෂයක් වශයෙන් ඉස්සරහින් එන්න බැරි නිසා මාදුළුවාවේ සෝභිත හාමුදුරුවොත්, වෙනත් ස්වාමීන් වහන්සේලාත් අල්ලා ගෙන, අලුත් මාර්ගයකින් එළියට එන්න දඟලන වැඩ පිළිවෙළක් තමයි, මේ. මෙය සම්පූර්ණයෙන්ම දේශපාලන කුමන්ත්‍රණයක් බව ප්‍රකාශ කරන අතර මේ පිළිබඳව පූර්ණ පරීක්ෂණයක් පවත්වන්නය කියා මා ඉල්ලා සිටිනවා.

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்தியு)*
**(Mr. Cyril Mathew)**

Mr. Speaker, the opposition read out extracts from the newspapers. I must say that we too have information that certain prominent Sri Lanka Freedom Party members–(*Interruption*).

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
**(A Member)**

සිංහලෙන් කථා කරන්න.

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்தியு)*
**(Mr. Cyril Mathew)**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජිතවරු කිප දෙනෙක් මේ රැස්වීම සඳහා කොළොන්නාව ඡන්ද කොට්ඨාශයෙන් වණ්ඩින් එකතු කරගෙන ගිය බවට අපට ආරංචි ලැබී තිබෙනවා. [බාධා කිරීම්]

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
**(Mr. Lakshman Jayakody)**

Can you name them ?

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்தியு)*
**(Mr. Cyril Mathew)**

ඔව්. නම් කියන්නම්. [බාධා කිරීම්] නම් ඉල්ලන නිසා ඒ නම් කියන්න ඕනෑ. ෂෙල්ටන් අබේරත්න—ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහවත්ත නාගරික මන්ත්‍රී—යකඩ පොලු, ගල් එකතු කරගෙන වාහනවලින් මිනිස්සු එක්ක ගියා, මේ රැස්වීමට. කොළොන්නාව ඡන්ද කොට්ඨාශයේ පමණක් නොව කොළඹ යන පාරේත් සිටින අපේ පාක්ෂිකයන් මෙය වාර්තා කර තිබෙනවා. තවත් පුද්ගලයෙක් ඉන්නවා. කොලොන්නාවේ කොටිකාවත්තේ එල්. එස්. පෙරේරා. එයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කොටිකාවත්තේ මධ්‍යම බල මණ්ඩලයේ සභාපති. එයා මීට ප්‍රථමයෙන් මහජන එක්සත් පෙරමුණේ හිටපු පුද්ගලයෙක්. එදා එයා මහජන එක්සත් පෙරමුණේ හිටපු කාලයේදී එතුමන්ලාගේම—දැන් ජනාධිපති තරඟයට ඉදිරිපත් කරන්නට යන—ඉලංගරත්න මහත්මයා එයා ගැන කියපු දෙයක් මා තමුන්නාන්සේට හැන්සාඩ් වාර්තාවෙන් ඉදිරිපත් කරන්නට කැමතියි. 1969 සැප්තැම්බර් මාසයේ 7 වැනිදා හැන්සාඩ් වාර්තාවේ 2055 වන තීරුවේ සඳහන් වන පරිදි මෙන්න මේ අන්දමටයි, ඉලංගරත්න මහත්මයා කොටිකාවත්තේ එල්. එස්. පෙරේරා සම්බන්ධව ප්‍රකාශ කළේ :

"එක් අයෙක් සිටිනවා. එනම්, එල්. එස්. පෙරේරා මහතායි. කිසිවෙකු විසින් වඩා කිට්ටුවට නොගතයුතු කෙනෙක්—"

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

එයාව අරන් දැන් බල මණ්ඩලයට.

**සිරිල් මැතිව් මහතා**
*(திரு. சிறில் மத்தியு)*
**(Mr. Cyril Mathew)**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කොටිකාවත්තේ මධ්‍යම බල මණ්ඩලයේ සභාපති. ඉලංගරත්න මහත්මයා එදා කිව්වා ඔහු, එල්. එස්. පෙරේරා මහත්මයා, "කිසිවකු විසින් වඩා කිට්ටුවට නොගත යුතු කෙනෙක්" කියල. දැන් ඔහු ඔඩොක්කුව උඩ තියා ගෙන ඉන්නවා. මේ මහත්වරු තමයි, ඒ රැස්වීමට ආවේ. ඒ රැස්වීමට දාමරිකයන් ගෙනාවෙ මේ මහත්වරු තමයි. එම හැන්සාඩ් වාර්තාවේම 2056 වන තීරුවේ ඉලංගරත්න මහත්මයා මේ අන්දමට ප්‍රකාශ කර තිබෙනවා :

"දැනටමත් මිනීමැරීමේ චෝදනාවකට ඔහු දෙවන විත්තිකාරයා වී සිටිනවා."

මෙන්න මේ මිනිස්සු තමයි, බෞද්ධාලෝක මාවතට සෙනඟ එක් කරගෙන ගියේ.

මේ අපි කියන ඒවා නොවෙයි ; ඉලංගරත්න මහත්මයා කියපු දෙයක් :

"ඔහු නිතරම වාගේ නොයෙකුත් අපරාධවලට සම්බන්ධ වෙනවා."

මේ අපරාධයටත් එයා සම්බන්ධ වුණා.

"මා සිතන හැටියට වැල්ලම්පිටිය පොලීසියට නිතරම වාගේ ඔහුගෙන් බේරීමක් නැහැ."

මෙන්න මෙහෙම මිනිස්සු තමයි, සිංහල බල මණ්ඩලයේ රැස්වීමට ගියේ. ඒ ගිය අයටත් බේරුමක් නැහැ. අල්ලගෙන හොඳටම තැලුවා. එල්. එස්. පෙරේරා කියන පුද්ගලයා මේ විධියට දාමරිකයන් එක් කරගෙන ගියා. ඔහු ගැන එදා ඉලංගරත්න මහත්මයා කියපු දේවල් මම තවදුරටත් කියවන්නම්. එයා කිසි කලක කිට්ටුවට නොගනයුතු පුද්ගලයෙක්ය කියා ප්‍රකාශ කර තිබෙන බව මා කලින් සඳහන් කළා. ඊළඟට මෙසේ සඳහන් වෙනවා :

"මොහු ටෙන්ඩර් කැඳවීමක් නොකර 1969 අගෝස්තු මාසයේදී එක්නරා පුද්ගලික සමාගමකට කොන්ත්‍රාත්තුවක් දී තිබෙන බවත් ආරංචියි. අවුරුද්දකට අවශ්‍ය කරන බෝතල් ප්‍රමාණයකින් පහෙන් දෙකක් ගෙන්වීමේ කොන්ත්‍රාත්තුවක් වශයෙන් එය හඳුන්වන්නට පුළුවනි. මුළු කොන්ත්‍රාත් එක දී තිබෙන්නේ රුපියල් 40,626 කටයි. මේ අන්දමට ඔහු නොයෙකුත් ගිනුවක්කාරකම් කර තිබෙනවා."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එක පුද්ගලයෙක් මෙයා තමයි. පළමුවැනි පුද්ගලයා ෂෙල්ටන් අබේරත්න. දෙවැනි පුද්ගලයා එල්. එස්. පෙරේරා. තුන්වැනි පුද්ගලයා ඩබ්ලිව්. ගෝනදූව. ඔහු දැනට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නගර සභිකයෙක්. ඒවාගේම හිටපු නගර සභාපතිවරයෙක්. මෙන්න මේ පුද්ගලයින් සියලු දෙනාම එකතු වී දාමරිකයන් ඒ ස්ථානයට ගෙන ගිය බව අපේ පාක්ෂිකයන් අපට වාර්තා කර තිබෙනවා. අපේ කොළඹ දිස්ත්‍රික් ඇමතිතුමාටත් මේ කාරණා සම්බන්ධව ආරංචි ලැබී තිබෙනවා. තමුන්නාන්සේලා පත්‍රවලින් කියවනවා. අපි වාර්තා කරන්නේ අපට ලැබුණු ආරංචිවලින්. අපේ පාක්ෂිකයන් දිගටම ඉන්නවා. කොලොන්නාව, කොළඹ, බොරැල්ල ආදී වශයෙන් හැම තැනම අපේ පාක්ෂිකයන් ඉන්නවා. [බාධා කිරීමක්] මෙවැනි අය තමයි, එදා ඒ රැස්වීමට ගියේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තිබෙනවා, ලොකු භේදයක්. එවැනි මේ භේදකාරී පුද්ගලයින් දෙකොටසක් ගොස් එනන ගාලගෝට්ටියක් ඇති කළා. ඒ අවස්ථාවේ සිංහල බෞද්ධ බල මණ්ඩලයේ අහිංසක සාමාජිකයින්ට ගැහුවා, මේ පුද්ගලයින් එකතු වෙලා. මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාක්ෂිකයින් සිංහල බල මණ්ඩලයේ රැස්වීමක්වත් පවත්වන්නට ඉඩ දෙන්නේ නැහැ. [බාධා කිරීමක්] බුද්ධරක්ඛිත සිටියේ එයාලාගේ පැත්තේ තමයි. බුද්ධරක්ඛිත ගිය මාර්ගයේ තමයි, මේ අයත් යන්නේ. [බාධා කිරීමක්] බුද්ධරක්ඛිත සිටියේත් විමලා හිටියෙත් තමුන්නාන්සේලාගේ පක්ෂයේ, තමුන්නාන්සේලාගේ පක්ෂයේ සිටියේ මිනීමරුවෝ. ඇතුත් මිනීමරුවන් බෝවීගෙන එනවා. සිංහල බෞද්ධ රැස්වීමක්වත් තබන්නට තමුන්නාන්සේලා ඉඩ දෙන්නේ නැහැ. [බාධා කිරීමක්]

අ. භා. 7.38

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා (කොළඹ දිසා ඇමතිතුමා)**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி—கொழும்பு மாவட்ட அமைச்சர்)*
**(Mr. Weerasinghe Mallimarachchi—District Minister, Colombo)**

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධව මාත් කරුණක් ප්‍රකාශ කරන්න සතුටුයි. අපේ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කොත්මලේ ගරු මන්ත්‍රීතුමාත් (ආනන්ද දසනායක මහතා) ගම්පහ ගරු මන්ත්‍රීතුමාත් (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) හිතනවා ඇති, අපට කියන්න මොකක්වත් දෙයක් නැතිව මේ කරුණු ඉදිරිපත් කරනවාය කියා. මා එතුමන්ලාට කියන්න සතුටුයි, මේ සම්බන්ධව මම හොඳට දන්නා කරුණු කිහිපයක්.

මේ සිංහල බල මණ්ඩලයම පෙරහැරකින් අනුරාධපුරයට ගමන් කළා. එදා මා හිතන හැටියට පිරිත් කිය කියා ගමන් කළ ස්වාමින් වහන්සේලාට පිටුපසින් ගමන් කළ බස් රථයේ මොනවාද සිදු වුණේ? දැනට කොලොන්නාව නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙක් වන, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එහි බලය තිබුණු කාලයේ හිටපු සභාපතිවරයා වූ, 1960 දී කොලොන්නාව ආසනයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග කළ ඩබ්ලිව්. ගෝනදූව මහත්මයා චන්ඩි පිරිසකුයි පොලුයි අරගෙන අරක්කු බිබී ගමන් කළා, පිරිත් කිය කියා ගිය වාහනයට පිටුපසින්. ඒ අනුරාධපුරයට ගමන් කරද්දී. කලවානේ ගරු මන්ත්‍රීතුමාට (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) මම කියන්න කැමතියි, ප්‍රවෘත්ති පත්‍රවලින් කියන දේවල්වලට වඩා වෙනසක් තිබෙන බව, රටේ සිදු වන සිද්ධිවල.

මම තවත් කරුණක් කියන්නම්. දැනට සති දෙකකට පමණ කලින් ගරු නියෝජ්‍ය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමාට මම පත්තරයක් ගෙනැවිත් දුන්නා. ඒ ගෙනැවිත් දුන්නේ 'දිනකර' පත්‍රයයි. ඒ පත්‍රයේ තිබුණා කොලොන්නාවේ ගෙවල් 13 ක් ගිනිබත් කරලා කියා. දාමරිකයින් විසින් ගෙවල් 13 ක් ගිනිබත් කරලා. ඒ පත්‍රයෙන් අහවන්න හදා තිබුණේ මේ ගිනිබත්වීම කොහොමද සිදු වුණේ කියන එකයි. අපේ ගරු ඇමතිතුමාම දැන් ප්‍රකාශ කළා මේ එල්. එස්. පෙරේරා කියන පුද්ගලයා මිනීමැරුම්වලට සම්බන්ධයි, වෙක්පත් වංචාවලට සම්බන්ධයි, දාමරිකකම්වලට සම්බන්ධයි කියා ඉලංගරත්න මහත්මයා ඇමතිවරයෙක් වශයෙන් සිටියදී විවේචනයට ලක් කළ පුද්ගලයෙක්ය කියා. ඒ පුද්ගලයා කොලොන්නාව බල මණ්ඩලයේ සභාපති වෙලා අර දප්පත් දෙපිරිසක් අතර පැල්පත්වල හටගත් ආරාවුලකදී—මම සැකයෙන් තොරව කියන්න කැමතියි, මම බොරු චෝදනාවක් කරන්නේ නැහැ—ඒ පුද්ගලයා උගන්වා ගෙවල් 13 කට ගිනි තැබුවා. ඊට පසුව ඒ අයගේම පත්තරයේ පළ කළා, මෙන්න කොලොන්නාවේ වෙන සිද්ධි කියා.

ගරු කථානායකතුමනි, ඊළඟට මම කියන්න කැමතියි, මෙය පන්සල්වලට සම්බන්ධ කරන අන්දම සිංහල බල මණ්ඩලයෙන්. පසුගිය දිනක 'දිනකර' පත්‍රයේ තිබුණා, "ගැටබේ පන්සල පවරා ගත්තා. මෙන්න කොලොන්නාවේ මල්ලිත් වැඩ කිඩ පෙන්නයි" කියා. මම දන්නෙත් නැහැ. පන්සලක් නම් තිබුණා. ඊට යාබදව නගර සභාවට අයිති ඉඩමක ස්වාමීන් වහන්සේ නමක් වැඩ හිටියා. ඒ ස්වාමීන් වහන්සේට ඇරැපත්වීමක් ලැබී 1978 දී වෙනත් පළාතක පදිංචියට ගියා. නගර සභාවට අයිති මේ හිස් ඉඩමේ බෝධියක් තිබෙනවා. ඒ බෝධියට යාර 3 ක් නැත්නම් 4 ක් ඈතින් දෙන්නෙක් තුන් දෙනෙක් කසිප්පු පෙරනවා. මේ කසිප්පු පෙරන තැන මාතර සිට පැමිණි හාමුදුරු නමක් පදිංචි වෙන්න ගියා. ඒ අවස්ථාවේ නගර සභාවේ නිලධාරීන් පොලිසියට පැමිණිල්ලකුත් කර එතනට ගිහින් කිව්වා "මෙතන පන්සලක් කර ගන්න එපා" කියා. ඊට පසුව ඒ හාමුදුරුවෝ කළ වැඩේ මොකක්ද? අර කසිප්පුකාරයින් දෙන්න තුන් දෙනත් එක්කාසු කර ගෙන ලීවලින් පොඩි වැටක් ගැහැව්වා. වැටක් ගැහැව්වට පස්සෙ මේ ගැන මට පැමිණිලි කරන්න ආපුවාම මම කිව්වා, ස්වාමීන් වහන්ස, මේක නගර සභාවට අයිති ඉඩමක්; මෙතනට යන්න එපා' කියා. මම මේ කියා ගෙන එන්නෙ, මේවා සිද්ධ වෙන හැටි කොහොමද කියල පෙන්නා දෙන්න. කාරුණිකරල මට ඇහුම් කන් දෙන්න, බාධා නොකර.

ගරු කථානායකතුමනි, නගර සභාවෙ නිලධාරීන් ගිහින් වැට අයින් කරන්න බැලුව. එහෙම බලන කොට, 'ඇත්ත' පත්‍රයෙ වාර්තාකාරයෙක් මට ටෙලිෆෝන් කරල සිද්ධිය ගැන මගෙන් ඇහැව්ව. මම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසිංහ මල්ලිමාරච්චි මහතා]

කිව්ව මා ළඟට මේ ස්වාමීන් වහන්සෙත්, අල්ලපු පන්සලේ ස්වාමීන් වහන්සේලා දෙනමකුත් ආවා; මම උන්වහන්සේලාට ගිලන්පස දීල හොඳට කතා කළා; මම උන්වහන්සේලාට කිව්වා, මේක නගර සභාවට අයිති ඉඩමක්. නිවාස පහක් හදන්න යන ඉඩමක්, ඒක නිසා බලහත්කාරයෙන් ඉඩමට ඇතුළු වෙන්න එපාය කියල. ඊට පස්සෙ උන්වහන්සේලා යන්න කියා කියල. "ඇත්ත" පත්‍රයෙ ඒ වාර්තාව ඒ විධියටම පළ කර තිබුණා.

'ඇත්ත' පත්‍රයෙන් මට ටෙලිෆෝන් කළේ උදේ 10 ට විතර. හවස තුන හමාරට විතර 'දිනකර' පත්‍රයෙ වාර්තාකරුවකුත්, කැමරා කාරයෙකුත් මේ වත්තට ගියා. ඒ ගොල්ලන් ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයො 15 දෙනෙක් එකතු කර ගත්තා. එහෙම එකතු කර ගෙන හාමුදුරුවො ගහල තිබුණු අර වැට බිමට පාත් කළා. බිමට පාත් කරල කැමරා කාරයාට කියල ෆොටෝ එකක් ගත්තා. ලොකු හාමුදුරුවො එක්කරගෙන ආපු අර පන්සලේ පොඩි ස්වාමින් වහන්සෙ කෙනෙකුත් එතැන හිටිය. ගරු කථානායකතුමනි, මම තමුන්නාන්සේට මේ ගරු සභාවෙදි බොරු කියන්නෙ නැහැ; සත්‍යයයි ප්‍රකාශ කරන්නෙ. ඉතින් අර පොඩි හාමුදුරුවන්ට කුණු හරුපයක් කියල "අල්ලපන් යකෝ" කියල වැට ඉස්සෙව්ව. උස්සන ගමන් ෆොටෝ එකකුත් ගත්තා. ඒ ගත්තු ෆොටෝ එක පහුවදා 'දිනකර' පත්‍රයෙ දැම්ම, 'මෙන්න යූ ඇන් පි කාරයො කොලොන්නාවෙත් පටන් අරගෙන නැටඹේ ගත්තු විධියට ගන්න' කියල වාර්තාවකුත් එක්ක. ගරු කථානායකතුමනි, දේශපාලන වශයෙන් පාරාජික වෙච්ච මේ අය, මොන කුණු හරුපයක් කරලා හරි, මොන කුපාඩිකමක් කරලා හරි අනික් මිනිසුන්ට මඩ ගහන්නයි බලන්නෙ.

කොලොන්නාවෙ එක්තරා ස්ථානයක පන්සලක පිරිතක් තිබුණා. ඒ කාලයෙ මට මතක හැටියට මම පිට රටයි හිටියෙ. හාමුදුරුවො පිරිත් මණ්ඩපයෙ ඉඳගෙන පිරිත් කියන කොට දාමරිකයො පැනල මේ ඉලංගරත්නගෙ පිරිත් මණ්ඩපයට ගැහැව්ව. හාමුදුරුවො ධාතු කරඬුවත් දමල දිව්ව. මේක සිද්ධ වුණේ මැයි මාසෙ. මම එතකොට හිටියෙ එංගලන්තෙ. මෙන්න "දිනකර" පත්‍රයෙ කර්තෘ වාක්‍යයක් දමනව, "කොලොන්නාවෙ ඇති වෙලා තිබෙන සිද්ධිවලින් මල්ලිමාරච්චිගේ දාමරික ක්‍රියා පෙනෙනව නේද?" කියල.

ගරු කථානායකතුමනි, බෞද්ධාලෝක මාවතේ තිබුණු රැස්වීම ගැන කියන්න කැමතියි. සිංහල බෞද්ධයා ගැන සිරි පෙරේරාට වගේම අපටත් කැක්කුමක් තිබෙනව. අපේ ගෙවල්වල උඩ තට්ටුවෙ එක්කෙනෙකුත් පහල තට්ටුවෙ එක්කෙනෙකුත් නැහැ. තට්ටු දෙකේම ඉන්නෙ එක්කෙනයි. නානාපති කාර්යාල කරපු දවස්වලත් අපි එහෙම හිටියෙත් නැහැ. මේ මිනිසුන් තමයි අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මොන විධියෙන් හරි බලයට පත් කරන්නට කුමන්ත්‍රණය කරන්නෙ. ආචාර්ය සරත්චන්ද්‍ර, ඊයෙ පහර කෑවාය කියන පුද්ගලයා, පළමු දා රූපවාහිනියට තුනට ගිය පුද්ගලයා. ඉන් එළියට ආවෙ පහ මාරට නේද කියල මම අහන්න කැමතියි. එයා ඊට පෙර සතියෙ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ කුණ්ඩසාලෙ රැස්වීමෙදි කතා කළා, ජනාධිපතිතුමාටත්, මේ රටේ අගමැතිවරයාටත් අපහාස කළා; ආණ්ඩුව විවේචනය කළා. පැය තුන හතරක කාලයක් රූපවාහිනී මධ්‍යස්ථානයට පිංගල එතැන කුමන්ත්‍රණය කරනව. මේ රැස්වීමට කැඳවන්න, සරත්චන්ද්‍ර රූපවාහිනියට ගිහින් මිනිසුන් එක්කාසු කළා. මම දන්නෙ නැති කාරණයක් ගැන නොවෙයි, කතා කරන්නෙ. මම සත්‍ය යයි ප්‍රකාශ කරන්නෙ. විරුද්ධ පාර්ශ්වයෙ තමුන්නාන්සේලා සමහර විට මේවා ගැන දන්නෙ නැතුව කතා කරනවා ඇති. මම දැනගෙනයි කතා කරන්නෙ. මගේ ප්‍රදේශයෙ මිනිසුන් දවස් හතර-පහක්ම මට ඇවිත් කිව්ව, එල්. එස්. පෙරේරායි, ගෝනදුවයි, ෂෙල්ටන් අබේරත්නයි—කොළඹ නගර සභිකයෙක්—තැන් තැන්වලින් මිනිස්සුයි යකඩ පොලුයි එකතු කරනවාය කියල. මම ඒව විශ්වාස කළේ නැහැ. මම දැනගෙන හිටියෙ නැහැ, මේවා මොකටද කියල. මම මේක විහිලුවක් හැටියටයි, ගණන් ගත්තෙ. මම කාටවත් පැමිණිලි කළේ නැහැ. [බාධා කිරීමක්] රත්තරන් පොලු වෙන්නත් පුළුවනි, සල්ලි ගෝනි වෙන්නත් පුළුවනි, මොකෝ අස්සෙන් දමනවාද කියන්න මම දන්නෙ නැහැ. ගරු කථානායකතුමනි, මම කියන්න කැමතියි, තමුන්නාන්සෙ ඉදිරියෙ. මේ ගරු සභාවෙදි මම නොදන්නා දෙයක්වත්, බොරුවක්වත් කියන්නෙ නැති බව. මේ සභාවෙදි අපි ඇත්ත ප්‍රකාශ කරන්න ඕනැ.

ගරු කථානායකතුමනි, මේ පුද්ගලයො ඊට පස්සෙ මොකද කළේ? එකතු කර ගත් මේ කණ්ඩායම මෙතනට ගෙනාව. ඒ රැස්වීමට ආපු යම් යම් පුද්ගලයන්ගෙ නම් මේ ගරු මන්ත්‍රීවරු දැන් සඳහන් කළා. [බාධා කිරීම්] ඉන්න, පත්‍රය කියන ඒවා ගැන මම අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාට (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කියන්නම්. අපේ කර්මාන්ත ඇමතිතුමාගෙ නම—සිරිල් මැතිව් ඇමතිතුමාගෙ නම—කෙළින්ම පාවිච්චි කළා, මේවාට සම්බන්ධය කියල. ඒ විධියට නම පාවිච්චි කරන්න මොන යුතුකමක්ද තිබුණෙ? මේවා ගැන එතුමා දන්නෙත් නැහැ. එම රැස්වීමට ආපු සාමාජිකයන්ගෙ නම් කීපයක්ම මේ ගරු සභාවෙදි සඳහන් වුණා. ඒ ගොල්ලන් ආවෙ ඒ ගොල්ලන් සිංහල බල මණ්ඩලයෙ සාමාජිකයො නිසයි. ඒ ගොල්ලන්ට අයිතිවාසිකමක් තිබෙනව මේ රැස්වීමට එන්න.

සිංහල ජාතිය ආරක්ෂා කරන්න පැවැත්වූ ඒ රැස්වීමේ, බෞද්ධාගම ආරක්ෂා කරන්න පැවැත්වූ ඒ රැස්වීමේ කථා කර තිබෙන්නෙ මොනවාද? සරච්චන්ද්‍ර උන්නැහේ නැගිටලා මොකක්ද කථා කරන්නෙ? තමන්ගේ දූ දරුවන් පිට රටවලට විකුණලා. ගෑණුන්ව පිටරටවලට විකුණලා ජීවත් වන තත්ත්වයටයි එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව අද ලංකාව ගෙනැවිත් තිබෙන්නේ කියා කථා කරන විට ඒ සාමාජිකයන්—එහි නොයෙකුත් පාක්ෂිකයන් සාමාජිකයන් වශයෙන් සිටින්න පුළුවන්—කුපිත වී ප්‍රශ්න ඇහුවා. ප්‍රශ්න අසන විට අර ෂෙල්ටන් අබේරත්නලා, අර ඇල්. ඇස්. පෙරේරලා ජනෙල්වලට පොලුවලින් ගහන්න පටන් ගත්තා. එසේ ගහන්න පටන්ගන්න විට අර අහිංසක සාමාජිකයන්ට පහර වැදුණා. [බාධා කිරීම්] ඒ අහිංසක සාමාජිකයන් අද උදේ ඇවිත්—[බාධා කිරීම්] බස් එකේ නැතිව පයින් එන්නද? බස්වලින් තමයි එන්නෙ—අද උදේ ඇවිත් මට එක්කෙනෙක් පෙන්නුවා, උරහිසට පොලු පහරක් වැදිලා ඇති වී තිබෙන තත්ත්වය. මොකටද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ? සිංහලය ආරක්ෂා කරන්න ගිහින් බෞද්ධාගම ආරක්ෂා කරන්න ගිහින්, මේ ආණ්ඩුව විවේචනය කරමින් ඒකට දේශපාලනයක් ගාවා ගනිමින් මොකක්ද මේ කරන්නෙ? සරච්චන්ද්‍ර උන්නැහේ කුණ්ඩසාලෙ ආසනයට ගිහින් දේශපාලනය කථා කර සති දෙකක් ඇතුළත බෞද්ධයන්ටත්, සිංහල ජාතියක් ආරක්ෂා කරන්න යන්නේ මේ දාමරික කණ්ඩායමත් එක්කද කියා මම අහන්න කැමතියි. මම තමුන්නාන්සේට කියන්න කැමතියි, මේ රටේ පමණයි මේ විධියේ ඒවාට ඉඩ දෙන්නෙ කියා.

මෙතන කලවානෙ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවේගම මහතා) ඉන්නවා. ඒ මන්ත්‍රීතුමාට මගේ ලොකු ගෞරවයක් තිබෙනවා. නමුත් සමහර විට එතුමා දැන දැනම පක්ෂයේ ප්‍රතිපත්ති නිසා කොහොම වෙතත් ආගමට හරි ආදරෙයි. අපොයි මේ තුන් සිංහලයේම නැහැ ආගමට ඒ තරම් ආදරයක්! ඒ ගොල්ලන්ට ආගම පෙනෙන්නේ මේ වාගේ ඔළු පැළුණු වෙලාවට පමණයි. එක්කො ඔළු පලාගන්න ඕනෑ. නැත්නම් සිවුරක් ඉරාගන්න ඕනෑ, එහෙමත් නැත්නම් සිවුරක ලේ තවරාගන්න ඕනෑ.

මේ රටේ තවත් පුද්ගලයෙක් ඉන්නවා. උන්නැහේ ගැනත් වචනයක් කියන්න ඕනෑ. උන්නැහේ පැරදිලා පැත්තක හිටියත් දිනලා මේ ගරු සභාවෙ සිටියත් උන්නැහේ හැම වෙලාවෙම සොයන්නෙ සිවුරක්. එක්කො ලේ තැවරෙන්න ඕනෑ, නැත්නම් ඉරිලා තිබෙන්න ඕනෑ. ඔන්න ඔහොම මොකක් හෝ කුණුහරුපයක් සොයනවා. [බාධා කිරීම්] කවුද? ප්‍රින්ස් ගුණසේකර. උන්නැහේ විගහට ගිහින් බදාගෙන තිබෙනවා, කවුදෝ දාලා ගිහින් තිබුණු සිවුරක්. නියෝජ්‍ය කථානායකතුමනි, හාමුදුරුවරු සිවුරු දාලා දුවන තත්ත්වයකට පත් වෙලා නැහැ. මොකද වුණේ? ඇල්. ඇස්. පෙරේරා පන්සලකට ගිහිල්ලා පරණ සිවුරක් අරගෙන ඇවිත් එතැනට දැම්මා. ඊට පස්සෙ කිව්වා, පේනවා නේද හාමුදුරු කෙනෙක් සිවුරත් දමලයි දිව්වෙ කියා. සිවුරු දමා හාමුදුරුවරු දිව්වෙ නැහැ, සිරි පෙරේරා තමයි දුවලා ගිහිල්ලා රෝද තුනේ ටැක්සියක නැගලා ගෙදර දිව්වෙ. හාමුදුරු කෙනෙක් දිව්වෙ නැහැ.

අර ගුටි කාපු මිනිහා මට ඇවිත් කිව්වා, "අනේ මන්ත්‍රීතුමා මෙන්න මේකයි වුණේ, මේකයි ඇත්ත සිද්ධිය" කියා. ඒ නිසා නියෝජ්‍ය කථානායකතුමනි, මම නියෝජ්‍ය ආරක්ෂක කටයුතු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමතියි, මේ සම්බන්ධයෙන් සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වන්නය කියා. පරීක්ෂණයක් පැවැත්වූ දාට එළි වේවි, කවුද මේකට සම්බන්ධ නියම පුද්ගලයන් කියා. මේ ප්‍රශ්නය වසා ආණ්ඩුවට මඩ ගසා බලාගෙන ඉන්නෙ සිවුරු අරන් වේදිකාවට යන්නයි.

මාවතගම මන්ත්‍රීතුමා (ජී. එම්. ප්‍රේමචන්ද්‍ර මහතා) කිව්වා, හාමුදුරු කෙනෙක් එක තැනක කොන්ද අල්ලගෙන සිටියාය අනික් තැනදී හොඳට කෙළින්වෙලා ඉඳගෙන කට උත්තර දුන්නාය කියා. මේ පත්‍ර කියන කියන විධියට ආණ්ඩුව ගෙනයන්න අපි සූදානම් නැහැ. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කිව්වා, පත්‍ර කියන විධියටයි අපි වැඩ කරන්නෙ කියා. එක්සත් ජාතික පක්ෂයට මඩ ගහන කොට පත්‍රය හොඳයි. මම අහන්න කැමතියි අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාගෙන් පසුගිය ඉරුදින "දිවයින" පත්‍රයේ "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියම නායකයා විජේමල්ලී" කියා උඩ ඇඳුනුත් නැතුව, පිහියකුත් ඉනේ ගසාගෙන සිටි පින්තූරයක් සමග පළ කර තිබූ පුවත හරිද කියා. පිහියකුත් ඉනේ ගහගෙන, කමිසයකුත් නැතිව—[බාධා කිරීම්] කවුද? විජය කුමාරතුංග—රැවුලකුත් දමා ඇගේ මවිලුත් පෙන්වාගෙන පින්තූරයේ සිටි විජය කුමාරතුංගද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා කියා මම අහන්න කැමතියි. අත්තනගල්ලේ මන්ත්‍රීතුමා පිළිගන්නවාද ඒක හරිය කියා. [බාධා කිරීම්] අද තමුන්නාන්සේලාට වෙලා තිබෙන්නේ මොකක්ද? විෂ කාලා, පිස්සු වැටිලා. [බාධා කිරීම්] මරිජුවානා පමණක් නොවෙයි. ඊටත් වැඩි දේවල් කාලා. හසිසුයි මරිජුවානායි එකට ගහලා. නායකයා කවුද දන්නෙ නැහැ. ලකුණ මොකක්ද දන්නෙ නැහැ. කාර්යාලය කොතනද දන්නෙ නැහැ.

මම කියන්න කැමතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටට නිදහස ලැබුණාට පස්සේ බෞද්ධාගම ආරක්ෂා කරන්නට කටයුතු කළ යම් රජයක් මේ රටේ තිබෙනවා නම්, බෞද්ධාගමේ ආරක්ෂාවට කටයුතු කළ එකම රජය අපේ රජයයි කියා.

අපි කිසි විටක සූදානම් නැහැ ගරුතර සංඝ රත්නයට කරදර කරන්න. ඒ වාගේම මහජනතාවට කරදර කරන්නත් සූදානම් නැහැ. තමුන්නාන්සේලා තමයි අද අයුතු විධියට පන්සල්වලට රිංගන්න බලන්නේ. අද මොකද වෙලා තිබෙන්නේ? සිරිමා බණ්ඩාරනායක මැතිණිය පන්සලකට එනවාය කියනවා. පන්සලකට එනවා නම්, පූජාවකට එනවා නම් මොකටද දෙවියනේ මේ නිල් පාටින් දැන්වීම් ගහලා 25 වැනිදා අන්න අතට එනවා කියා කියන්නේ? එතැනට ගිහින් මොකක්ද කරන්නේ? දේශපාලන කථාවක්. එහෙම කරලා අද පන්සල මේ විධියට පිරිහෙන තත්ත්වයකට ගෙනාවා නම් ඒ ගෙනැවිත් තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. එක්සත් ජාතික පක්ෂය නොවෙයි.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

ගරු කථානායකතුමනි, කොළඹ දිස්ත්‍රික් අමාත්‍යතුමාගේ (වීරසිංහ මල්ලිමාරච්චි මහතා) කථාවේ එක් කොටසක් ගැන විශේෂයෙන් කතා කරන්නටයි මම බලාපොරොත්තු වෙන්නේ. ඊයේ වුණු සිද්ධිය සම්බන්ධයෙන් අපක්ෂපාත පරීක්ෂණයක් කරන්නට කියලයි අපි ඉල්ලීමක් කළේ. මේ පත්තරවල පළ වුණු නම් අරවා මේවා අපි කිව්වේ නැහැ. නමුත් කොළඹ දිසා ඇමතිතුමාගේ කටින් පිට වුණා ප්‍රින්ස් ගුණසේකර නීතිඥ මහත්මයා ගැන. නමුත් මට කණගාටුයි කියන්නට, ප්‍රින්ස් ගුණසේකර නීතිඥතුමා ගාල්ලේ උසාවියට ගිහින් ආපසු තමාගේ නිවසට පැමිණ වතුර උගුරක් වත් බොන්නට කලින් මේ පණිවුඩය එතුමාට ගිහින් තිබෙනවා. එතුමාගේ ගෙදරට පිරිසක් ගිහින්, "මෙහෙම සිද්ධියක් වෙලා තිබෙනවා; අනේ නීතිඥතුමා අපිත් එක්ක පොලීසියට යන්න එන්න" යයි කියා තිබෙනවා. නීතිඥ මහත්මයෙක් හැටියටත්, බෞද්ධයෙක් හැටියටත් ඒ මහත්මයා ඒ කටයුත්තට සහභාගි වුණා මිසක් කාගේවත් සිවුරු ඉනාරකම් කරන්න ඒ ස්ථානයට ගියේ නැහැයි කියන එක විශේෂයෙන්ම කොළඹ දිසා ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. වේරපිටිය මහතා (ඇමතිතුමා සහ රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා)**

*(திரு. ரீ. பி. வேரபிற்றிய—அமைச்சரும் பாதுகாப்புப் பிரதி அமைச்சரும்)*

**(Mr. T. B. Werapitiya—Minister and Deputy Minister of Defence)**

Mr. Speaker, I wish to state to this House that I am not moved by anything that has been said on the Floor of this House about this c se. I am aware that the police are making inquiries and until the inquiries are completed, I am not in a position to say anything about this case. But there are one or two questions to which I would like to reply.

As far as the police were concerned, no loudspeaker permit had been issued and that was one of the reasons why no police officers were posted there. A few days ago a meeting was held at the New Town Hall, Colombo, where Mrs. Bandaranaike and Dr. Colvin R. de Silva spoke. No police were posted at that meeting too. (*Interruption*). It was not necessary.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

Leave him alone. Please sit down.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*

**(Mr. Lakshman Jayakody)**

We would like to know whether a loudspeaker permit is necessary to hold a meeting inside a house ?–(*Interruption*).

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

Order, please ! Please stick to the Standing Orders. Sit down.

**ටී. බී. වේරපිටිය මහතා**

*(திரு. ரீ. பி. வேரப்பிற்றிய)*

**(Mr. T. B. Werapitiya)**

The hon. Member for Kalawana (Mr. Sarath Muttetuwegama) raised the point that the Police Emergency took a long time to reach there. According to the report which I have received from the D.I.G. in charge of the area, the Police Emergency had been informed at 16.16 hrs.–that is at 4.16 p.m.–and the car arrived at the scene at 4.22 p.m. In other words, the car arrived at the scene within six minutes after receiving the message. Therefore, I do not wish to make a statement about the case. I am satisfied with the procedure that has been taken by the police so far–(*Interruption*)–No arrest has been made. Therefore, the question of bail does not arise. That is all I have to say, Sir.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**

*(திரு. எம். வின்சன்ற் பெரேரா)*

**(Mr. M. Vincent Perera)**

In answer to the question raised by the hon. Member for Gampaha (Mr. S. D. Bandaranayake) from Hon. the Prime Minister in regard to water and electricity rates, I wish to answer as follows :

1. It is incorrect to state that the increase in the demand for electical power resulting in the Government having to install diesel driven generators and gas turbines to supplement the power generated by the hydral system has been forced by the power demands of the tourist hotels and industrial complexes in the Free Trade Zone since July 1977. Between 1977 and 1982 the demand for power has risen from 261 MW in 1977 to 413 MW in 1982, registering an increase of 152 MW. But the total power demand by the Free Trade Zone at the moment is only 6 MW.

2. Under the Tariffs Scheme in operation with effect from 1st June 1982 increased tariffs are being levied on tourist hotels and industrial complexes and the Domestic Tariff to a certain extent is subsidised by the increased Hotels, Commercial and Industrial Tariffs.

3. No. It is estimated that the power need of a normal middle-class husehold would be within 150 units per month, provided they use electricity without wastage.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

Are there any other questions to be answered ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**

*(திரு. எம். வின்சன்ற் பெரேரா)*

**(Mr. M. Vincent Perera)**

No.

**ආනන්ද දසනායක මහතා**

*(திரு. ஆனந்த தஸநாயக்க)*

**(Mr. Ananda Dassanayake)**

Sir, I was not allowed to raise my question because of this dispute.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

**(Mr. Speaker)**

It is too late now.

**එකල්හි වේලාව අ. භා. 8 වූයෙන් නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.**

**පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 8.01 ට අද දින සභාසම්මතිය අනුව, 1982 අගෝස්තු 3 වන අඟහරුවාදා අ. භා. 3 වනතෙක් කල් ගියේ ය.**

*அப்பொழுது, பி. ப. 8 மணியாகிவிடவே உப சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்தி வைத்தார்கள்.*

*இதன்படி பி. ப. 8.1 க்கு, பாராளுமன்றம் அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 1982 ஓகஸ்ட் 3, செவ்வாய்க்கிழமை பி. ப. 3 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 8 p.m.*, MR. DEPUTY SPEAKER *adjourned Parliament without Quesion put.*

*Adjourned accordingly at 8.01 p.m. until 3 p.m. on Tuesday, 3rd August, 1982, pursuant to the Resolution of the Parliament of this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සැ. යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා සවකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත •

**1982 අගෝස්තු 5 වන බ්‍රහස්පතින්ද**

**නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි.**

---

**குறிப்பு**

*அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு*

***1982 ஓகஸ்ட் 5, வியாழக்கிழமைக்குப் பிந்தாமற்***

***கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.***

---

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD,

**not later than**

**Thursday, 5th August 1982**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

B

9250 JAFFNA

**දයක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දයක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දයක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දයකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දයක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

**Subscriptions:** The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org